ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2023 ජුනි 28 වන බදාදා
3 කාණ්ඩය 30 කලාපය
මිල රු. 80 යි


විශේෂ අතිරේකයක්
**නොමිලේ**



ඩ්‍රයිවින් ලයිසන් ගන්න වැඩේ
ඔය කියන තරම් අමාරු නෑ

ධරණී වෙතින් නොමිලේ පිදෙන තිළිණයකි



**පසෙන් උපදින පාංශු උණ මාරාන්තිකයි**

**නූල ඉදිකට්ට අල්ලන්න නොදැන ඉඳපු දිලේෂා පිටරටටත් ඇඳුම් යවන ව්‍යවසායිකාවක් වූ හැටි**

**ඩෆ් හවුස් ළමාතැනිගේ මරණය අදටත් අබිරහසක් වුණේ කොහොමද?**

**ගණ දෙවි පිළිරූ කතා කරවන සාමිගේ කතන්දරේ**

ව්‍යවසායිකා
දිලේශා
මධුෂානි
ඡායාරූපය
මධුසංක සිරිවර්ධන




# ආචාර්ය සුලෝචනා සිගේරා

# තිත්ත ඇත්ත මතක් කරයි



"ගරු අගමැතිතුමනි මේ කතාවට ඔබතුමාගේ හිත රිදුනොත් මට සමාවෙන්න. හැබැයි අද අපි රටක් විදියට මුහුණ දීලා තියන අර්බුද, ගැටලු බොහොමයකට හේතුව වෙලා තියෙන්නේ ඔබතුමාගේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය අඩු නිසා කියලයි මට නම් හිතෙන්නේ."

රටක අගමැති කෙනෙක් තමන්ගේ ඉදිරිපිට තියාගෙන දෙස් විදෙස් ජනතාව රැස්වුණු මහා උත්සව සභාවක එහෙම කියන්න ගැහැනියකට කොච්චර හයියක් තියෙන්න ඕනද? මේක මුහුදු හතකින් එහා වුණු සිදුවීමක් එහෙම නෙවෙයි. පහුගිය 17 වැනිදා කොළඹ ශැන්ග්‍රිලා හෝටලයේ පැවැත්වුණු සම්මාන උළෙලකදී ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉදිරිපිට ඉඳගෙන මේ කතාව කිව්වේ අපේ රටේම කාන්තාවක්. ඇය තමයි ආචාර්ය සුලෝචනා සිගේරා.

ඇය මෙරට පළමුපෙළ ව්‍යාසමාජ ක්‍රියාකාරිනියක්, කාන්තා ව්‍යවසයිකාවන් බලගන්වන්නියක් වගේම ජාත්‍යන්තරය සමඟ අත්වැල් බැඳගත් ආයතනයක් වන 'Women in Management' හි නිර්මාතෘවරිය ද වෙනවා. එම ආයතනය IFC සහ Australian Aid සමඟ එක්ව සංවිධානය කළ 'Women Top 50 Professional and Career Awards 2023 සම්මාන උළෙල' අමතමින් තමයි ඇය මේ කතාව කිව්වේ. 'Women Top 50' ජාත්‍යන්තර සඟරාවේ 13 වැනි කලාපය එළිදැක්වීමට සමගාමීව මේ සම්මාන උළෙලේදී මාධ්‍ය, සිනමාව, ව්‍යාපාර, නීතිය ඇතුළු විවිධ අංශ නියෝජනය කරමින් එම ක්ෂේත්‍රවල සාර්ථකත්වයේ හිනිපෙත්තට ගිය දෙස් විදෙස් කාන්තාවන් 50 දෙනෙකුට සම්මාන පිරිනැමීම මෙහිදී සිදු කෙරුණා. ධරණී පුවත්පතේ ප්‍රධාන කර්තෘ සුරංගා සමරනායකටත්, 'Leadership in the field of Print Media' කියන බාණ්ඩය යටතේ සම්මානයක් හිමිවීම නිසා මේ අවස්ථාව අපිටත් විශේෂයි.

"මං මේ සම්මාන උළෙල පටන්ගත්තේ 2011 අවුරුද්දේ සම්මාන පහකින්. ඒත් මේ අවුරුද්ද වෙනකොට එය ජාත්‍යන්තර මට්ටමින් පවත්වන්න පුළුවන් වෙලා තියෙනවා. ඒ වගේමයි මේ සම්මාන උළෙල හරහා මට උවමනාවෙලා තිබුණා ක්ෂේත්‍රය මොකක් වුණත් ලංකාවේ ආර්ථිකයට දායකත්වය දෙන කාන්තාවෝ එකම තලයකට අරගන්න. ඒ අරමුණෙන් තමයි මේ වගේ සම්මාන උළෙලක් පටන්ගත්තේ."













"Leadership in Print Media"
සුරංගා සමරනායක
කර්තෘ - ධරණී



Leadership in Digital Media
රිශිනි වීරරත්න,
සමාජ මාධ්‍ය අංශ ප්‍රධානී,
විජය පුවත්පත් සමාගම



Media Personality of the Year (Sri Lanka)
Aljazeera කොළඹ වාර්තාකාරිනී
මිනෙල් ෆර්නැන්ඩු



Leadership in the field of International Media (United Kingdom)
Asian Standard and Asian Sunday news
ෆාතිමා පටෙල්






සම්මාන උළෙලින් පස්සේ ආචාර්ය සුලෝචනා අපේ කතාබහට මුලපිරුවේ එහෙම. අගමැතිතුමාගේ කණ හරහා මොළයට වදින්න කියපු කතාව ගැන අපි ආපහු පාරක් මතක් කළාම ඇය කිව්වේ මෙහෙම කතාවක්.

"මං කොතැනදිත් කෙළින් කතා කරන්න කැමතියි. ඇත්තටම මේ රටේ කාන්තාවො පුදුම දක්ෂයි. ඔවුන් නිර්මාණශීලීයි. තීරණ ගන්න හොඳ හැකියාවක් තියනවා. එහෙව් කාන්තාවන් පාර්ලිමේන්තුවේ අඩු නිසා නෙවෙයිද රටට මෙහෙම වෙලා තියෙන්නේ? අනිත් එක අපි කාන්තාවන් බලගැන්වීම ගැන ලොකුවට කතා කරන රටක්. ඇත්තටම කාන්තාවන් බලගන්වන්න ඕන වෙලා තියෙන්නේ ඇය දුර්වල නිසා නෙවෙයි. මේ රටේ පිරිමි ප්‍රමාණවත් තරම් බලගැන්විලා නැති නිසයි එහෙම අවශ්‍යතාවයක් මතුවෙලා තියෙන්නේ.

අවසාන වශයෙන් ඇය අද ඉන්න තැනත් එක්ක රටේ සමස්ත කාන්තා ප්‍රජාවටම වටිනා කියන පණිවිඩයක් දෙන්නත් අමතක කළේ නෑ.

"මං කියන්නේ මුලින් ඔබ ඔබව හොයාගන්න. ඒ හොයාගෙන, හොයාගත්ත ඔබට ආදරය කරන්න. හීන මවනවා වගේම ඒ හීන සැබෑ කරගන්නත් උත්සාහ කරන්න. අපි ගැහැනු එයාලා පිරිමි කියන අදහසින් අයින් වෙලා වැඩ කරන්න. එහෙම කළොත් අනිවාර්යයෙන්ම ඔබ කවුද කියලා ඔබටම තේරුම් යයි. ඒ වගේම ඔබේ වටිනාකම දවසක ඔබටම හිතාගන්න බැරිවෙයි."

■ රුවන් එස්.සෙනවිරත්න



**මහාචාර්ය ඉනෝකා කොරයා**
කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය



# පසෙන් උපදින පාංශු උණ මාරාන්තිකයි

මේ දිනවල ජලයෙන් සහ පස් මගින් හටගන්නා බැක්ටීරියාවක් නිසා මෙලියඩෝස් හෙවත් පාංශු උණ නමැති රෝගී තත්ත්වයක් පැතිර යන බව ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය පවසනවා. මෙම බැක්ටීරියාව පවතින වැසි සහිත කාලගුණය හේතුවෙන් හටගත් එකක් බවත්, පාදවල පවතින තුවාල සහ අපිරිසිදු ජලය භාවිතයෙන් ශරීරගත වන බවත් ඔවුන් පවසනවා. විශේෂයෙන්ම මෙම බැක්ටීරියාව ආසාදනය වෙන පුද්ගලයන් අසාධ්‍ය තත්ත්වයට පත්විය හැකි බවත් ඇතැමුන්ට මාරාන්තික තත්ත්වයක් ඇතිවිය හැකි බවටත් වෛද්‍යවරුන් මේ වනවිට අනතුරු අඟවා තිබෙනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ මහාචාර්ය ඉනෝකා කොරයා මහත්මිය 'පාංශු උණ' ගැන වැඩිදුරටත් පැහැදිලි කරමින් කිව්වේ මෙහෙම කතාවක්.

"මේ රෝගය පසෙනුයි, අපිරිසිදු ජලයෙනුයි ආසාදනය වෙන නිසා එදිනෙද වැඩ කරනකොට පසට, ජලයට වැඩිපුර නිරාවරණය වෙන අයට පහසුවෙන්ම වැළඳීමට ඉඩ තියෙනවා.

දැන් මෙහෙම කිව්වාම ගොඩක් අයට හිතෙන්න පුළුවන් මේක ගොවිතැන් කරන, හේන් කොටන උදවියට විතරක් සීමාවුණ රෝගයක් කියලා. ඇත්තමට ඒක වැරදියි. මොකද මේ වෙනකොට පාංශු උණට ප්‍රතිකාර ගන්න රෝගීන් අතරේ ගොවියෝ ඉන්නේ සීමිත පිරිසක් විතරයි. අනෙකුත් පිරිස අතරේ ගෘහිණියගේ ඉඳලා පාසල් දරුවාට යනකම්ම රෝගීන් ඉන්නවා."

මෙම රෝගය ආසාදනය වී දින දෙකේ සිට සති දෙකක් දක්වා කාලය තුළ රෝග ලක්ෂණ පෙන්නුම් කරන බවයි ඇය කියන්නේ.

"විශේෂයෙන්ම කියන්න ඕනේ පාංශු උණ රෝගියෙක් කිසිම වෙලාවක නිශ්චිත රෝග ලක්ෂණයක් පෙන්නුම් කරන්නෙ නැහැ. හැම රෝග ලක්ෂණයක්ම එක්කෙනෙකුගෙන් එක්කෙනෙකුට වෙනස්. ඒ නිසා රෝගීන්ව පරීක්ෂා කිරීමේදි සහ හඳුනාගැනීමේදි බොහෝවිට වෛද්‍යවරුන් පවා තරමක අපහසුතාවයකට පත්වෙනවා.

උදාහරණයක් විදියට මේ රෝගය වැළඳෙන සමහරක් පුද්ගලයන්ට මොළයේ, අක්මාවේ සහ පෙනහලුවල සැරව ගෙඩි ඇතිවෙන්න පුළුවන්. තවත් සමහරුන්ට පාදවල සහ සන්ධි ආශ්‍රිතව දරුණු ආසාධිත තත්ත්වයන් ඇතිවෙන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි යම්කිසි විදියකින් රෝගය වැඩි දවසක් ශරීරගත වෙලා තිබුණ පුද්ගලයෙකුට නම් මොළේ උණ සහ නිව්මෝනියා තත්ත්වයක් වුණත් ඇතිවෙන්න ඉඩකඩ තියෙනවා."

එමෙන්ම මෙම රෝගය ඕනෑම වයසක සිටින පුද්ගලයෙකුට වැළඳිය හැකි බවත්, මේ වනවිටත් මෙයට ප්‍රතිකාර ගන්නා පිරිස අතර අවුරුදු දෙකේ සිට අනූදෙක දක්වා පුද්ගලයින් සිටින බවත් ඇය පවසා සිටියා.

"විශේෂයෙන්ම සාමාන්‍ය පුද්ගලයන්ටත් වැඩිය නිදන්ගත රෝගවලට ප්‍රතිකාර ගන්න උදවිය මේකෙන් ආරක්ෂා වෙන්න කටයුතු කරන්න ඕනේ. මොකද පාංශු උණ කල්තියා අඳුනගත්තු සාමාන්‍ය පුද්ගලයෙකුට කෙටි කාලයක් ප්‍රතිකාර කරද්දි උණ තත්ත්වය අඩු වුණත් අර උදවියට ඒ විදියට සුවවෙන්න තියෙන ඉඩකඩ බොහොම අඩුයි.

උදාහරණයක් විදියට මේ වෙනකොට පාංශු උණට ප්‍රතිකාර ගන්න එන රෝගීන් අතරේ 70%ක්ම ඉන්නේ දියවැඩියා රෝගීන්. ඒ අතරේ අක්මා රෝගවලට, වකුගඩු රෝගවලට සහ තැලිසීමියාවට ප්‍රතිකාර ගන්න රෝගීනුත් සැලකිය යුතු පිරිසක් ඉන්නවා. අනික මත්ද්‍රව්‍ය සහ මත්පැන් පානය කරන පුද්ගලයන්ට මේ රෝගය ඉතාමත් දරුණු විදියට බලපාන්න පුළුවන්."

මේ වනවිට මෙරටින් වාර්තා වෙන පාංශු උණ රෝගීන්ගේ මරණ අනුපාතිකය 25%ක් දක්වා ඉහළ ගොස් ඇති බවකුත් ඇය පවසා සිටියා.



> **නිශ්චිත රෝග ලක්ෂණයක් පෙන්නුම් කරන්නෙ නැහැ. හැම රෝග ලක්ෂණයක්ම එක්කෙනෙකුගෙන් එක්කෙනෙකුට වෙනස්**

"මේ වෙද්දී අපේ රටේ මධ්‍යම කඳුකරයේ හැරුණම අනෙකුත් සියලුම පළාත්වල මෙම රෝගය ඉතාමත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් තියෙනවා. ඒ වගේම ගොඩක් උදවිය මේ රෝගයට ගොදුරු වෙලා ඉන්නෙත්, ගොදුරු වීමේ අවදානමක් තියෙන්නෙත් ඒ අයගේ නොසැලකිල්ල නිසා. මොකද වෛද්‍යවරුන් කොයිතරම් උපදෙස් දුන්නත් ගොඩක් උදවියට එළි පහලියට යනකොට පාවහන් පැළඳලා පුරුද්දක් නෑ. උණු කරලා නිවාගත්තු වතුර ටිකක් බීලා පුරුදු නැහැ. අනික මේ දවස්වල තියෙන මෝසම් කාළගුණයත් එක්ක නොයෙක් විදියේ වෛරස්, බැක්ටීරියා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙන්න පුළුවන්. නමුත් තම තමන්ගේ ආරක්ෂාව ගැන තම තමන් සැලකිලිමත් නම් මේ තත්ත්වය යම්තාක් දුරකට මගහැරවා ගන්න පුළුවන්කමක් තියෙනවා. ඒ වගේම නැවත වරක් කොවිඩ් වසංගතයත් එක්කම ඩෙංගු, ඉන්ෆ්ලුවෙන්සා සහ මී උණ වගේ වෛරස් ප්‍රභේදත් හිස ඔසවන්න පටන් අරගෙන. ඒ ඇරුණම මේ දවස්වල වෛරස් උණ රෝගියෙක් නැති ගෙදරක් හොයාගන්නත් නැතිතරම්. ඒ නිසා කිසියම් පුද්ගලයෙකුට දවස් දෙක තුනකට වැඩිය අඩු නොවෙන උණක් තියෙනවා නම් වහාම වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වෙන්න අවශ්‍යයි. ඒ වගේම රෝගී වෙන්න කලින් තමන් කටයුතු කළ ආකාරය, ආගිය තැන් ගැනත් වෛද්‍යවරයාට නොසඟවා කියන්න පුළුවන් නම් රෝග නිශ්චයේදී ඔවුන්ටත් එය පහසුවක් වේවි."

■ ලිහිණි මධුෂිකා

## මුදල් ඉතිරි කිරීම අපගේ මූල්‍ය යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අත්‍යවශ්‍ය පුරුද්දකි.

අපගේ ආදායමෙන් කොටසක් අනාගත අවශ්‍යතා, හදිසි අවස්ථා සහ දිගුකාලීන අරමුණු සඳහා වෙන් කිරීම වැදගත් වේ. ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කර ගැනීම අපගේ ජීවිතයට ප්‍රබල බලපෑමක් ඇති කළ හැකි අතර, ආරක්ෂාව පිළිබඳ හැඟීමක්, මනසේ සාමය සහ අපගේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීමේ හැකියාව ලබා දිය හැකිය. පුරුද්දක් ලෙස ඉතිරි කිරීම වැදගත් වන්නේ මන්දැයි සොයා බලමු.

වෛද්‍ය හදිසි අවස්ථා, රැකියා අහිමිවීම් හෝ අනපේක්ෂිත වියදම් වැනි අනපේක්ෂිත අවස්ථාවන් සඳහා ඉතිරි කිරීම ආරක්ෂිත දැලක් සපයයි. හදිසි අරමුදලක් ගොඩනගා ගැනීමෙන්, පුද්ගලයන්ගෙන් ණයට ගැනීම වැනි මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ නොදී අභියෝගවලට හොඳින් මුහුණ දිය හැකිය.

ඉතිරි කිරීම, නිවාස හිමිකම, උසස් අධ්‍යාපනය හෝ විශ්‍රාම ගැනීම වැනි දිගුකාලීන අපේක්ෂාවන් ඉටුකර ගැනීමට මග පාදයි. නිරන්තරයෙන් අරමුදල් වෙන් කිරීම මගින් පුද්ගලයන්ට තම සිහින සැබෑ කර ගැනීමට අවශ්‍ය සම්පත් රැස් කර ගත හැකිය.

ඉතිරි කිරීම මගින් පුද්ගලයන්ට පැමිණිය හැකි අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට හැකියාව ලැබේ. එය නව ව්‍යාපාර කරගෙන යාමට, ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ ආයෝජනය කිරීමට නිදහස ලබා දෙයි. ඉතිරිකිරීම් මගින් තීරණ ගැනීමේදී වැඩි නම්‍යශීලී බවක් ඇති කිරීමට, ණය මත යැපීම අඩු කිරීමට සහ ස්වාධීන තේරීම් සක්‍රිය කිරීමට ඉඩ සලසයි.

ඉතිරි කිරීම ණය චක්‍රය බිඳ දැමීමට සහ මූල්‍ය ස්වාධීනත්වය වර්ධනය කිරීමට දායක වේ. එමෙන්ම අධික ලෙස ණය ගැනීම් සහ පුද්ගලයන්ට ඉහළ පොලී ගෙවීම් වළක්වා ගත හැකි අතර ශක්තිමත් මූල්‍ය පදනමක් ස්ථාපිත කිරීමටද එය උපකාරී වේ.


අප ජීවත් වන්නේ ආර්ථික වශයෙන් අභියෝගාත්මක මෙන්ම නිරන්තරයෙන් වෙනස් වන පරිසරයකය. එබැවින් අපගේ අනාගතය වඩා සුරක්ෂිත ලෙස සැලසුම් කිරීමට අවධානය යොමු කිරීම රටක පුරවැසියන් ලෙස අප සැමගේ වගකීමක් වේ. මේ සඳහා අපි මූල්‍යමය වශයෙන් සුරක්ෂිත වීමට මුදල් ඉතිරි කර ධනය රැස් කිරීමට පුරුදු විය යුතු වේ. එවිට අනාගතයේදී සිදුවන අභියෝග ජයගෙන අපගේ සැන්දෑ සමය කිසිවකුට කරදරයක නොමැතිව සතුටින් ගත කිරීමට හැකිවනු ඇත.

අපි වයසට යනවිට ඉපැයීමට තිබෙන හැකියාව අවම බැවින් ඉතිරි කිරීම සඳහා තරුණ කාලයේ සිටම යොමු වීම වඩා වැදගත්වේ. අනාගතය සඳහා ඉතිරි කිරීම පිළිබඳ ධනාත්මක ආකල්ප අප තුළ ඇති කර ඉතිරි කිරීමට සහ ආයෝජනය කිරීමට පුරුදු වීම තුළින් කෙටි කාලීනව සහ දිගු කාලීනව පුද්ගලයන්ට මෙන්ම රටේ ආර්ථිකයටද සැලකිය යුතු දායකත්වයක් ලබා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ සමාජ සහ වෙළෙඳපොළ සම්බන්ධ සමීක්ෂණ සඳහා පුරෝගාමී ආයතනය වන Survey Research Lanka (SRL) ආයතනය, රක්ෂණ ක්ෂේත්‍රය තුළ දැවැන්තයෙක් ලෙස සැලකෙන Union Assurance සමාගම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ඉතුරුම් පිළිබඳව මෑතකදී සිදු කරන ලද අධ්‍යනයකදී පෙන්නුම් කරනුයේ ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණවත් ලෙස ඉතිරි කිරීම් සඳහා යොමු නොවන බවය.

යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි
ඔබේ දිවියට අපේ සවිය.

මෙම සමීක්ෂණයට අනුව අනාගතය සඳහා ඉතිරි කිරීම පිළිබඳව ධනාත්මක ආකල්ප ඔවුන් තුළ තිබුණත් 70% ක් පමණ විශ්‍රාම ඉතුරුම් අතිශයින්ම වැදගත් බව විශ්වාස කරන අතර 26% ක් එය සාමාන්‍යයෙන් වැදගත් බව පෙන්නුම් කර තිබේ. අනාගතය සඳහා ඉතිරි කිරීම වැදගත් බව ප්‍රකාශ කළ 70% න් ප්‍රමාණවත් ලෙස ඉතිරි කරනුයේ 27% ක ප්‍රමාණයක් වන අතර 21% ක් කිසිසේත් ඉතිරි නොකරන බවද අනාවරණය වී ඇත. කෙසේ වෙතත් මෙම අධ්‍යනයේදී පුරුෂයන්ට වඩා කාන්තාවන් ඉතිරි කිරීම අගය කරන බවද හෙළිවී ඇත.





එමෙන්ම ශ්‍රී ලාංකිකයන්ගෙන් වැඩි පිරිසක් තම ආදායමෙන් ඉතිරි කිරීම සඳහා යොදවනුයේ 1% ත් 5%ත් අතර ප්‍රමාණයක් බව මෙම සමීක්ෂණයේදී පෙන්නුම් කර ඇත. පුද්ගලයකුගේ දළ වැටුපෙන් 10% - 15%ක ප්‍රමාණයක් ඉතිරි කළ යුතු බව මූල්‍ය සැලසුම්කරුවන්ගේ සාමාන්‍ය මතය වුවත් මෙම සමීක්ෂණයට යොමු වුවන්ගෙන් 37%ක්ම ප්‍රකාශ කර තිබෙන්නේ තම ආදායමෙන් 1%ත් 5%ත් අතර ප්‍රමාණයක් ඉතිරි කරන බවය. මීට අමතරව 19%ක් තම මාසික ආදායමෙන් 6% 10% දක්වා ප්‍රමාණයක් ඉතිරි කරන බවද ප්‍රකාශ කර තිබේ.

මේ අනුව රටේ ජනගහනයෙන් 1/4 ආසන්න ප්‍රමාණයක් අනාගත ඉතුරුම් සඳහා යොමු නොවන බව වාර්තා වී ඇත. මෙම කණ්ඩායම අනාගතයේදී අනපේක්ෂිත අභියෝගවලට මුහුණ දෙන අතර ඒවා ජය ගැනීමට ඔවුනට කිසිදු මූල්‍ය ආරක්ෂණ ජාලයක්ද නොමැත.


අද බොහෝ දෙනෙක් විශ්‍රාම යන තෙක්ම තම සැන්දෑ සමය පිළිබඳව අවධානය යොමු නොකරයි. අපි වයසට යනවිට ඉපැයීමට තිබෙන හැකියාව අවම වන බැවින් විශ්‍රාම දිවිය හොඳින් සැලසුම් කිරීමට අවශ්‍ය විකල්ප ක්‍රම පිළිබඳව කල්තියා සොයාබලා වඩා ඉහළ ප්‍රතිලාභ ලබා දෙන ජීවිත රක්ෂණ විශ්‍රාම ගිණුමක ආයෝජනය කිරීමට යොමුවීම වැදගත් වේ.

මෙම අධ්‍යනය සඳහා ප්‍රතිචාර දැක්වූ අයගෙන් 48% ක් පමණ අනාගතය සඳහා ඉතිරි කිරීම් සැලසුම් කර තිබෙන බව පැවසූ නමුත් අඩකටත් වඩා ඒ සඳහා යොමුවී නොමැති බව හෙළි වී තිබේ. කොවිඩ් වසංගත තත්ත්වය තුළ රට තුළ ඇතිවූ ආර්ථික කඩා වැටීම නිසා පසුගිය වසරවල බොහෝ දෙනකුට ඉතුරුම් සහ ආයෝජන කෙරෙහි යොමුවීමට ද නොහැකි වී ඇත.




අනාගතය සඳහා ඉතිරි කිරීමේ ප්‍රභවයක් ලෙස ජීවිත රක්ෂණ සමාගම් වල විශ්වාසය පිළිබඳව ද මෙහිදී සමීක්ෂණයට ලක්කර තිබෙන අතර 13% ක් එම සමාගම් පිළිබඳව ඉතා ඉහළ විශ්වාසයක් පවතින බව පෙන්නුම් කර තිබේ. එමෙන්ම 41%ක ප්‍රමාණයක් පවසා තිබෙන්නේ තරමක් ඉහළ විශ්වාසයක් පවතින බවය. අනාගතය වෙනුවෙන් ජීවිත රක්ෂණවල ආයෝජනය කිරීම වඩාත් සුදුසු ආයෝජන විකල්පයක් බැවින් ජීවිත රක්ෂණ සමාගම්වලට එම රක්ෂණයක පවතින වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීම කෙරෙහි සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකළ යුතු වේ.

පවුලේ අනාගතය සැලසුම් කිරීම පිළිබඳව කාන්තාවන්ට ද විශේෂ වගකීමක් තිබෙන බැවින් කාන්තාව ආර්ථික වශයෙන් බල ගැන්වීම වඩා වැදගත් වේ. අද කාන්තාවන්ට ආදායම් ඉපැයීමට රැකියා අවස්ථා බොහොමයක් පවතින බැවින් තමන්ගේ හැකියාවන් සහ කුසලතා උපයෝගී කර අදායම් ඉපැයීමට යොමු වීම වඩා යෝග්‍ය වේ.




එවිට පවුලේ ආර්ථිකය ශක්තිමත් වන අතර අනාගතය සඳහා ඉතුරුම් කිරීමට ද හැකියාවක් ලැබෙනු ඇත. මෙම සමීක්ෂණයේ පෙන්නුම් කර තිබෙන පරිදි කාන්තාවන් ඉතුරු කිරීම සඳහා වැඩි කැමැත්තක් දක්වන නිසා තම නිවසේ වැඩ කටයුතු කරන ගමන් ස්වයං රැකියාවල සහ සෘජු විකුණුම් වැනි (DIRECT SELLING) ක්ෂේත්‍ර වල නියැළීමෙන් වැඩි ආදායමක් ලබා ගත හැකි වේ. එවිට තමන්ගේ නිවසේ කටයුතු මෙන්ම සැන්දෑ සමය ද කිසිවකුටත් කරදයක් නොමැතිව පහසුවෙන් කළමනාකරණය කිරීමට හැකිවනු ඇත.

විශ්‍රාම ගැනීම අපි සිතීමට හෝ තේරුම් ගැනීමට වඩා ඉක්මනින් පැමිණිය හැකි බැවින් ඒ සඳහා කලින්ම සැලසුම් කිරීම වැදගත් වේ. සුරක්ෂිත විශ්‍රාම සැලැස්මක් යනු විශ්‍රාම අවධියට පිවිසීමට පෙර, ඔබ රැකියාවේ යෙදී සිටින විටම ඒ සඳහා ආයෝජනය කිරීමයි.

ඔබගේ විශ්‍රාම යාම වඩාත් සාර්ථක ලෙස සැලසුම් කළ විට විශ්‍රාම සමයේදී සංචාරය කිරීම සහ විනෝදාංශවල යෙදීම වැනි ජීවිතයට වටිනාකමක් එක් කරමින් මානසික සුවයෙන් යුතුව ගත කිරීමට හැකි වේ.

# මේ ඔබේ ජීවිතයේ මීළඟ පියවර ගැන සිතන්නට කාලයයි



ඔබ සොයන්නේ ඉහළ ආදායමක් උපයන අතරම ඔබේ ජීවිතය සැබවින්ම වෙනස් කළ හැකි වෘත්තියක්ද? එසේ නම් මෙන්න ඔබට ස්වර්ණමය අවස්ථාවක්!

ඔබ දක්ෂ හා උද්‍යෝගීමත් කාන්තාවක් නම්, රක්ෂණ උපදේශිකාවක ලෙස යූනියන් ඇෂුවරන්ස් සමාගම හා එක්වන්නට ඔබටත් දැන් අවස්ථාව උදා වී ඇත.

- ඉහළ ආදායමක් ඉපයීමේ වරම්
- ඔබට ගැලපෙන නම්‍යශීලී රාජකාරිමය පරිසරයක්
- විදේශ සංචාර සහ ජාත්‍යන්තර ඉසව්වලට සහභාගී වීමේ වරම්
- පුහුණු සහ පෞද්ගලික සංවර්ධන වැඩසටහන්

**අද ම අප හා සම්බන්ධ වී දීප්තිමත් අනාගතයක් වෙත මුල් පියවර තබන්න**

1330 • 0112 990 990 | info@unionassurance.com

ඔස්සේ අප සමඟ රැඳෙන්න

unionassurance.com

යූනියන් ඇෂුවරන්ස්
ජෝන් කීල්ස් සමාගමකි

ඔබේ දිවියට අපේ සවිය.

යූනියන් ඇෂුවරන්ස් පී එල් සී (PQ 12) විසින් නිකුත් කරන ලදී. 6/2023

# රත්තරන් දුවේ



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

මේ කතාව දුවෙක් තමන්ගේ ගුරුතුමාට ලියපු ලිපියක් ගැන... කලුතර ප්‍රදේශයේ සුප්‍රසිද්ධ ටියුෂන් ගුරුවරයෙකුගේ අතට තමයි මේ ලිපිය ලැබිලා තිබුණේ. හැබැයි ඒ ලිපියේ ඇගේ ලිපිනයවත් දුරකතන අංකයවත් තිබුණේ නැහැ. එදා පංතියට දරුවන් පන්සියයකට වඩා සහභාගී වෙලා හිටියා. ඒ නිසා කවුද මේක දුන්නේ කියලා මතක් කරගන්න ක්‍රමයක් තිබුණෙත් නැහැ.

‘සර්, මං සර්ගේ පංතියට එන අන්තිම දවස අද. මං මේ ලියුම ලියන්නේ සර්ගේ එක විශේෂ ගුණයක් හින්දා. සර් හැමදාම බුදු ගුණ, බුදු බණ සිහිකරන ගුරුවරයෙක්. අනෙක සර් අපේ පංතියේ හැම දරුවෙකුටම එකවගේ ආදරෙයි. කලුතර මතුගම පැත්තේ මෙච්චර දරුවෝ ටිකක් සර් පිටිපස්සේ එන්නේ ඒ නිසා කියලයි මට හිතෙන්නේ. සර් අවුරුද්දකට වරක් අපිව අනුරාධපුරයට එක්කරගෙන යනවා. අපට සෙත් පතලා බෝධි පූජා පවත්වනවා. අම්මට තාත්තට ආදරය කරන්න කියලා බල කරනවා. මට මතකයි සර් දවසක් කිව්වා අම්මට වගේම තාත්තටත් ආදරේ කරන්න කියලා. අපි කවුරුවත් දැනගෙන හිටියේ නැහැ තාත්තට වඳින ගාථාවේ තේරුම. සර් එක දවසක් අපට ඒක කියලා දුන්නා.

**‘වුද්ධිකාරෝ ආලිංගිත්වා**
**චුම්බිත්වා පියපුත්තකං**
**රාජ මජ්ඣං සුපතිට්ඨං**
**පීතුපාදං නමාමහං’**

සර් අපට කියලා දුන්නා ‘වුද්ධිකාරෝ’ කියලා කියන්නේ ‘වෑද්ධිය’ නැත්නම් වර්ධනය කිරීම, ‘ආලිංගිත්වා’ කියන්නේ ‘බදා වැළඳගැනීම’, ‘චුම්බිත්වා’ කියන්නේ ‘සිපගැනීම’, ‘පිය පුත්තකං’ කියන්නේ ‘පිය පුත්‍රයාව’, ‘රාජ මජ්ඣං’ කියන්නේ ‘රජවරු මැද්දේ, ‘සුපතිට්ඨං’ කියන්නේ ‘පිහිටවීම’, ‘පීතුපාදං’ කියන්නේ ‘එහෙව් තාත්තාට වඳිමි’. ඉතින් සර් අපට කියලා දුන්නා මෙන්න මෙහෙම. පුතේ අම්මා ඔයාව බිහි කරාට පස්සේ අම්මා ඇඳේ සැතපිලා ඉන්නවා. දරුවව ඉස්සෙල්ලම ගෙනැත් දෙන්නේ වඩාගන්න තාත්තට. ඉස්සෙල්ලම දරුවව ඉඹින්නේ තාත්තා. බදාගන්නේ තාත්තා. උගන්වලා රජුන් මැද්දේ තියන්නේ තාත්තා. ඉතින් ඔය ඔක්කොම කරත් අම්මා වගේ තාත්තා ගැන කියැවෙන්නේ නැහැ.

**‘උඹෙ අම්මා කොතැන ගියේ**
**කිරි එරවා එන්න ගියේ**
**කිරි මුට්ටිය ගඟේ ගියේ**
**ගඟට උඩින් කොක්කු ගියේ’**

අම්මා දරුවා නළව නළව කවි කියනවා. ඒත් තාත්තා නිහඬයි. ඉතින් සර් ඇයි දන්නවද සර්ට මං ගොඩක්ම ආදරේ වුණු හේතුව? අපේ තාත්තා සර්, හරි අපූරු කෙනෙක්. තාත්තා හැමදාම අපි නිදාගන්න කලින් පිරිත් කියනවා. පිරිත ඉවරවෙලා අපි හැමෝගෙම ඔලුවේ පිරිත් පැන් තවරනවා. ඊටපස්සෙයි අපි නිදාගන්නේ. කිසිදාක මගේ තාත්තා කිසිම මත්වෙන දෙයක් පාවිච්චි කරලා නැහැ. මං දන්න දවසේ ඉඳලා අපි නිදාගත්තේ තාත්තා හිසේ තවරපු පිරිත් පැන් එක්කලා.



> **මට තාත්තගෙ පිරිත් නාදය කන්වල රැව් දෙනවා. තාත්තා රවට්ටපු මට බැහැ අද රෑට ඒ පිරිත් පැන් හිසේ ගාගන්න. මට ආයේ පංති එන්නත් බැහැ. මං ගෙදරින් යන්නෙ ජීවිතෙන් පැරදිලා සර්**

## සර් මේ ලිපිය කියවනකොට මම ගෙදරින් ගිහිල්ලා තියේවි

ඔහොම ඉන්නකොට තමයි මං සර්ගේ පංතියට එන්න පටන්ගත්තේ. මතුගම හැමෝම කිව්වා නිසංක සර්ගේ පංතිය තමයි හොඳම පංතිය කියලා. ඔහොම පංති යන එනකොට මට පිරිමි ළමයෙක් මුණගැහුනා, වෙන පංතියක විද්‍යා විෂයයන් කරන. එයා හරිම අහිංසකයි. ප්‍රියමනාපයි. අපි දෙන්නා සමහරදාට රෑ එළිවෙනකන් ටෙලිෆෝන් එකෙන් කතාව. එයා කිව්වා එයා හරිම දුප්පත්, එයාට කවුරුවත් ආදරේ නැහැ කියලා. ආදරය විතරයි ඕන කියලා කිව්වා. ඉතින් සර් මං ඒ ඔක්කොම විශ්වාස කරා.

පිරිත් කියන තාත්තත් අපිව සරසවිය දිහාට තල්ලු කරන සර්ත් මට දෙවැනි වෙලා එයා මගේ පළවැනියා වුණා. දවසක් එයා කිව්වා මගේ ළඟට ඇවිත් එයාගේ ජීවිත කතාව කියන්න ඕන කියලා. ඉතින් සර් එක පංති තිබ්බ දවසක එයා කිව්වා එයාගේ යාළුවෙක්ගේ ගෙදරට යං ඒ කතාව කියන්න කියලා. මං විශ්වාස කළා. මාව බස් එකෙන් බස්සගෙන එයා යාළුවෙක්ගේ සයිකල් එකක් පැදගෙන ආවා. ඒකේ මාව දාගෙන අර යාළුවගේ ගෙදරට ගියා. ඒත් ගෙදර අය පේන්න හිටියේ නෑ. මං ඒත් ඇහුවා කෝ ගෙදර අය කියලා. ඒගොල්ලෝ අපට උයනවා කිව්වා. පස්සේ තමයි තේරුණේ ඒක ගෙස්ට් හවුස් එකක් කියලා. අනේ සර් උදේ හවා පිරිත් අහපු මාව, කැම්පස් යන්න හීන මවපු මාව ඒ මූසලයා විනාශ කළා.

මට කළ අපරාධයට මං බැන්නා. අඩුතරමින් එයාගේ නියම නමවත් ලිපිනයක්වත් මං දන්නේ නැහැ. මට බබෙක් ලැබෙයිද? මං දන්නෙ නැහැ සර්. මං මේ ලිපිය සර්ට දුන්න ගමන් ගෙදරින් යනවා කුරුණෑගල අපේ නෑදෑ ගෙදරකට. මට ඒ මූසලයව දකින්න ඕන නැහැ. මට තාත්තගෙ පිරිත් නාදය කන්වල රැව් දෙනවා. තාත්තා රවට්ටපු මට බැහැ අද රෑට ඒ පිරිත් පැන් හිසේ ගාගන්න. මට ආයේ පංති එන්නත් බැහැ. මං ගෙදරින් යන්නෙ ජීවිතෙන් පැරදිලා සර්. තාත්තාට අම්මට මට මේක කියන්න බැහැ. ඒත් මං සර්ට කියලා යනවා. මට සර් ආයේ කවදාවත් මුණගැහෙන්නේ නැතිවෙයි. මගේ කතාව සර් පංතියේ දූලට කියන්න. සර්ට ජයම වේවා.’

ගුරුතුමාට කිරීමට දෙයක් නැත. ඇය සියල්ල අතහැර ගොස්ය. ප්‍රේමය, දයාව තිබූ ගෙදර අතහැර ඇය පුංචි සල්ලාලයෙකුගේ ගොදුරක් වී ඇත.

“ඔහුවත් ඇයවත් මේ ලිපිය කියවන්නේ නැති බව මං දන්නවා. මං මේ සියල්ල අත්තනායක සර්ට ලියලා එව්වේ ‘රත්තරන් දුවේ’ හරහා මේ කතාව රටට කියන්න. මේ ලිපි පෙළට තාත්තලා අම්මලා ආදරය කරනවා. ඒ අය මේ ගැන දුවලට කියාවි.” නිසංක සර් එහෙම තමයි මට කිව්වේ.

ඉතින් දුවේ මේක, මේ වර්ගයේ සිදුවීම් කෝටියකින් එකක් විතරයි. ජීවිතය දිනපු දූලා ගැන හැමදාම කිව්ව මම මතුගම නිසංක පොන්නම්පෙරුම ගුරුතුමා එව්ව ලිපිය දැකලා කම්පා වුණා. ඒ දුව මගේ දුව නොවුණත් ඒ අපේ දුවක්. මේ ලිපියටත් දූලා වනසන්න කැස කවන පිරිසට කේන්ති යයි. ඒත් මං හිටගන්නේ දුවෙක්, මිනිබිරියක් ඉන්න තාත්තෙක්, සීයෙක් විදියටයි. අඩු වයසින් හෝ විවාහයට පෙර පිරිමියෙකු සමඟ යහන්ගතවීම, සමහරු කියනවා තරම් හැම දුවෙකුටම සාමාන්‍ය දෙයක් නෙවෙයි. අකමැත්තෙන් එහෙම දෙයක් සිද්ධ වුණොත් ඒක කොහොමත් ප්‍රශ්නයක්. සමහර දරුවො නොතේරුම්කමට කැමැත්තෙන් එහෙම තැනකට වැටුනත් ඒක ඔවුන්ගේ පුංචි වයසට මානසික පීඩා ගෙනදෙන කාරණාවක් වෙන්න පුළුවන්. ඉතින් සරසවි සිහිනයත් ජීවිතයත් බිඳගත් මේ දුව අද කොහෙද කියන්න අපි කවුරුත් දන්නේ නෑ. ලිපිය හා විස්තරය මට එව්ව නිසංක ගුරුතුමාටත් මේක කියවන ‘ධරණී’ සහෘදයන්ටත් මේක දුක්බර කතාවක් වෙයි.

මේ කතාවෙන් දුවලා ඉගෙනගන්න ඕන පාඩම මොකක්ද කියලා මම අමුතුවෙන් තේරුම් කරන්න යන්නෙ නැහැ. මොකද ‘ධරණී’ පාඨකයින් ඒ සහකම්පනය තිබෙන පිරිසක් බව මම විශ්වාස කරන නිසා.

අත්තනායක එම්. හේරත්

දැන්වීමකි

# කාන්තා ශක්තියට අගයක් ලබාදීමට නිරන්තරව කැපවුණු යූනියන් ඇෂුවරන්ස් සමාගම

**ශ්‍රී ලාංකීය ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂී නාමයක් සනිටුහන් කර ඇති යූනියන් ඇෂුවරන්ස් සමාගම, කාන්තාවගේ ශක්තිය මැනවින් හඳුනා ගනිමින් ඔවුන් වෙත ගෞරවණීය සේවාවක නිරතවීමේ පරිසරය නිර්මාණය කර ඇති සමාගමකි. මේ හේතුව නිසාම අද වන විට රක්ෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂී ජයග්‍රාහිකාවන් රැසක් නිර්මාණය කිරීමට මෙම සමාගම සමත්ව ඇත. එවන් වූ දිරිය කතුන් අතරින් අද අප හමුවන්නේ හලාවත යූනියන් ඇෂුවරන්ස් ශාඛාවේ ජ්‍යෙෂ්ඨ පුද්ගලික මූල්‍ය කළමනාකාර නිලූකා දමයන්ති සුදුසිංහ ය.**

**ඔබ රක්ෂණ වෘත්තීයට යොමුවන්නේ කෙසේද?**

2004 වසරේ මම යූනියන් ඇෂුවරන්ස් ආයතනයත් එක්ක සම්බන්ධ වෙන්නෙ හලාවත ශාඛාවේ සංවර්ධන නිලධාරී අශෝකා වර්ණසූරිය මහත්මියගේ ආරාධනයෙන්. රක්ෂණ වෘත්තීයට සම්බන්ධ ඒ වෙනකොටත් කිසිම සෘණාත්මක අදහසක් මට තිබුණේ නැහැ. නමුත් මෙහි වටිනාකම අවබෝධ වුණේ යූනියන් ඇෂුවරන්ස් සමාගම සමග සම්බන්ධ වීමෙන් අනතුරුවයි. අද වෙනකොට මම වසර 19ක කාලයක් යූනියන් ඇෂුවරන්ස් ආයතනයේ සේවය කරනවා.

**රක්ෂණය සම්බන්ධයෙන් ඔබේ අදහස වෙනස්වෙන්නේ කොහොමද?**

මම යූනියන් ඇෂුවරන්ස් සමාගම සමග සම්බන්ධ වීමට පෙර මට රක්ෂණය සම්බන්ධයෙන් එතරම් උනන්දුවක් තිබුණේ නැහැ. නැහැ.

නමුත් යූනියන් ඇෂුවරන්ස් සමාගම සමග එක්වීමත් එක්ක, මට මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලැබුණු දැනුමත් එක්ක මට රක්ෂණ වෘත්තීය සම්බන්ධයෙන් විශාල උනන්දුවක් ඇතිවුණා. බොහෝ දෙනෙක් රක්ෂණයකට යොමුවෙන්නෙ ජීවිත අවදානම තිබෙන නිසා වුණත්, මම දකින විදියට රක්ෂණයක් කියන්නේ ඊට එහා ගිය පුළුල් අර්ථයක් තියෙන දෙයක්. මේක ඇත්තටම ආයෝජන කාර්යයක් විදිහට දකින්නයි මම කැමති. ආයෝජනය කියන්නේ ලාභය අරමුණු කර ගනිමින් සිදුකරන කාර්යයක්. රක්ෂණ කාර්යයකදී අපට ඒ ලාභය කීහිප ආකාරයකින් ලැබෙනවා. ඒ නිසා රක්ෂණය සම්බන්ධයෙන් අප සාම්ප්‍රදායික ආකාරයෙන් දකින ආකාරයට වඩා වෙනත් කියවීමක් තමයි අද වෙනකොට සමාජයේ තියෙන්නෙ.

**කාන්තාවක් විදිහට ඔබ අත්විඳි වෘත්තීය අභියෝග ගැන කතාකළොත්?**

කාන්තාවක් විදිහට වෘත්තීය කාර්යයන් කිරීමේදී ආයතනයෙන් මට ලැබුණු පුහුණුව වගේම මගපෙන්වීම, කණ්ඩායමේ සහයෝගය මට විශාල ශක්තියක් වුණා. ඒ වගේම කැපවීම, සැලසුම් සහගතවීම වගේම සෑම කාර්යයක්ම නියමිත කාලයට පෙර අවසන් කිරීම තුළින් මට සාර්ථක ආකාරයෙන් අභියෝග ජයගැනීමට වගේම සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීමටත් හේතුවුණා.

**රක්ෂණ වෘත්තීයට යොමුවීම සම්බන්ධයෙන් අද ඔබේ අදහස මොකක්ද?**

මම මගේ ජීවිතේ විවාහය ඇතුළුව සියලුම කාර්යයන් කරගත්තේ රක්ෂණ වෘත්තිය නිසයි. අද වෙනකොට දෙමහල් නිවසක වගේම වාහනයක හිමිකාරිණියක් වීමේ අවස්ථාවත් මට හිමිවෙලා තිබෙනවා. ඒ වගේම මේ වෘත්තීයෙන් ලැබෙන නිදහස නිසා මට මගේ වෘත්තීය ජීවිතය වගේම පෞද්ගලික ජීවිතයත් සාර්ථක ආකාරයෙන් සැලසුම් කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වගේම සීමාවකින් තොරව ඉපැයීමේ අවස්ථාව තිබීම තුළින් මගේ ඉලක්ක වලට ඉතා වේගයෙන් ගමන් කිරීමේ හැකියාව මට තිබෙනවා. මේ නිසාම අද වෙනකොට මට ඉහළ මාසික ආදායමක් ලබාගැනීමේ අවස්ථාවත් හිමි වී තිබෙනවා. ඒ වගේම මට බිරිඳක්, මවක් වගේම වගකිවයුතු කාන්තාවක් විදිහට මගෙන් විය යුතු යුතුකම් සාර්ථකව ඉටු කිරීමටත් මේ වෘත්තීය නිසා හැකියාව ලැබිල තිබෙනවා.

**ඔබේ සාර්ථකත්වයට යූනියන් ඇෂුවරන්ස් සමාගමෙන් ලැබුණේ මොනවගේ සහයෝගයක් ද?**

අපේ හැකියාවන් මැනවින් හඳුනාගෙන, අපේ ඉලක්කවෙත අපව මෙහෙයවීමේ හැකියාව යූනියන් ඇෂුවරන්ස් සමාගමේ කාර්යමණ්ඩලට තිබෙනවා. එතනදී අපිට ලබාදෙන සාර්ථක පුහුණුව අපිට වෘත්තීය කාර්යයන් වගේම පෞද්ගලික ජීවිතය පවා සාර්ථක කර ගැනීමට හේතුවෙලා තිබෙනවා. විශේෂයෙන් අපේ ගනුදෙනුකරුවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීම, ඔවුන්ට ඒ සඳහා සාර්ථක සැලසුම් ඉදිරිපත් කිරීම වගේම කළමනාකරණය සම්බන්ධයෙන් පරිපූර්ණ දැනුමක් ලබාදීම තුළින් අපට සාර්ථක සේවාවක නිරවීමේ හැකියාව ලබා දී තිබෙනවා. ඒ වගේම ආයතනයක් විදිහට අපගේ හැකියාවන් සහ දක්ෂතාවයන් නිරන්තරව ඇගයීම වගේම ඒ සම්බන්ධයෙන් ප්‍රචාරණයන් පවා සිදුකිරීම අපේ වෘත්තීය කාර්යන් සාර්ථක ආකාරයෙන් කිරීමටත් අපට අගයක් එක්කරදීමටත් සමත්වෙලා තිබෙනවා.

**ලැබූ ජයග්‍රහණ සම්බන්ධයෙන් කතාකළොත්?**

යූනියන් ඇෂුවරන්ස් ආයතනය තුළ මම පූර්ණ රන් පදක්කම් (ෆුල් ගෝල්) 8ක් සහ හාෆ් ගෝල් 4ක් දිනා ගැනීමට හැකිවෙලා තියෙනවා. මීට අමතරව 2020, 2021 සහ 2022 වසර වලදී අඛණ්ඩව MDRT සම්මානය දිනාගන්නවා. ඒ වගේම IQA සහ IAP සම්මාන නොකඩවා වසර 8ක් හිමිකරගෙන තිබෙනවා. මේ ජයග්‍රහණවලට අමතරව මේ වෘත්තීය නිසා රටවල් හතරක සංචාරය කිරීමේ අවස්ථාවත් හිමිකරගෙන තිබෙනවා.

**කාන්තාවන් විදිහට ගෙදරදොර වැඩ කටයුතුත් එකක් වෘත්තීය කාර්යයන් කරගන්නේ කොහොමද?**

කාන්තාවකට ගෙදරදොර වැඩ කටයුතුත් එකක් වෘත්තීයක් කරගෙන යනවා නම් ඒකට සුදුසුම වෘත්තීය තමයි රක්ෂණ වෘත්තීය.

එතනදී කාලය කළමනාකරණය වගේම මැනවින් සැලසුම් සහගත වීම වැදගත් වෙනවා. කාන්තාවක් විදිහට අපි දරුවන්ගේ කාර්යයන් වලටත් අවධානය යොමුකළ යුතුයි. මේ නිසාම වෘත්තිය කාර්යයන් උදේ 8 සිට සවස 4 දක්වා කාලය තුළ අවසන් කිරීමට සැලසුම සකසා ගන්නවා. ඒ වගේම දිනපතා කාර්යාලයට යාමේ අවශ්‍ය නොවීම වගේම නිදහස් වෙලාවට වැඩ කටයුතු කිරීමේ අවස්ථාව තිබීම නිසා සාර්ථකව වෘත්තිය කාර්යයන් කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ වගේම යූනියන් ඇෂුවරන්ස් සමාගම තුළ වෘත්තීය වශයෙන් ඉදිරියට යාමට තිබෙන පසුබිම කාන්තාවන් විදිහට අපේ ශක්තියට නව අගයක් ලබා දෙනවා. මේ නිසා මම සියළුම කාන්තාවන්ට මේ මොහොතේ ආරාධනා කරනවා යූනියන් ඇෂුවරන්ස් සමඟ අත්වැල් බැදගන්න කියල.

**රක්ෂණ වෘත්තීය සමග සම්බන්ධවී ජීවිතය ජයගැනීමට කැමති කාන්තාවන්ට ඔබට දීමට ඇති උපදේශය කුමක්ද?**

ඔබ රක්ෂණ වෘත්තීයට යොමුවෙනවා නම් ඒකට සුදුසුම තැන තමයි යූනියන් ඇෂුවරන්ස් සමාගම. කාන්තාවක් විදිහට ඔබට අවශ්‍ය මගපෙන්වීම නිවැරදිව මේ ස්ථානයෙන් ලබා දෙනවා වගේම ඔබට වෘත්තිකයෙක් විදිහට සංවර්ධනය කිරීමත් සිදුකරනවා. ඒ වගේම ඔබට ඔබගේ ජීවිතයේ සියලුම ඉලක්ක ජයග්‍රහණය කිරීමට අවශ්‍ය සහාය වගේම පසුබිමත් මේ වෘත්තිය තුළින් නිර්මාණය කර ගැනීමේ හැකියාව තිබෙනවා. විශේෂයෙන් වෘත්තීය තුළ ඔබ කළයුතු සහ නොකළයුතු දේවල් සම්බන්ධයෙන් ඔබේ අවබෝධය වැදගත් වෙනවා. ඔබගේ සාර්ථකත්වය පවතින්නේ ඔබේ හැසිරීම මතයි. මේ නිසා වෘත්තීය ගරුත්වය සහ ආයතන ගරුත්වය ආරක්ෂා කරගනිමින් කටයුතු කිරීමෙන් ඔබට සාර්ථක වෘත්තීය ගමනක නිරතවීමේ හැකියාව තිබෙනවා.

**මේ ගමනට සහයෝගය දුන් අය සිහිපත් කළොත්?**

මගේ දක්ෂතා හඳුනාගෙන මට මේ වෘත්තීය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදුන්නේ හලාවත ශාඛාවේ සංවර්ධන නිලධාරී අශෝකා වර්ණසූරිය මහත්මියයි. ඇය මේ මොහොතේ ආදරයෙන් සිහිපත් කරනවා. මීට අමතරව මාව නිරන්තරව අගයමින්, මගේ වෘත්තීය ගමනේ දුර්වලතා හඳුනාගෙන නිවැරදිව ගමන් කිරීමට උපදෙස් සහ මගපෙන්වීම ලබාදුන්නේ එවකට හලාවත ශාඛා කළමනාකරව සිටි මංජුල අතපත්තු මහතා. ඒ වගේම මගේ හලාවත යූනියන් ඇෂුවරන්ස් ශාඛාවේ සියලුම සහෝදර සහෝදරියන් ඇතුළු කාර්යමණ්ඩලයේ සහයෝගයත් ගෞරවයෙන් සිහිපත් කරනවා.

**වෘත්තීය අනාගත බලාපොරොත්තු මොනවාද?**

අද වෙනකොට මම MDRT ජයග්‍රාහකයෙක් බවට පත්වෙලා තිබෙනවා. ඒ වගේම ඉදිරියේදී අන්තර්ජාතික TOT (Top Of Table) සම්මාන හිමිකරගෙන යූනියන් ඇෂුවරන්ස් ආයතනයට වගේම අපේ ශාඛාවලත්, ප්‍රදේශයටත් කීර්තියක් අත්කරදීම තමයි මීළඟ අරමුණ.



යූනියන් ඇෂුවරන්ස් - හලාවත ශාඛාව ජ්‍යෙෂ්ඨ පුද්ගලික මූල්‍ය කළමනාකාර නිලූකා දමයන්ති සුදුසිංහ

සටහන : පාලිත අබේලාල්



ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරී

# දහස් ගණනක් සෙනඟ අතරේ මහා තනියක් මට දැනේ



බයිබලේට අනුව දෙවියන් වහන්සේ මුලින්ම මැව්වේ ආදම්ව. හැබැයි තනිකම නිසා ඔහු ජීවත්වුණේ බොහොම දුකින්ලු. මනුස්සයෙක්ට තනියම ජීවත්වෙන්න අමාරු බව හිතූ දෙවියන්වහන්සේ පස්සේ ආදම්ව නින්දට යවලා ඔහුගේ ඉළඇටයකින් ස්ත්‍රියක් මැව්වා කියනවා. ජනප්‍රවාදයේ එන කතාවක් වුණාට මිනිස්සුන්ට තනියම ඉන්න බැරි බව දෙවියොත් දන්නවා කියන්න ඕක එක උදාහරණයක්.

මිනිහා කියන්නේ සමාජ සත්වයෙක්. ඒ නිසා මිනිහා කියන සතා ලෝකේ ඇතිවුණු දවසේ ඉඳලම ඒ අය ජීවත්වුණේ රංචු ගැහිලා. තැනින් තැනට ගියේ, දඩයම් කළේ කණ්ඩායම් විදියට. මොකද කණ්ඩායමක ශක්තිය වැඩියි. කණ්ඩායමක් විදියට එකතුවෙලා දැල ඔසවද්දි වටු කුරුල්ලෝ බේරුණු හැටිත් අසමගි වුණු තැන විනාශයට පත්වුණු හැටිත් බුදුහාමුදුරුවෝ සම්මෝදමාන ජාතකයෙන් පැහැදිලි කළා.

ඉස්සර අපේ ගම්වල මිනිස්සුන්ගේ සමගිය, එකමුතුව බොහොම ඉහළෙන් තිබුණා. සල්පිල්, නාට්‍ය සංදර්ශන, පන්සලේ වැඩවලින් ඒ අය නිතරම එකට එක්කාසු වුණා. ගමේ ගේක මළ ගෙයක් වුණාම ආටානාටිය කියවන්නෙත් එදා රෑට ගමම එකට එක්කාසු කරගන්න. මනෝවිද්‍යාත්මකව බැලුවහම ඔය කියන කාලේ මිනිස්සුන්ගේ චිත්තවේගීය බුද්ධිය වැඩියි. ඒ කියන්නේ අනිත් අයගේ හැඟීම් තේරුම්ගන්නයි ඒවා කළමනාකරණය කරන්නයි තියෙන හැකියාව. කාලයත් එක්ක මිනිස්සුන්ගේ අවශ්‍යතා සංකීර්ණ වුණා. ඒ අවශ්‍යතා වෙනුවෙන් මහන්සි වෙද්දී කාලය අඩුවුණා. ඒ නිසා දැන් උදවියට ඔය කියන චිත්තවේගීය බුද්ධිය අඩුයි. අනිත් එකා උන්නත් එකයි මළත් එකයි වගේ හැඟීමක් දැන් මිනිස්සුන්ට තියෙන්නේ. ඒ නිසාම දැන් බහුතරයක් මිනිස්සු තනිවෙලා. ඒක ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි. ඒ නිසා මනුස්සයෙක් වුණාහම ධනාත්මක පුද්ගල සම්බන්ධතා රැකගන්න ඕනේ ඇයි? ඒ කොහොමද කියලා අද ටිකක් කතා කරමු.

පුද්ගලයන් දෙන්නෙක් නැත්නම් කිහිපදෙනෙක් අන්‍යෝන්‍ය වශයෙන් ඇති කරගන්න සබඳතාවයට අපි කියන්නේ අන්තර් පුද්ගල සබඳතා කියලා. ජීවිතේ හැම අවස්ථාවකදීම අපිට මිනිස්සු ආශ්‍රය කරන්න වෙනවා. මනුස්සයෙක් වැඩෙද්දි ඔහුගේ සබඳතා ජාලය පුළුල් වෙනවා.

ඔය විදියට තවත් මිනිස් කණ්ඩායම් එක්ක සබඳතා පවත්වන එකෙන් ලැබෙන වාසි ගොඩයි. පළවැනි එක මානසික සුවය. ගුවන්යානා, නැව් අනතුරු නිසා දූපත්වල තනිවුණු මිනිස්සුන්ව හොයාගනිද්දි ඔවුන්ගේ මානසිකත්වය සෑහෙන දුරට පිරිහිලායි තියෙන්නේ. ඒකට ලොකුම හේතුව වෙනත් මිනිස්සු නැති එක. කොවිඩ් කාලෙදි මිනිස්සු එක තැන හිරවුණා. මිනිස් ආශ්‍රය නැති නිසා ඒ කාලෙදිත් ගොඩක් උදවිය මානසික ආතතියට පත්වුණා.

මනස ලෙඩ වෙන්න විතරක් නෙමෙයි ඇඟ ලෙඩ වෙන්නත් මිනිස් ආශ්‍රය නැතිකම හේතුවෙනවා. 2018 දී ඇමරිකානු පිළිකා සංගමය පරීක්ෂණයක් කළා. පිළිකා හැදුනු වැඩිහිටියන් ලක්ෂ පහක දත්ත අරගෙන ඒවා නිගමනයට ලක්කළා. අපේ රටවල වගේ නෙමේ ඇමරිකාවේ වැඩිහිටියෝ ජීවත්වෙන්නෙම තනියම. හුදකලාව එක්ක ඇතිවුණ මානසික පීඩනය පිළිකා හැදෙන්න සෘජුවම බලපාලා තියෙනවා කියලයි එතැනදි ඔප්පු වුණේ.

මම දන්න කථිකාචාර්යවරයෙක් ඉන්නවා. ඔහුට මිනිස්සු ආශ්‍රය කරන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. ඔහු දකින්නෙම අනිත් මිනිස්සුන්ගේ වැරදි. ඔය ගැටලු නිසාම පවුල අතඇරලා ඔහු තනියම ජීවත්වෙන්න පටන්ගත්තා. ඔහුට අඩුතරමේ යාළුවෙක්වත් නැහැ. කොවිඩ් කාලෙදි මිනිස්සු සෑහෙන තනි වුණානේ. හැබැයි ඒ කාලේ හැමෝම හැමෝටම උදව් කරගත්තා. ඒත් මේ පුද්ගලයාට කෑම ටිකක් ගන්නවත් එළියට යන්න උදව්වට කෙනෙක් හිටියේ නෑ. ඒ නිසා දවස් ගාණක්ම ඔහුට කන්න වෙලා තිබුණේ වත්තේ ගස්වල පොල්.

අනික ප්‍රශ්නයක් වුණාම ඒකට උදව්වක් ගන්න, දැනුම බෙදාහදාගන්න නැත්නම් කතා කර කර ඉන්න හරි මිනිස්සුන්ට මිනිස්සු ඕනේ. හැබැයි ප්‍රශ්නෙ තියෙන්නේ අර මුලදිත් කිව්වා වගේ සබඳතා නඩත්තුව අතින් අද ගොඩක් මිනිස්සු ෆේල්. දැන් පාරවල් ගානේ කොච්චර මිනිස්සු මරලා යනවද? කවුරුත් ඇහැක් ඇරලා බලනවද? හැබැයි වීඩියෝ කරන්න නම් ඕනතරම් අය ඉන්නවා. එතැන තියෙන්නෙම චිත්තවේගීය බුද්ධියක් නැතිකම.

කණ්ඩායම් හැඟීම, සබඳතා පවත්වාගැනීම, චිත්තවේගීය බුද්ධිය වර්ධනය කියන ඒවා පුංචි කාලෙදිම පුරුදු කරන්න ඕනේ දේවල්. හැබැයි දැන් ගොඩක් අම්මලා ළමයි හදන්නේ අලුත් තාලෙට. අනිත් ළමයි එක්ක තරඟ කරන්න විනා ඒ අයට සුහදව ආශ්‍රය කරන්න අම්මලා උගන්වන්නේ නැහැ. පොඩි කාලේ ඉඳලා දරුවන්ට කණ්ඩායම් විදියට වැඩ කරන්න දෙනවා නම් ඒ අයගේ ගැටලු විසඳීමේ, තීරණ ගැනීමේ කුසලතා පවා වර්ධනය වෙනවා.

අද සම්බන්ධතා දුරස් වෙන්න බලපාලා තියෙන තවත් හේතුවක් දුරකතනය. සමහර ගෙවල්වල දරුවෝ හුඹස් නයි වගේ. කාමරෙන් එළියට එන්නේ කන්න විතරයි. ඒ වගේම තමයි ගෙවල්වල සැමියා බිරිඳ දෙන්නා තැන් දෙකක ෆෝන්වල. යාළු මිත්‍රයෝ එක්කාසු වුණත් කතා කරනවට වඩා කරන්නේ ෆෝන් දිහා බලාගෙන ඉන්න එක. ඒක ඒ තාක්ෂණයේ වැරැද්දක් නෙමෙයි. ඒ මනුස්සයින්ගේ කළමනාකරණයක් නැතිකම.

තව සමහරු ඉන්නවා පෙම්වතියක්/පෙම්වතෙක් හොයාගත්තු හැටියේ පවුලයි නෑයොයි එකතුවක්කල් එකට හිටපු යාළුවෝ ටිකයි සේරම අමතක කරලා දානවා. තව සමහරු විවාහ වුණා නැත්නම් දරුමල්ලෝ ලැබුණා කියලා නෑදෑකම්, යාළු මිත්‍රකම් අතඅරිනවා. හැබැයි ඔය උණුහුම තියෙන්නේ ටික කාලයයි. පස්සේ ආයේ අර සබඳතා අවශ්‍ය වෙනවා. උදාහරණයක් විදියට දරුවෝ නිසා පාසල් කාලේ යාළුවෝ අතඇරලා දානවා කියලා හිතන්න. දරුවෝ විවාහ වෙලා ගියාට පස්සේ වැඩිහිටියෝ තනිවෙනවා. ඒ කාලෙට අර පරණ අතීතය කතා කර කර ඉන්න ඉස්කෝලේ යාළුවෝ හිටියානම් කොච්චර සුන්දරද?

මම දන්න ගොඩක් වැඩිහිටියෝ ඉන්නවා. දරුවෝ කරන්නේ වැඩිහිටියන්ට බලන්න බණ වැඩසටහනක් දාලා දෙන එක. හැබැයි ඒ අයට ඕනේ කාත් එක්ක හරි කතා කරන්න. වැඩිහිටියෝ එක්ක ටිකක් කතා කරලා බලන්න. ඒ අය කතාවට කොච්චර ආසද කියලා එතකොට තේරෙනවා. සබඳතා නඩත්තුව කවදාහරි වැදගත් වෙනවා කියලා මම කිව්වේ ඒකයි.

සබඳතා නඩත්තු කරන්න ලොකු දේවල් කරන්න ඕනේ නැහැ. මුලින්ම අනිත් මිනිස්සුන්ගේ හැඟීම් තේරුම් අරගෙන ඒවාට ප්‍රතිචාර දක්වන්න. ඒ කියන්නේ පලදායී සන්නිවේදනයක් ඇති කරගන්න. මනුස්සයෙක් දැක්කහම සතුටින්ද අහන්න. අද ලස්සනයි කියන්න. මනුස්සයෙක් අසනීප වුණාම හොයලා බලන්න. එහෙම අයව නිතරම අනිත් අයගේ ආදරයට ගෞරවයට ලක්වෙනවා.

ඒ වගේම ත්‍යාගශීලී වෙන්න. තමන්ට වැඩිපුර තියෙන දෙයක් අනිත් මිනිසුන්ට දෙන්න. ලෝබ, කුම්මැහි මිනිස්සුන්ට කවුද කැමති?

පුළුවන් හැමවෙලේම කණ්ඩායම් වැඩවලට එකතු වෙන්න. ගමේ, රැකියා ස්ථානයේ එකතු වෙලා කරන්න පුළුවන් වැඩවලට දායකවෙන්න. ඒ වගේම තමයි නිතරම ආවේගශීලී හැඟීම් කළමනාකරණය කරගන්න. නිතරෝම තරහින් පුපුර පුපුර ඉන්න අයට සබඳතා නඩත්තුව අමාරුයි.

ඒ වගේම සහකම්පනය වැදගත්. අනිත් අයගේ හැඟීම් තේරුම්ගන්න බලන්න. හරි විදියට වචන හසුරුවන්න.

ඊළඟ කාරණය තමන්ට මතයක් තියෙනවා වගේම අනිත් අයටත් මතයක් තියෙනවා කියන එක පිළිගන්න. තමන් හිතන විදියටම අනිකාත් හිතන්න ඕනේ කියලා හිතන්න එපා. අනිත් අයගේ අදහස්වලටත් ඇහුම්කන් දීලා ඒවට ගරු කරන්න. ඒ වගේම නිතරම නිර්මාණශීලී වෙන්න. නිර්මාණශීලී අයට අනිත් අය අතරේ ප්‍රියමනාපව පේන්න ලේසියි.

තව වැදගත් දෙයක් කියන්න ඕනේ. සබඳතා ඕනේ කියලා හැම සබඳතාවයක්ම අමාරුවෙන් නඩත්තු කරන්න යන්න එපා. මොකද දැන් කාලේ සමාජයේ විෂ සහිත මිනිස්සු වැඩියි. මනුස්සයෙක් ආශ්‍රය කරද්දි ඒ මනුස්සයාව හඳුනගන්න එකත් වෙනම හැකියාවක්. ඒ හැකියාව වර්ධනය කරගන්න. කිසිම වෙලාවක ටොක්සික් සබඳතා නඩත්තු කරන්න එපා. ආශ්‍රය කරන්න එහෙමට හොඳයි කියලා හිතෙන අය නැත්නම් ගැළපෙන හොඳ ශක්තිමත් සබඳතා කිහිපයක් හදාගන්න. ඒ ඇති.

මේ ලෝකේ මිනිස්සු බිලියන 7කට වඩා ඉන්නවා.

‘දහස් මුවකින් නැගෙන ඔල්වර
සිනා හඬ දසතින් ඇසේ
දහස් ගණනක් සෙනඟ අතරේ
මහා තනියක් මට දැනේ...’

කියලා මහගම සේකර කවියා කිව්වා වගේ එච්චර සෙනඟක් මැද්දේ තනිවෙන්න එපා කියලයි අවසානෙදි කියන්න ඕනේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවන අත්දැකීම් ඇසුරින් 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කම පිළිබඳව වසර දෙකක් පුරාවට ඔබට බොහෝ දේ ලියා ඇත. ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුටු විය හැකි කාරණා පමණක් ජීවිතයට එක්කරගැනීමේ ඇති වටිනාකම පිළිබඳව ඇගේ ජීවන අත්දැකීම් ඇසුරින් නිතර කතා කළාය. මේ එම ලිපි මාලාවේ අවසන් ලිපියයි.

# Copy කළාට ස්තුතියි!

අපේ ජීවිතේ ඇතුළේ අපිට මුණ ගැහෙනවා අපි කරන දේම කරන අය. පවුලේ අය, යහළුවන් අතරේ, වැඩ කරන තැන වුණත් එහෙම අය අපිට හමුවෙනවා. හිතන්නකෝ ඔයා ගෙදරට අලුත් දෙයක් ගන්නවා කියලා, ඒකම එහා ගෙදර අයත් ගන්නවා. ඔයා ලස්සන ඇඳුමක් ඇඳන් යනවා, ඒකම හොයාගෙන ඔයාගේ කාර්යාලයට තව කෙනෙකුත් අඳිනවා. හැබැයි ඒවා ඔයාගෙන්ම අහලා විස්තර දැනගෙන "මටත් ගන්න ආසයි", "කොහෙන්ද ගත්තේ, මාත් මෙහෙම එකක් හොය හොය හිටියේ" කියලා කරන අය ගැන නෙවෙයි මේ කතා කරන්නේ. එහෙම අය කරන්නේ ඔයාව අනුගමනය කරන එක. කොපි කරන එක ඊට හාත්පසින් වෙනස්. ඔයාගෙන් විමසිල්ලක්වත් නොකර ඔයා කරන දේම කරන එක කොපි කිරීමක්. එහෙම කෙනෙකුට ඔයා එක්ක තියෙන්නේ තරඟයක්.



මටත් එහෙම දේවල් වෙලා තියනවා. ඒත් මට ඒක තේරුණේ ගොඩාක් පස්සේ. මං කරන කරන දේම කරන, මං ආස දේට ආස වෙන, මං ගන්න දේවල්ම ගන්න කෙනෙක් හිටියා. ගොඩක් වෙලාවට ඒ ගැහැනු ළමයා මට කීවේ එයාගේ යාළුවෝ එයාව කොපි කරනවා කියලා. එතකොටයි මට තේරුණේ එයා මට කරන්නෙත් ඒ දේම නේද කියලා. ඒ දවස්වල මං තරුණයි. මට එහෙම දේකට මුණදෙන්නේ කොහොමද කියලා තේරුමක් තිබ්බේ නෑ. ඒ නිසා මට දැනුණේ කළකිරීමක්.

තව සිද්ධියකුත් මට වුණා. සමාජ මාධ්‍යයේ මං ලියන ලිපි ගොඩක් වෙලාවට වෙන අය ඒ අයගේ නම්වලින් පළකරපු අවස්ථා තිබුණා. එක වතාවක් මනෝඋපදේශිකාවක් පවා මං ලියපු ලිපියක් එයා ලිව්වා වගේ පළකරලා තිබ්බා. එදා මට දුක හිතුණත් පොඩි සතුටකුත් දැනුණා. ඒ මගේ ලියවිලි හොඳ නිසයි කොපි කරලා තමන්ගේ වගේ පළ කරන්නේ කියලා. ඒත් එතකොටත් මට තේරුණේ නෑ කොපි කරන අය ගැන සුබවාදීව බලන්නේ කොහොමද, ඒකෙන් හොඳක් හොයාගන්නෙ කොහොමද කියලා.

තවත් සමාජ මාධ්‍ය ආශ්‍රිත ඔය වගේ සිද්ධියක් වුණු වෙලාවක මගේ හිත රිදිලා, දහම්ට ඒ ගැන කිව්වම මට හම්බවුණේ බලාපොරොත්තු නොවුණු විදියේ උත්තරයක්.

"ඉතින් මොකද වෙන්නේ කොපි කරාට..? ඔයා කරන දේවල් ඔයා විතරක්ම කරන්න ඕනේ, අනිත් අය ඒවා නොකර ඉන්න ඕන කියලා නියමයක් නෑනේ. ඔය දේවල් ප්‍රශ්න කරගන්න එපා. ඒක හරි Cheap... (පහත්). අනික ඔයා කරන දේ තව කෙනෙක් කරනවාට තියන කුහකකම නිසයි ඔයාට අවුල් යන්නේ. ඔයා ආස ඔයා කරන දේවල් අනිත් අය කරනවාටනේ, ඔයාම ඒවා දැකලා සතුටු වෙනවානේ. දැන් ඇයි මේ?"

ඒ උත්තරේ එක්ක මට තව දුක හිතුණා. "අනුගමනය කරන එකයි කොපි කරන එකයි දෙකක්... මට දුක මං කාගෙවත් දේවල් එහෙම කොපි කරන්නේ නැති නිසා. මං කරන දේ ඇතුළේ මගේ අනන්‍යතාව රැකගන්න නිසා..." කියලා කිව්වා.

එතකොට එයා කිව්වා "ඔයාට හැමදම වැරදුනේ, මං එහෙම කරන්නෙ නෑ කියලා හිතන එකෙන්. ඔයා නොකළට අනිත් අය එහෙම කරනවා කියන එකත් ඔලුවේ තියාගන්න... මං ඔයාට දෙයක් කියන්නම් රෝසි, ඔයා කරන දේවල් එක්ක ඔහොම දේවල් වෙද්දි ඒවා ඔයාට දරාගන්න බැරි නම් ඔයා කරන දේ නතර කරන්න. ඔයා කරන දේ ඇතුළේ සතුට නැතිවෙනවා ඔයා ඔය වගේ දේවල්වලට දුක් වෙන්නයි තරහා ගන්නයි ගියාම..."

දහම් මට ඒ කතා කරපු විදියට, ඒ විලාසෙට, කතාව ඇතුළේ තිබුණ නොරිස්සුම් බවට මට දුක හිතුණා. මං පස්සේ පැත්තකට වෙලා කල්පනා කරා.

මං කරන කියන පෙන්නන කිසිම දේකින් සමාජෙට නරක දෙයක් දෙන්නේ නෑ. මගේ වැරදි නිවැරදි කරගෙන උගත් පාඩම්වලින් ජීවිතේ ගොඩනගාගත්තු විදියයි මං සමාජය එක්ක බෙදාගන්නේ. මට වේදනාවක් දැනුණ සිද්ධියක් දිහා වුණත් සුබවාදීව බලපු විදියයි මං කියන්නේ. ඉතින් ඒ වගේම මේකෙත් මං හිතන්න පුළුවන් හොඳ පැත්ත හිතුවා. මාව කොපි කරන කෙනෙක් වුණත් ගන්නේ හොඳ මිසක් නරක නෙවෙයි. මාව කොපි කළා වුණත් එයාලා සමාජෙට දෙන්නේ හොඳ දේවල්. ඒ නිසා ඒ ගැන දුකක් තරහක් තියා නොගෙන, සතුටු වෙන්නයි ඕන කියලා මං හිතුවා. එතකොට මගේ හිතේ වේදනාව පොඩ්ඩ පොඩ්ඩ අඩුවුණා.

දහම් මට සැරෙන් කිව්වත් නිවීසැනසිල්ලේ හිතලා බලද්දි ඒ කියපුවා ඇත්ත කියලා මටම හිතුණා. ඒ නිසා මගේ හිතින් මං දහම්ට ස්තුතිවන්ත වුණා.

ආයේම දහම් මට කතා කරා. "රෝසි කවුරු ඔයාව කොපි කරත් ඒවා කොපි විතරයි, ඔරිජිනල් ඔයා නෙවෙයි. ඒක දකින බලන මිනිස්සුට ඒවා තේරෙනවා. ඒ නිසා ඔයා ඔහොම හිතලා ඔයාව පහතට දාගන්නේ නැතුව, ඔයා සතුටෙන් කරන දේ කරන්න. ඔයාව කොපි කරන්නේ අලුත් අදහස් නැති අය. අනිත් දේ ඔයා ඔයාගේ පැත්තෙන් සාර්ථක නිසා. ඉතින් ඒකම ඇතිනේ සතුටු වෙන්න. ඔයාව කවුරු හරි කොපි කරද්දි ඔයා දුක්වෙන්න කේන්ති ගන්න නෙවෙයි, සතුටු වෙන්නයි ඕනේ. තව කෙනෙක් ඔයාව කොපි කරන එකම තමයි ඔයා කරන කියන දේ ඇතුළේ සාර්ථකත්වය. ඔයාව කොපි කරනවා නම් ඔයා එතැනින් ඉස්සරහට ගිහින් තව අලුත් දෙයක් කරන්නයි ඕනේ. එතකොටයි ඔයාට වටිනාකමක් එකතුවෙන්නේ. සතුටුවෙන්න ඕන දේකටනේ ඔයා දුක්වුණේ" කියලා කිව්වා.

ඇත්තටම එදා ඉඳන් මාව කොපි කරන අය දිහා මං බලන්නේ සතුටෙන්. මං සාර්ථකයි කියලයි ඒ අය මට පෙන්වන්නේ. ඒ නිසා මාව අනුගමනය කරන අයට හදවතින්ම මගේ ආදරේ දෙනවා. මාව කොපි කරන අය, මට මගේ සාර්ථකත්වය ගැන සතුටු වෙන්න හේතු දෙනවාට ස්තූතිවන්ත වෙනවා.

ඇත්තටම දහම් කිව්වා වගේ මට ආපු තරහව, කේන්තිය කුහකකම නිසා ආපු දෙයක් වෙන්න ඇති. ඉතින් මාව කොපි කරපු අයට පින්සිද්ධ වෙන්න මං ඒ අඩුපාඩුවත් හඳුනගත්තා. අද වෙද්දි ඒ ගැන මට සතුටුයි.

ඉතින් ඔයා අඳින විදිය, දාන හෑන්ඩ් බෑග් එක, කතා කරන විලාසය, ඇවිදින විදිය, කරන කියන හැමදේම කොපි කරන අය ඔයාට මුණගැහෙයි. එතකොට දුක්වෙන්නවත්, තරහා ගන්නවත් එපා. ඒ අයට ස්තූතිවන්ත වෙන්න. එයාලා, ඔයාව කොපි කරන්නේ ඔයා එයාලාට වඩා මොන විදියකින් හරි සාර්ථක නිසා.

ඉතින් පුරා අවුරුදු දෙකක් මගේ ජීවිතේ අත්දැකීම් සහ පවුල් ජීවිතේ සොඳුරුම ඉසව් එක්ක ඔයාලා අතරට මං ආදරේ අරන් ආවා. මාව ආදරෙන් කියවපු පාඨක හැමෝටම හදවතින්ම ස්තූතියි. පොඩි විවේකයක් අරගෙන, ජීවිතේට තව අත්දැකීම් එකතු කරගෙන ආපහු මුණගැහෙන්න එන්නම්. ඒ නිසා මෙතැන් සිට, මේ තාවකාලික සමුගැනීමට අවසරයි. මාව හදවතේ රඳවගත්තු හැමෝටම ස්තූතියි.

ආදරේ අරගෙන දහසකුත් එකක් කාන්තාවන් අතරට එන්න අවස්ථාව දුන්න 'ධරණී' පුවත්පතේ කර්තෘ මණ්ඩලයටත් ගොඩක් ස්තූතියි.

මම,

**හෂිණී මනමේන්ද්‍ර**

AUTOWHEEL
පවුලේ අවන්හල දැන් විවෘතයි
සජීවී සංගීතය සමඟින්
ශ්‍රී ලාංකීය දිවා ආහාර දැන් ලබාගත හැක
ෆ්‍රයිඩ් රයිස
රයිස් ඇන්ඩ් කරි
කහ බත්
රයිස් ඇන්ඩ් කරි
බිරියානි
එකක මිල රු.455/=
සඳුදා
අඟහරුවාදා
බදාදා
බ්‍රහස්පතින්දා
සිකුරාදා
AA CEYLON
Estd. 1904
ලංකා ඔටෝමොබයිල් සංගමය
40, ශ්‍රීමත් මාකන් මාකර් මාවත, කොළඹ 03.
විමසීම්: 077 - 4369013 ( ක්‍රිෂෝන් )

**දැ**න් ගොඩක් උදවියගේ ප්‍රධාන රාජකාරිය ස්මාර්ට් ෆෝන් එකෙන් යූටියුබ් වීඩියෝ බලන එක. දරුවෝ යූටියුබ් බලන්න ඇබ්බැහි වෙලා කියලා මැසිවිලි තියන අම්මලා වුණත් කොච්චරද. ඔය බහුතරයක් උදවිය යූටියුබ් එකේ හොයන්නෙත් අනුන්ගේ වල්පල්. හැබැයි ඔය අතරේ මොළේ පාවිච්චි කරලා යූටියුබ් බලලා ගොඩගිය මිනිස්සුත් නැතුවම නෙවෙයි.

ඔස්කාර් සම්මාන උළෙලේ 2022 හොඳම චිත්‍රපටය වුණේ 'Everything everywhere all at once' කියන චිත්‍රපටය. මේ චිත්‍රපටයට VFX (චිත්‍රපට සඳහා භාවිතා කරන දියුණු තාක්ෂණයකි) තාක්ෂණය වෙනුවෙනුත් ඔස්කාර් සම්මානයක් ලැබුණා. හොඳම දේ චිත්‍රපටයේ VFX කරපු කණ්ඩායම ඒ තාක්ෂණය ඉගෙනගන්න කිසිම පාසලකට ගිහින් නැහැ. තනිකරම ඉගෙනගෙන තියෙන්නේ යූටියුබ් එකෙන්.

තව එකක්. දැන් ඉන්දියාවම හොල්ලගෙන ඉන්න අපේ ගායිකාව යොහානි ගිටාර් ගහන්න ඉගෙනගත්තේ යූටියුබ් එකෙන් කියලා 'ධරණී' අපිත් එක්ක කරපු කතාබහකදීම කිව්වා. ඒ වගේම තමා ඉන්දියානු ක්‍රිකට් ක්‍රීඩක වරුණ් චක්‍රබෝර්ති. ඔහු පිතිකරුවෙක් විදියට කීපපාරක්ම අසාර්ථක වුණා. පස්සේ වරුණ් යූටියුබ් එකෙන් ස්පින් බෝලින්ග් ඉගෙනගෙන ඉන්දියානු ජාතික කණ්ඩායමටත් තේරිලා 2020 IPL එකේ වැඩිම කඩුලුලාභියාත් වුණා.

කෙළින් රෙද්දක් කපාගන්න බැරිව හිටපු තවත් තරුණියක් යූටියුබ් වීඩියෝ බලලා ඇඳුම් මහන්න ඉගෙනගෙන සාර්ථක වෙලා අද ඒ ඇඳුම් පිටරට යනවා. මේ කියන්න යන්නේ ඒ කතාව. තාක්ෂණේ මෙච්චර දියුණු කාලෙකත් දෙයක් ඉගෙනගන්න සල්ලි නෑ අරක නෑ මේක නෑ කියන අයට අර උඩින් කියාපු කතා වගේම මේ කතාවත් ආදර්ශයක්. අපේ කතා නායිකාව දිලේශා මධුෂානි. අද 'ධරණී' කවරය සැරසිලා තියෙන්නේ අඩියෙන් පටන් අරන් අද බොහොම සාර්ථක තැනක ඉන්න ඇගේ රුවින්.

# නූල ඉඳිකට්ටට අල්ලන්න නොදැන ඉඳපු මම දැන් ඇඳුම් මහලා පිටරටත් යවනවා

## ව්‍යවසායිකා දිලේශා මධුෂානි



**"මම ඉන්නේ හික්කඩුවේ ගෝනපීනුවල. පුංචි කාලේ ඉඳලම ආසාව තිබුණේ බැංකුවක වැඩ කරන්න. ඒ නිසාම වාණිජ අංශයෙන් උසස් පෙළ කරලා බැංකු තරඟ විභාග පාස් කළා. උසස් පෙළින් පස්සේ රජයේ බැංකුවක මාස 06ක් පුහුණු සේවිකාවක් විදියට වැඩ කළා. පස්සේ මට කමර්ශල් ලීසිං ආයතනයේ ස්ථිර රැකියාවක් ලැබුණා."**

දිලේශා ඒ ආයතනයේ අවුරුදු තුනක් සේවය කළාලු. ඒ වැඩ කරපු කාලේ වුණත් බොහොම ආසාවෙන් ආදරෙන් රස්සාව කළා කියලයි ඇය කිව්වේ.

"මේ සිදුවීම වුණේ 2019දී. මම විවාහ වෙන්න හිටපු කෙනාට වාහන අමතර උපාංග වෙළඳසැලක් දන්න බලාපොරොත්තුවක් තිබුණා. හැබැයි ඔහු ඒ වැඩේට ටිකක් අදිමදි කර කර හිටියා. එයාට උදව්වක් වෙන්න මම රස්සාවෙන් අයින් වෙලා එයාව උනන්දු කරලා ඒක පටන්ගත්තා. ඊටපස්සේ ඒ වැඩවලට උදව් කළා. හැබැයි කස්ටමර් කෙනෙක් ආවහම බඩු දෙනවා බිල් දානවා වගේ පොඩි වැඩ ඇරෙන්න එතැන මට කරන්න ලොකු දෙයක් තිබුණේ නැහැ. ඒ වුණත් ඔහු මට සැලරි එකක් දුන්නා. මට දැනුණේ නිකන් ඉඳන් පඩි ගන්නවා වගේ හැඟීමක්."

ඔය කාලෙදිම දිලේශා විවාහ වුණාලු.

**"ජොබ් එකෙන් අයින් වෙලා ටික දවසකින්ම මට පීඩනයක් දැනෙන්න ගත්තා. ඉස්සර මම ලස්සනට ඇඳලා ජොබ් එකට ගියපු විදිය නිතරම මතක් වුණා. ශොප් එකට එන අය වුණත් දැකපු හැටියේ මගෙන් ඇහුවේ ජොබ් එක ගැන. ඔච්චර හොඳ රස්සාවකින් අස්වුණේ අපරාදේ කියලා හැමෝම කිව්වා. සමහර යාළුවෝ ඒ අයට ලැබුණු ජොබ් ගැන මාත් එක්ක වැඩිපුර කතා කළා. ඒවත් එක්ක දැනුණු පීඩනය නිසාම මම ආයෙත් ජොබ් හොයන්න පටන්ගත්තා."**

දිලේශා දෙවැනි වතාවට රැකියා හොයපු කාලෙලු ලංකාවට කොවිඩ් ආවේ.

"කොවිඩ් නිසා ජොබ් හෙවිල්ල ලේසි වුණේ නැහැ. කරන්න දෙයක් නැති තැන මම ඉතින් ශොප් එකේ ඉඳගෙන දවසම යූටියුබ් වීඩියෝ බැලුවා. හැබැයි ඒ බැලුවේ ඉගෙනගන්න මොනවාම හරි තියෙන වීඩියෝ. දවසක් අහම්බෙන් ලස්සන ක්‍රොප් ටොප් එකක් මහන වීඩියෝ එකක් බැලුවා. පතොරම් නැතිව කෙළින්ම රෙද්දේ බ්ලොක් එක ඇඳලා කපලා තමයි මැහුවේ. මම ඒ වීඩියෝ එක කීපපාරක්ම බැලුවා. පස්සේ ඒක කරලා බලන්න පුදුම තරම් ආසාවක් ආවා."

අර මුලදිම කිව්වත් වගේ ඒ වෙද්දි දිලේශාට මැහුම් පිළිබඳව කිසිම දැනුමක් තිබුණේ නැතිලු.

"ඉස්සර මම මහන්න කැමති නැහැ. ඉතින් කවදාවත් ඉගෙනගන්න හිතලත් නැහැ. හැබැයි ඇඳුමක් ගත්තහම ඒක ඇගේ ගාණට හදාගන්න ගෙවල් ගාව මැෂින් තියෙන නැන්දලා හොයාගෙන යනවා. ඔහොම යන නිසාම කාලෙකට කලින් තාත්තා මට මහන මැෂිමක් අරන් දුන්නා. ඒත් මම ඒක පාවිච්චි කළේ නැහැ. කාලයක් තිස්සේ මැෂිම අපේ ගෙදර ඔහේ තිබුණා. අර වීඩියෝ එක බැලුවට පස්සෙ එදාම ඒක මහන්න කියලයි මට හිත කිව්වේ.

ඉතින් එදා රෑ රෙදි කෑල්ලකුත් අරන් හස්බන්ඩ්ගේ ගෙදර යන්නේ නැතිව මම මගේ මහගෙදරට ගියා. මොකද මගේ මැෂින් එක තිබුණේ එහෙනේ. ඒ ගිහින් වීඩියෝ එකේ කියලා දීපු විදියට මහලා ඇඳලාත් බැලුවා. මුල්ම පාර ඒක හරියට ආවේ නැහැ. අත්කර මදි. කර උඩ වැඩියි."

වැඩේ වැරදුණා කියලා දිලේශා පසුබැහැලා නැහැ. ඇය පහුවදාත් යූටියුබ් එකෙන් ඇඳුම් මහන වීඩියෝ බැලුවලු.

"දෙවැනි දවසෙත් රෙද්දක් අරන් මහගෙදර ගියා. එදා මැහුවෙත් අර කලින් මැහැව්ව එකමයි. එදානම් ඒක ටිකක් හොඳට ආවා. ඔය විදියට දිගටම යූටියුබ් බල බලා ක්‍රොප් ටොප් මැහුවා. ඒවා මංම ඇඳලා ෆේස්බුක් එකෙයි, වට්සප් එකෙයි

**මහත්තයාගේ ව්‍යාපාරයේ වැඩ කරද්දී ඔහු මට සැලරි එකක් දුන්නා. ඒත් ලොකු වැඩක් නොතිබුණු නිසා මට දැනුණේ නිකන් ඉඳන් පඩි ගන්නවා වගේ හැඟීමක්**

ස්ටේටස් දැම්මා. මැහුවේ මම කියන සතුටට ස්ටේටස්වලට දැම්මා මිසක කිසිම ව්‍යාපාරික අදහසක් තිබුණේ නැහැ.”

හැබැයි දිලේෂට මුල්ම ඕඩරේ ලැබිලා තියෙන්නේ ඔය ස්ටේටස් දැම්ල්ල නිසයි.

**“ස්ටේටස් දැකපු මගේ හොඳම යාළුවා එයාටත් මේ වගේ ඇඳුමක් මහලා දෙන්න කිව්වා සල්ලිවලට. ඉතින් රෙදිවලට විතරක් අය කරලා එයාට ක්‍රොප් ටොප් එකක් මහලා දුන්නා.”**

මේ වැඩේ ව්‍යාපාරයක් විදියට කරන්න පුළුවන් කියන අදහස ඔතැනදිවත් ඇයට දැනුණේ නැතිලු. ඔය කාලේ පවා ඇයට තිබුණේ රැකියාවක් හොයාගන්න ඕනේ කියන අරමුණලු.

“ජොබ් එකක් හම්බෙනකල් නිකන් ඉන්න එකේ කියලා යූටියුබ් බලලා මාස්ක් මහන්න පටන්ගත්තා. හැබැයි ඒ වැඩේ එච්චර සාර්ථක වුණේ නැහැ. ටික්ටොක්වල, ෆේස්බුක්වල තියෙන ෆැෂන් පේජ් දැකලා මටත් පේජ් එකක් හදන්න හිතුණා. පස්සේ මම මහන ක්‍රොප් ටොප්වල ෆොටෝ ඒකට දැම්මා. පස්සේ මට අඳින්න ගවුම් මහන්න හිතුණා. යූටියුබ් එක බලලා ඒවත් ඉගෙනගත්තා.”

ඔය අතරේ දිලේශා ගෙදර තිබුණු මැෂින් එක සැමියගේ වෙළඳසැලට ගෙනැල්ලා ඇයට අඳින්න ගවුම් මහන්න පටන් අරන්.

**“මුලින්ම මැහුවේ සිම්පල් ගවුම්. ශොප් එකේ තියාගෙන මහද්දි ශොප් එකට එන අයත් මගෙන් ගවුම් ඉල්ලන්න ගත්තා. පස්සේ මම ඒ අයටත් ගවුම් මහලා දුන්නා. ඒවා ෆොටෝ ගහලා පේජ් එකට දැම්මා. ඔහොම යද්දි නොහිතුව විදියට එකදිගටම ඕඩර් එන්න පටන්ගත්තා. රස්සාවක් කරනවට වඩා මේ වැඩෙන් මට දියුණුවෙන්න පුළුවන් කියලා තේරුණේ එතකොට.”**

දිලේශට ඒ තරම් ඇණවුම් එන්න හේතුව ඇගේ ගවුම්වල තියෙන සුන්දරත්වය, අනර්ඝ නිමාව. උනන්දුව තියෙනවා නම් යූටියුබ් බලලා ගොඩ යන්න පුළුවන් කියන එකට දිලේෂත් හොඳම උදාහරණයක් කියලා අපි කිව්වේ ඒකයි.

“මම ගවුම් මහන්නේ පතොරම් තියලා නෙමෙයි. කස්ටමර්ස්ලා මට ගවුම්වල ෆොටෝ එව්වහම බැලූ බැල්මට ඒක මහලා තියෙන හැටි මට තේරුම්ගන්න පුළුවන්. පපුවෙයි, ඉනෙයි මිමි අරන් ඇගේ මිම්මටම මහන්න පුළුවන්. මම ඒ හැම ටෙක්නික් එකක්ම ඉගෙනගත්තේ යූටියුබ් එකෙන්.”

යූටියුබ් එකෙන් ඉගෙනගත්තා කිව්වට දිලේශා නොදැනුවත්ව වුණත් ඇයට ඒ දක්ෂතාවය පිහිටා තියෙන්න ඇති කියලයි අපිට නම් හිතුණේ.

**“මහන ඇඳුම් නීටි කරගන්න ඕලොක් මැෂින් එකක් ඕනේ. මුලදි මට ඕලොක් මැෂින් එකක් තිබුණේ නැහැ. මුලදි ඇඳුම් නීටි කරගත්තේ ඇඳුම් මහන වෙන තැන්වලට ගිහිල්ලා. පස්සේ සල්ලි ටිකක් එකතු කරලා ඕලොක් මැෂින් එකක් ගත්තා. මුලින් මම කළේ තනි කස්ටමර්ස්ලා ඉල්ලන ඇඳුම්. පස්සේ මට ඇඳුම් කඩවලින්, පේජ්වලින් ලොකු ඕඩර් ආවා. පස්සේ ශොප් එකේ තිබුණු මැෂින් එක මගේ මහගෙදර ගෙනිහිල්ලා ගෙවන ක්‍රමේට තව මැෂින් දෙකකුත් අරගෙන උදව්වට තුන්දෙනෙකුත් අරගෙන ටිකක් ලොකුවට වැඩේ පටන්ගත්තා.”**



දැන් දිලේශා ඇගේ ගවුම් ඩුබායි රටට අපනයනය කරනවා. ඒ වගේම හැම මාසෙකටම ගවුම් ඕඩර 200-300 නොවරදින තරමට අද ඇය සාර්ථකයි.

**දිලේශාට මේ ගමනේදී ආපු අභියෝග මොනවද?**

“ලොකුම අභියෝගය හිත් රිදෙන මිනිස්සුන්ගේ වචන. ‘අච්චර හොඳ ජොබ් එකකින් අයින් වෙලා ඇඳුම් මහන්නේ ඇයි’ කියලා මුලදි ගොඩක් අය ඇහුවා. මම නම් ඒවා කනකට ගත්තේ නැහැ. ඊටපස්සේ වැඩේ සාර්ථක වේගෙන එද්දිම මම ගැබ්ගත්තා. ‘ප්‍රෙග්නට් වුණාට පස්සේ මහන්න හොඳ නැහැ, ආහ් දැන් ඉතින් මහලා ඉවරයි’ වගේ කතා කිව්වා. හැබැයි අමාරු වෙලා හොස්පිටල් එකට ගෙනියන දවස වෙනකල්ම මම වැඩ කළා. හොස්පිටල් එකට ඇන්දෙත් මම මහපු ගවුම්. බබා හම්බුණාට පස්සේ නම් මාස දෙකක් විතර යනකල් වැඩ කළේ නැහැ.”

ලොකු ඕඩර්වලට නිදි මරාගෙන වැඩ කරපු දවස් තිබුණලු. මුලදි අත්, කකුල් වේදනා, කොන්දේ අමාරුකම් ආවත් ඒ හැමදේම ශක්තියකට මිස පරහකට බාරගත්තෙ නැහැ කියලයි ඇය කිව්වේ.

**“දැන් බබාට අවුරුද්දයි මාස දෙකයි. ඉතින් එයාගේ වැඩත් කරන ගමන් මේ වැඩේ හරියට කරගන්න ලොකු කැපකිරීමක් කරනවා. මගේ හස්බන්ඩ්, එයාගේ ගෙදර අය වගේම මගේ ගෙදර අයගෙනුත් මට ලොකු සහායක් ලැබෙනවා.”**

දිලේශාගේ බලාපොරොත්තුව ව්‍යාපාරය තවත් දියුණු කරලා තව වැඩි පිරිසකට රැකියා දෙන එකලු.

“මුලදි රැකියාවක් නැති එක ගැන පීඩනයෙන් හිටියට එද එහෙම වුණු එක හොඳයි කියලා මට දැන් හිතෙනවා. මොකද තමන්ගේ දේකින් ලැබෙන තෘප්තිය ඒ තැන්වලින් ලබාගන්න අමාරුයි. අනික ඉස්සර වගේ නෙමේ තාක්ෂණේ දියුණුව නිසා දැන් දෙයක් ඉගෙනගන්න, බිස්නස් එකක් පටන්ගන්න හරි ලේසියි. ඒකට ඕන වෙන්නේ උනන්දුව විතරයි කියන එකයි මට අනිත් අයට දෙන්න තියෙන පණිවිඩය.”

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**


# මිනුවන්ගොඩ
# වේයන්ගොඩ



**ප්‍රධාන මාර්ගයට 200m නුදුරින්**
(දෙවලපල පන්සල් හන්දිය) පිහිටි
**පර්. 17ක නව දෙමහල් නිවස**
(පහත මාලය සාද නිම කළ)

**විදේශගතවන බැවින් කඩිනමින් විකිණේ.**

**077 18 18 451 / 071 70 51 133**

# ඩග් හවුස් ළමාතැනීගේ මරණය අදටත් අබිරහසක් වුණේ කොහොමද?



නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ. සෑම මනුෂ්‍යයකුම නීතිය දැන සිටිය යුතුය. නීතිය රැකෙන්නේ ඒ පිළිබඳ දැනුවත්වීමෙනි. එවිට වඩා යහපත් සමාජයකට අඩිතාලම සැකසෙනු ඇත. නීතිය සම්බන්ධව දැනුවත් කිරීමේ ඉදිරි පෙළ චරිතයක් ලෙස ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න සැලකිය හැක. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස හෙතෙම වසර තුනක කාලයක් කටයුතු කළේය. ඔහු අපරාධ විද්‍යාව හා යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද, ව්‍යවහාරික විද්‍යාවන් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත. බ්‍රිතාන්‍ය මණ්ඩලය ප්‍රදානය කළ චෙවනින් (Chevening) ශිෂ්‍යත්වයක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ෆුල්බ්‍රයිට් ආයතනයෙන් පිරිනැමූ හියුබට් හම්ෆ්‍රි (Hubert Humphrey) ශිෂ්‍යත්වයක්ද දිනා ඇත. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී සිදුවීම් ගණනාවක නඩුවල පැමිණිල්ල මෙහෙයවීමට දායක වූ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න නීතියට අදාළව දක්වන අදහස් මෙරට නීති ක්ෂේත්‍රයේ මෙන්ම ඉන් පරිබාහිර තැනැත්තන්ටද වටී. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු ‘යළි මැවෙන අපරාධයක්’ නමින් ග්‍රන්ථයක්ද රචනා කළේය. එහි සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. රටේ සුප්‍රසිද්ධ නඩු කටයුතු ආශ්‍රිතව ඔහු ලබාදෙන අදහස්ද බෙහෙවින් වැදගත් වේ. ඩග් හවුස් මිනීමැරීම ලෙස ප්‍රචලිත සිදුවීම සැබැවින්ම මිනීමැරීමක්ද? එය අදටත් අබිරහසකි. මෙම ලිපිය එම සිදුවීම ආශ්‍රිතවයි.

19 කොටස

ස්ටීවන් සෙනෙවිරත්න උපතින්ම ධනවතෙකි. හෙතෙම කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් උපාධිය හදාරා නීතීඥ වෘත්තියට පිවිසියේය. එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක හිටපු අග්‍රාමාත්‍යවරයාගේ සමීප ඥාතියකු වූ ඔහු විවාහ වූයේද ධනවත් නෑදෑ පවුලකිනි. ලිලියන් රොස්ලින් ද අල්විස් ඇයයි. විවාහය සිදුවූයේ 1923 වසරේදීය. විවාහයෙන් පසු ඔවුන්ගේ නිවහන වූයේ කොළඹ පිහිටි ස්ටීවන්ට අයත් වයිට් හවුස් නම් නිවසයි. කණ කොකාගේ සුදු පෙනෙන්නේ ඉගිල්ලෙන විටදී මෙන් මේ දෙදෙනාටම දෙදෙනාගේ අඩුපාඩු පෙනෙන්නට ගත්තේ කලක් ගතවන විටය. ඒ බොහෝ අවස්ථාවල සැමියාට ලිපි මගින් සිය කණගාටුව, අප්‍රසාදය ප්‍රකාශ කිරීමට ලිලියන් පුරුදුව සිටියාය.

## මියයාමේ පෙර සූදානම

ලිලියන් සැමවිටම පාහේ සෘණාත්මක සිතුවිලිවලින් පසුවූ බව පෙනී යයි. ඈ සැමවිට සිතුවේ තමාගේ මරණය ඉතා ඉක්මනින් සිදුවනු ඇති බවය. ඈ තම මරණය ගැන නිතර කතා කළාය. ලිලියන්ගේ දෙමාපියන් මියගොසිනි. ඇගේ දෙවන දරුවාද ඉපදී දින කිහිපයකදී මෙලොව හැරගොස් ඇත. ඈ දියවැඩියාවෙන්ද පෙළුණාය. “මං වැඩි කලක් ජීවත්වෙන්නෑ” යනුවෙන් ඇය බොහෝදෙනෙකුට පවසා තිබිණ. එමෙන්ම හොල්මන් අවතාර පිළිබඳ නිරන්තර බයකින්ද ලිලියන් පසු වූවාය. නීතීඥ වෘත්තියේ වසර තුනක පමණ කෙටි කලක් පමණක් රැඳී සිටි ස්ටීවන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූයේය. ඉන් ඉවත් වූ ඔහු අනතුරුව තක්සේරු කිරීම් පිළිබඳ පෞද්ගලික ආයතනයක රැකියාව කර තිබේ. නව හැවිරිදි දරුවා සහ දැසි දස්සන්ද සහිතව සිටියද යුවළ අතර සම්බන්ධය බෙහෙවින් පළුදු වී තිබිණ. ලිලියන්ට අයත්ව තිබූ ගල්කිස්සේ දේපළක් විකුණා දැමීමෙන් එය තවත් උග්‍ර විය.

## වයිට් හවුස් වෙනුවට ඩග් හවුස්

වගා කටයුතු සහ සත්ත්ව පාලනයට බෙහෙවින් ඇලුම් කළ ස්ටීවන් ඒ සඳහා සුදුසු දේපළ මිලට ගැනීමේ රුචියෙන් සිටියේය. සිය වාසස්ථානය වූ වයිට් හවුසිය විකුණා දැමීමටද ස්ටීවන් තීන්දු කළේ එනිසා විය හැකිය. එයට ලිලියන් කිසිසේත් එකඟ නොවූවාය. මෙම නිවසින් පිටව යාමට වන්නේ සිය මරණය සමඟ බව ඇය සැමියාට දැනුම් දුන්නාය. එමෙන්ම වයිට් හවුස් නිවස විකුණුවහොත් එම මුදලින් දිනකට රුපියල් සියය බැගින් යාචකයින්ට ලබාදෙන බවට පොරොන්දු වෙමින් ලිලියන් තැබූ සටහනක්ද පසුව හමුවිය. ඒ තරමට ඈ සිටියේ නිවස අලෙවිය පිළිබඳ දැඩි කනස්සල්ලෙනි. කවදා හෝ තමන්ට කුලී නිවසක විසීමට සිදුවනු ඇතැයි ලිලියන් කම්පා වූවාය. ඈ සිතූ පරිදිම වයිට් හවුස් විකුණා දැමීමෙන් පසු ටික දිනක් ඔවුන්ට කුලී නිවසක රැඳීමට සිදුවිය. අනතුරුව ස්ටීවන් බගතලේ පාරේ පිහිටි ඩග් හවුස් නම් දේපළ මිලට ගත්තේය. පසුව සෙනෙවිරත්න පවුල සිය සේවකයින්ද සමඟ වාසය කළේ එහිය. තනි තට්ටුවේ බංගලාවක් වූ එහි ඉදිරිපස, පිටුපස සහ නැගෙනහිරින් වැරැන්ඩා තිබිණ. ලිලියන් සහ සෙනෙවිරත්න යුවළගේ එකම පුතු ටෙරන්ස් සිටියේ එකිනෙකට විවෘත කාමර දෙකකය. ලිලියන්ගේ කාමරයේ ඇගේ සේවිකාව වූ ඇල්පිනා ද සිටියාය. මේබල් ජෝසප් හෙදිය ටෙරන්ස් රැකබලා ගනිමින් ඔහුගේ කාමරයෙහිම විසුවාය. ස්ටීවන් රැඳී සිටියේ බංගලාවේ පසුපස ඇති කාමරයක තනිවයි. සත්ව පාලනයට ප්‍රිය ඔහු ඩග් හවුස් වත්තේ කුකුළන්ද ඇති කළේය.

## නෑනාට එරෙහි ලිලියන්

ස්ටීවන්ගේ ඥාතීහු ගම්පහ ද පදිංචිව සිටියෝය. ඔහුගේ සහෝදරියකද එහි වූවාය. 1933 ඔක්තෝබර් 14 වනදා ස්ටීවන් සිය පුත් ටෙරන්ස් ද රැගෙන වේයන්ගොඩ වාසය කරන සිය සහෝදරියගේ නිවසට ගියේය. සිය මවගේ ඇනුම් බැනුම්වලට නිතර ගොදුරු වන ටෙරන්ස් ද ගමනට එක්වූයේ දැඩි කැමැත්තෙනි. අසනීප තත්ත්වය සහ පවුලේ ආරවුල් හේතුවෙන් වූ මානසික පීඩනය ලිලියන් සිය දරුවා මතින් මුදාහරින බවක් දක්නට ලැබිණ. ස්ටීවන් හැමවිටම ඊට එරෙහිව යමින් පුතා ඇනුම් බැනුම්වලින් ගලවා ගැනීමට උත්සාහ කළේය. එබැවින් ටෙරන්ස් මවට වඩා පියාට සමීපව සිටියේය. සෙනසුරාදා දිනක් වූ එදින ඔහු සිය පියා සමඟ නැන්දණියගේ නිවසට ගියේ බොහෝ සතුටිනි. ගමන ගැන ලිලියන් දැන නොසිටියාය. ඈ කොහොමත් සිය නෑනා රිස්සුවේ නැත. එහි යාම ඇගේ කෝපයට හේතුවකි. එනිසාම ස්ටීවන් ඇයට නොදන්වා ගමන ගියා විය හැකිය.

## අමුත්තන් සමඟ ඩග් හවුස්හි අවසන් භෝජන සංග්‍රහය

දවසම සිය නැගණියගේ නිවසෙහි ගත කළ ස්ටීවන් සිය පුතා සමඟ රාත්‍රියේ යළි ඩග් හවුස් වෙත පැමිණියේය. එවිට ඔහු හමුවීමට එහි පැමිණ සිටියේ ජෝර්ජ් සේරම් සහ බිරියයි. දේපළක් මිලදී ගැනීමට තක්සේරුව පිළිබඳ උපදේශයක් ගැනීම ඔවුන්ගේ අරමුණ වී තිබිණ. සේරම් යුවළ ස්ටීවන්ගේ හිතවතුන්ය. ඔවුන් වෙනුවෙන් ලිලියන් කදිම රාත්‍රී භෝජනයක්ද පිළියෙල කරවූවාය. සියල්ල හොඳින් සිදුවෙමින් තිබිණ. ආහාර ගන්නා අතරවාරයේ ලිලියන් ස්ටීවන්ගෙන් විමසුවේ පුතා සමඟ දහවල් කාලයේ කොහි ගියේද යන්නයි. සිය නැගණියගේ නිවසට ගිය බව ස්ටීවන් පැවසීය. මොහොතින් සියල්ල වෙනස් වූයේ එම පිළිතුරෙනි. ලිලියන් ගමන පිළිබඳ උරණ වූවාය. උණුසුම් වචන හුවමාරුවක්ද විය.

**“අපි මැරිලා ගියාට පස්සෙ ඔයාලා මොනවා කියයිද දන්නෑ.”**

ලිලියන් ආවේගයෙන් කීවාය. ලතින් ආප්තයක් උපුටමින් ස්ටීවන් ඊට පිළිතුරු දුන්නේය.


**“අපිට මැරිච්ච මිනිස්සු ගැන කතා කරන්න බෑ. එයාලට තමන් වෙනුවෙන් උත්තර බඳින්න විදියක් නෑ මැරිලා නිසා.”**

මරණය පිළිබඳ ප්‍රකාශද සමඟ රාත්‍රී භෝජනය නිමාවට පත්විය.

> **එක ගෙදර හිටපු මහත්තයා සමඟ පණිවිඩ හුවමාරු කරගෙන තියෙන්නේ ලිපිවලින්**

## අබිරහස් රාත්‍රිය

සේරම් යුවළ පිටත්ව යාමෙන් පසු සෙනෙවිරත්න පවුල සහ සේවක සේවිකාවෝ සුපුරුදු පරිදි නින්දට ගියහ. ස්ටීවන් හුදකලා කාමරයේය. මේබල් ටෙරන්ස්ව ඔහුගේ කාමරයට රැගෙන ගියාය. ඒ හා බැඳුන අනෙක් කාමරයේ ලිලියන් සහ ඇල්පිනා ය.



නින්දට යාමට පෙර ස්ටීවන්ගේ කාමරයට ගිය ලිලියන් ඇස්ප්‍රින් පෙති 25ක් අඩංගු බෝතලයක්ද ඉල්ලාගෙන සිය කාමරයට පැමිණ තිබේ. හිසේ රුදාවෙන් පෙළීම ඊට හේතුවයි. එම ද්විත්ව කාමරය අගුළු ලෑමෙන් පසු පිටතින් කිසිවකුට එහි ඇතුළු වීමට ඉඩක් නැත. සයිමන්, සීලා, බණ්ඩා සහ පෙරේරා ඇතුළු සෙසු සේවක සේවිකාවන් තම තමන්ගේ කාමරවලය. ලිලියන් රාත්‍රියේ අවස්ථා දෙකකදී පමණ අවදි වූ බව ඇල්පිනාට මතකය. එදින වැසි සහිත ස්වභාවයක් පැවතිණ. වරක් ලිලියන්ට විවරව තිබූ කවුළු පියන් වසා දැමීමට අවැසි වී තිබේ. අනෙක් අවස්ථාවේ අවදි වී ඇත්තේ ජලය පානය කිරීමටයි.

## නිහඬ වූ අලුත් දවස

1933 ඔක්තෝබර් පහළොස් වනදා උදෑසන 6ට පමණ ඇල්පිනා අවදි වූවාය. එවිටද ස්වාමි දියණිය නින්දේ සිටින බව ඈ දුටුවාය. කිසිඳු වෙනසක් නැත. ඈ සුපුරුදු පරිදි මුළුතැන්ගෙයට ගියාය. ඉරිදාවක් වූ බැවින් මේබල් ජෝසප් උදෑසනම පල්ලියට ගොසිනි. ඈ පිටත්ව යද්දීද ලිලියන් නින්දේ සිටින අයුරු දැක ඇත.

“අන්න නෝනා කතා කරනවා.”

මුළුතැන්ගෙයෙහි සිටි ඇල්පිනාට සීලා පැවසුවාය. රියැදුරු පෙරේරා ද ඒ බව පවසා ඇත. එහෙත් ලිලියන් ඇල්පිනා යැයි නම් හඬ ගැසූ බවක් ඔවුන් සඳහන් කර නොමැත. ලිලියන් පැවසූ දේ කිසිවකුට පැහැදිලිව නොඇසීමට කුකුළන්ගේ කෑ ගැසීම් ආදී අවට පරිසරයේ ශබ්ද හේතු විය. ඇල්පිනා වැඩි කලබලයක් නැතිව කරමින් තිබූ කාර්යය අවසන් කර කාමරයට ගියාය. ඇල්පිනා ස්වාමි දුවගේ කාමරයට ඇතුල් වෙද්දීම ස්ටීවන්, ටෙරන්ස්ගේ කාමරයේ සිට පැමිණියේය. එවිට ලිලියන් හිස බිත්තිය දෙසට සහ පාද පහළට වැටෙන සේ සිය ඇඳේ හරස් අතට වැටී සිටියාය. ඈ නිසොල්මන්ය. බ්‍රැන්ඩි සහ උණුසුම් ජලය රැගෙන එන ලෙස ස්ටීවන් ඇල්පිනාට උපදෙස් දුන්නේ ඒ අනුවයි. ඒවා පෙවීමට උත්සාහ කළද සාර්ථක වූයේ නැත. කෘත්‍රිම ශ්වසනය ලබාදීමටද ස්ටීවන් කටයුතු කළේ එනිසාය. කිසිවකින් ප්‍රතිඵල නොවූ බැවින් පවුලේ වෛද්‍යවරයා වන පෝල් කැඳවාගෙන එන ලෙස ස්ටීවන් පෙරේරාට දැන්වීය. වෛද්‍යවරයා පැමිණෙද්දීද ලිලියන් මියගොසිනි. ඇගේ දකුණු අත අසල ලේන්සුවක් තිබූ බව සහ කාමරයේ සැර ගන්ධයක් පැවති බවද ඇල්පිනාගේ මතකයේ තිබිණ. ලේන්සුවද සේදීමට ඇති රෙදි ගොඩට එකතු විය. පෙරදා රැයේ ලබාගත් ඇස්ප්‍රින් බෝතලයේ ඉතිරිව තිබුණේ පෙති 9ක් පමණි.

## ක්ලෝරෝෆෝම් සබඳතාව

**“ක්ලෝරොෆෝම් වැඩියෙන් ශරීරගත වුණොත් මැරෙනවද?”**

ස්ටීවන්ගේ සහෝදරයාගෙන් ලිලියන් අසා තිබිණ. එවැනි අවස්ථා පිළිබඳ ඔහු ඇය දැනුවත්කර ඇත. එමෙන්ම සිය ගොවිපළක සිටි හරකෙකුගේ පාදයක ශල්‍යකර්මයක් සඳහා ස්ටීවන් ක්ලෝරෝෆෝම් බෝතලයක් මිලදී ගෙන තිබිණ. එහෙත් එය භාවිත කර නැත. එය ඩග් හවුස් වෙත රැගෙන ආ ස්ටීවන් බිරියට බාර දී තිබිණ. බොහෝදෙනා සිතුවේ ලිලියන් සියදිවි හානිකරගත් බවයි. මරණ පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව සිරුර භූමදානය කිරීමට පියවර ගැනිණ.

## සැකය මත සිරුර පිටතට

ලිලියන්ගේ මරණය ගැන ඇගේ ඥාතීහු සැක පළ කළහ. ඒ අනුව සිරුර නැවත ගොඩගැනීමට සිදුවිය. පළමු වර පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකළේ පවුලේ වෛද්‍ය පෝල් ය. දෙවැනි වර ඔහුගේ පුතු මිල්රෝයි මරණ පරීක්ෂණය කළේය. ඔවුන් දෙදෙනාගේ මතය එකිනෙකට වෙනස් විය. පෝල්ට අනුව මරණකාරියට ක්ලෝරොෆෝම් ශරීරගත වී නැත. එහෙත් ඔහුගේ පුත් වෛද්‍ය මිල්රෝයි පැවසුවේ ඇගේ මුඛය අසල පිළිස්සීම් තුවාල තිබූ බවයි. මෘත ශරීරයට ෆෝමලින් එන්නත් කරන අවස්ථාවේ ඔහු එය නිරීක්ෂණය කර ඇත. සිරුර නැවත ගොඩගත් අවස්ථාවේ මරණකාරියගේ කලව සහ අතේද පිළිස්සුම් ලකුණු දුටු බව මිල්රෝයි කීය. ඒ අනුව ඇයට ක්ලෝරෝෆෝම් ශරීරගත වූ බවට ඔහු සැක කර ඇත. එහෙත් එය හුදු සැකයක් මිස පැහැදිලි මතයක් නොවේ. කෙසේ වුවද ලිලියන්ට ක්ලෝරොෆෝම් දුන් බවට ස්ටීවන්ට චෝදනා එල්ල විය.

මරණයට හේතුව ඇස්ප්‍රින් ද ක්ලෝරොෆෝම් ද යන සැකය මතුවිය විය. එමෙන්ම ඒ කවර හෝ ද්‍රව්‍යය ඇය කැමැත්තෙන් ශරීරගත කර ගත්තාද, වැරදීමකින් ශරීරගත වූයේද නැතහොත් කිසිවකු බලහත්කාරයෙන් දුන්නාද යන ගැටලුව පවතී. බලෙන් දුන්නානම් එය කළේ ස්ටීවන් හෝ වෙන යමෙකුද? ඒ බව ඔප්පු කළ යුත්තේ පැමිණිල්ලයි. මූලික පරීක්ෂණයෙන් පසු ස්ටීවන් සෙනෙවිරත්නට එරෙහිව චෝදනා ගොනු කෙරිණ. ජූරි සභාවක් ඉදිරියේ නඩුව විභාගයට ගත්තේ අනතුරුවයි. 5:2 ක තීන්දුවකින් ස්ටීවන් මිනීමැරීමේ චෝදනාවට වරදකරු බව ප්‍රකාශ විය. පසුව විත්තිකරු ප්‍රිවි කවුන්සිලයට අභියාචනා කළේය. එහිදී හෙළිවූයේ සැකකරුට එරෙහි චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු වී නොමැති බවයි. මරණ පරීක්ෂණ වාර්තා අනුව උදෑසන 6.30ට පමණ මරණය සිදුව ඇත. උදෑසන 6න් පසු විත්තිකරු කුකුළන්ට ආහාර දෙමින් සිටි බවට සාක්ෂි තිබිණ. අන්‍යස්ථානිකභාවය පිළිබඳ එම සාක්ෂිය ජූරි සභාව සලකා තිබුණේ නැත. සාක්ෂිවල පරස්පරතාද සැලකිල්ලට ගැනිණ. එමෙන්ම විනිසුරුවරයා ජූරි සභාවට නිසි පරිදි කරුණු පහදා දී නොමැති බව නිරීක්ෂණය කළ ප්‍රිවි කවුන්සිලය විත්තිකරු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කළේය. විමර්ශනයේ වැදගත්කම, සාක්ෂිවල විශ්වසනීයත්වය ආදී කරුණු කෙරෙහි අද තරම් තාක්ෂණය සහ විද්‍යාව භාවිත නොකෙරුණු එම කාලයේදී ගත යුතුව තිබූ හොඳම තීරණය ප්‍රිවි කවුන්සිලය ගත්තා විය හැකිය. මක්නිසාදයත් නිවැරදිකරුවකු දණ්ඩනයට යටත් කරනවාට වඩා වරදකරුවකු නිදහස් කිරීමේ අවදානම ගැනීම වඩා සුදුසු බැවිනි. ඩග් හවුස් හි සැබෑවටම එදා වූයේ කුමක්ද යන්න අදටත් අබිරහසකි.

අබිරහසක් ඉතිරි කළද මේ නඩුව සමඟ බැඳුණ තවත් කතා කිහිපයක් වර්තමානයට ඉතිරි වී තිබේ. මෙම නඩුවේදී ජූරි සභාව අපරාධ ස්ථානය නැරඹීමටද ගොස් ඇත. එහිදී එය රඟ දැක්වූවා පමණක් නොව ක්ලෝරොෆෝම් භාවිත කරමින් විද්‍යාත්මක පරීක්ෂණයක්ද සිදුකර තිබේ. එහෙත් අපරාධ ස්ථානයකදී කිසිඳු ප්‍රදර්ශනයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීම අනීතිකය. අභියාචනා විභාගයේදී ඒ බවද සැලකිල්ලට ගැනිණ. අපරාධයක් විනිසුරු මනසේ මිස යළි භෞතිකව මැවීමට නොහැකි බව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්නගේ ‘යළි මැවෙන අපරාධයක්’ ග්‍රන්ථයේද පැහැදිලි කර ඇත. මෙම නඩුව ජූරි සභාව ඉදිරියේ විභාග වෙද්දී විනිසුරු අසුනේ සිටි අක්බාර් විනිසුරුගේ නමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාලාවක්ද පවතී. එමෙන්ම මව මියගොස් පියාද අහිමිවීමට ගිය ටෙරන්ස්ට ප්‍රිවි කවුන්සිලයේ තීන්දුව හේතුවෙන් පියාගේ උණුසුම අහිමි වීම වැළකී ගියේය. කොහොමටත් පියාට බොහෝ සමීප වූ ටෙරන්ස් ඔහුගේ අඩිපාරේම ගමන් ගත්තේය. හෙතෙම පේරාදෙණිය කෘෂිකර්ම අධ්‍යක්ෂ ධුරයටද පත්විය. ඔහුගේ මෑණියන්ට අයත්ව තිබී විකුණා දැමූ ගල්කිස්ස ඉඩම ආශ්‍රිතව මාර්ගයක්ද ටෙරන්ස් ඇවනියු නමින් නම් කර තිබේ. ජීවිතය එක් තැනකින් නොනවතින බව ඒ සියල්ල අපට සිහිපත් කරයි.

■ නීතීඥ රෂ්නිකා ලියනගේ

අලි කතා



තොරතුරු
මහාචාර්ය
**අශෝක දංගොල්ල**
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

# ඇදුරුතුමනි බිය නොවන්න හිරේ විලංගුවේ වැටෙන හැටි මම පෙන්වන්නම්

අලි බැලිල්ල නීතියට අවනතව කළ යුත්තකි. නැතහොත් අලි දෙස්තරලාට ගුරුහරුකම් දුන් ගුරුවරුන්ද හිරේ විලංගුවේ වැටීමට ඉඩ තිබේ. මේ ද එවැනි කතාවකි. එවිට මහාචාර්ය අශෝක දංගොල්ල පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට සම්බන්ධ වී වැඩි කලක් ගතවී තිබුණේ නැත.

දිනක් ඔහුට ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේවරයාගෙන් ඇමතුමක් ලැබිණ. මාලිගාවේ ඇතෙකු තුවාල ලබා ඇති බව හෙතෙම පැවසීය. ඒ අනුව හැකි ඉක්මනින් පැමිණ ඇතා පරීක්ෂා කර උපදෙස් දෙන්නැයි ඉල්ලීමක් ලැබිණ. පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ලැබී තිබුණු යතුරුපැදියකට නැගුණු මහාචාර්ය දංගොල්ල වහා ගමන පිටත් වූයේය. එය අමුත්තක් නොවුණේ යම් යම් අවස්ථාවල මහාචාර්ය දංගොල්ල එම යතුරුපැදිය භාවිත කළ බව සියල්ලෝ දැන සිටි නිසාය. නමුත් කිසිවෙක් නොදැන සිටි කරුණු කිහිපයක් ද විය. එකක්, එම රියට ගමන් බලපත්‍රය සහ රක්ෂණ සහතිකය නැතිවීමය. අනෙක මහාචාර්යවරයාට යතුරුපැදි පැදවීමට වාහන බලපත්‍රයක් නොමැති වීමය.

රෝගී ඇතා වෙත කඩිනමින් යාමේ අරමුණින් මහාචාර්ය දංගොල්ල යතුරුපැදිය කොළඹ - නුවර පාරේ පදවාගෙන ගියේය. මේ අතර පේරාදෙණිය උද්භිද උද්‍යානය අසල පොලිස් නිලධාරීහු දෙදෙනෙක් සියලු යතුරුපැදි නවතා ලිපි ලේඛන පරීක්ෂා කරමින් සිටියහ. කුමට බිය වන්නද? මහනුවර පොලිසියට අයත් සුනඛයින් කාලයක සිට පරීක්ෂා කරන බැවින් පොලිස් නිලධාරීහු මහාචාර්යවරයා හඳුනති. එනිසාම මහාචාර්ය දංගොල්ල හිස කෙළින් තබාගෙන රිය ඉදිරියට පැදව්වේය. ඔහුටද පොලිස් අණ ලැබිණ. රථය නැවතීමට විය. හිස් ආවරණය නොමැතිව යාම ඊට හේතුව බවට මහාචාර්යවරයා උපකල්පනය කළේය. හෙතෙම පොලිස් නිලධාරීන් වෙත ගමන් ගත්තේය. ඔවුන් ඉල්ලූ කිසිඳු ලේඛනයක් ඉදිරිපත් කිරීමට මහාචාර්යවරයා සමත් නොවීය. මාලිගාවේ ඇතුන් බලන්න යනවා කියා නැත. රාජකාරිය කළ යුතුය.

"එහෙනං ලියමුද සර්?"

පොලිස් නිලධාරියකුගේ පැනයට ගත් කටටම "හා" යැයි මහාචාර්ය දංගොල්ල පිළිතුරු දුන්නේය.

"කවුද බයිසිකලයේ හිමිකාරයා?"

ගුරු ගෞරවය නිසාමදෝ මහාචාර්යවරයා ගත්කටටම මහාචාර්ය කුරුවිට යැයි පැවසීය.

සතියකට පමණ පසු මහාචාර්ය දංගොල්ල පශු සායනයේ සතුන් පරීක්ෂා කරමින් සිටියේය. හදිසියේ එතැනට පැමිණි උපස්ථායකයකු දැනුම් දුන්නේ පොලිස් නිලධාරියකු පැමිණ ඇති බවයි. මහාචාර්යවරයා එය එතරම් නොතැකුවේ සාමාන්‍ය සිදුවීමක් බැවිනි. එහෙත් නැවත පැමිණි උපස්ථායක දැනුම් දුන්නේ පොලිස් නිලධාරියා සිතාසියක් රැගෙන විත් ඇති බවයි. මහාචාර්ය දංගොල්ල එය නිලධාරියාගේ අතේ තිබියදීම බැලීය. සිතාසිය ඇත්තේ මහාචාර්ය කුරුවිටගේ නමටය. ඒ අනුව ඔහුගේ කාමරය පෙන්වා ඔහුට ලිපිය බාරදෙන ලෙස හෙතෙම පොලිස් නිලධාරියාට දැනුම් දුන්නේය.

ගතවූයේ විනාඩි කිහිපයකි. පුටුවකට පයින් ගැසූ මහාචාර්ය කුරුවිට මහාචාර්ය දංගොල්ලගේ නම කියමින් කෑ ගැසීය. වහා එතැනට ගිය මහාචාර්යවරයා සිය ගුරුතුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියේ ලිපිය බාරගන්නා ලෙසයි. නීතීඥයකුට කතා කර නඩුවෙන් නිදහස් වීමට අවැසි පියවර ගෙන ඇතැයිද හෙතෙම ගුරුවරයාට දැන්වීය. කවර අයුරින් කරුණු දැක්වුවද කෝපයට පත්ව සිටි මහාචාර්ය කුරුවිට අනෙක් ආචාර්යවරුන් සමඟද සිය ගෝලයාට බැන වැදී ඇත්තේ ඔහු තම ජීවිතය අනතුරේ හෙළන බව පවසමිනි. කොරේ පිටට මරේ කියන්නාක් මෙන් මහාචාර්ය දංගොල්ල ඇමතූ නීතිඥවරයා පැවසුවේ නඩුවට කුරුවිට නැමැත්තා අධිකරණයේ පෙනී සිටිය යුතු බවය. වාසනාවකටදෝ මහාචාර්ය කුරුවිට ඒ බව දැනගත් විට දෙස් පැවරීමකින් තොරව උසාවි යාමට එකඟ විය. බලපත්‍ර නොමැතිව යතුරුපැදි පැදවීම ඇතුළු වැරදි තුනකට තමා වරදකරු බව ඔහු අධිකරණයේදී හිස නමා පිළිගත්තේය. එය මහාචාර්ය දංගොල්ලගේ දැඩි කණගාටුවට හේතු විය. තුවාල වූ ඇතෙකු හේතුවෙන් අලි දෙස්තර කෙනෙකුගේ ගුරුවරයකුට උසාවි යාමට වූ බව කවුරු පිළිගනීද?



■ රෂ්නිකා ලියනගේ

# අනේ මට මගේ මැණික බේරගන්න උදව් කරන්න



ගිය සතියේ දවසක මට අහම්බෙන් වගේ කුරුණෑගල මහ ඉස්පිරිතාලෙට යන්න වුණේ අසනීපවෙලා ඉඳපු යාළුවෙක් බලන්න. දවල් දෙළහකුත් ගාණට යාළුවා බලලා රෝහල් කොරිඩෝව දිගේ ආපහු එනකොට ලස්සන කෙලි පොඩ්ඩක් වඩාගෙන ලොකු කල්පනාවක හිටපු ඉරෝෂ්ව මුණගැහුනා. හිතේ ලොකු වේදනාවක් හිරකරගෙන ඉන්න ඉරෝෂ් හැමෝම දිහා බැලුවේ කියාගන්න බැරි ලොකු කතාවක් තියනවා වගේ. ඉතින් එන ගමන පැත්තකින් තියලා ඉරෝෂ් එක්ක ටිකක් කතා කරන්න ඕන කියලා මට හිතුණා.

"මහත්තයා මට දුවලාම දෙන්නෙක් ඉන්නවා. මේ ඉන්නේ මගේ ලොකු දුව සෙනුල්යා. අසනීපෙන් ඉන්නේ..."

අහන්න ගිය ප්‍රශ්නය දැනගෙනමද මන්දා ඉරෝෂ් මට එහෙම කිව්වා. ඒත් මං හිතුවේ පොඩි එකීට මේ දවස්වල තියෙන වෛරස් උණක් හැදිලා ඇති කියලා. එහෙම හිතලයි සෙනුල්යාගේ ඔලුව අතගාලා මං එතැනින් එන්න ආවේ.

"දුවට මහා තැලසීමියාව..."

ආපහු එන්න ඉහළට ගත්තු පය එහෙමම බිම පතිත වුණේ හරියට හෙණයක් ගැහුවා වගේ. මොකද එච්චර දරුණු අසනීපයක් මං ඒ පුංචි මූණේ දැක්කේ නෑ.

"මාසයක් ගානේ දුවට ලේ දෙන්න ඕනේ. අද ආවේ ඒකට. නෝනත් ඇතුළේ ඉන්නවා."

සෙනුල්යා ජයපත්ම දුවට තාම වයස අවුරුදු 3යි මාස 7යි. ඇයට උපතින්ම මහා තැලසීමියාවලු. ඔවුන්ගේ පදිංචිය කොටවෙහෙර, නිකවැරටියේ. ඉරෝෂ් මධුරංග ඔය විස්තර ටික මට කියන අතරෙ තමයි සෙනුල්යාගේ අම්මා නදීකා මුනිදාසත් රිපෝට් වගයක් අතින් කටින් අරගෙන එතැනට ආවේ.

"ඉපදිලා ටික දවසක් කිසිම අසනීපයක් නැතුව හිටියා. ඒත් එකපාරටම දුව කහ ගැහුනා. පස්සේ අපි බයවෙලා ඉස්පිරිතාලේ එක්ක ගියා. ඒ ගියාම ලේ එකක් බලලා කිව්වා ලේවල හිමොග්ලෝබින් අඩුයි කියලා. පස්සේ කුරුණෑගල ඉස්පිරිතාලේ තව පරීක්ෂණ වගයක් කළා. එතැනදි දුවට තියෙන්නේ මහා තැලසීමියාව කියලා ඔප්පු වුණා."

දන්නවද එදා ඉඳන් මාසයක් ගානේ සෙනුල්යා දුවට පිටින් ලේ දෙන්න ඕනෙලු. මොකද තැලිසීමියාව කියන්නේ ලේවල තියෙන හිමොග්ලොබින්වල ප්‍රෝටීන කොටස විදියට සැළකෙන ග්ලොබින් නිෂ්පාදනය අඩුවීම හින්දා ඇතිවෙන රක්තහීනතා තත්ත්වයක්නේ. ඒ විතරකුත් නෙවෙයි, එහෙම ලේ දෙන ගානේ ශරීරයේ තැන්පත් වෙන යකඩත් දවස ගානේ අයින් කරන්න ඕනෙලු.

"කුරුණෑගල ඉස්පිරිතාලෙදි තමයි මාසෙකට සැරයක් දුවට ලේ දෙන්නේ. තැන්පත් වෙන යකඩ අයින් කරන්නේ අපි ගෙදරදි. ඒකට වෙනම පොඩි මැෂින් එකක් තියෙනවා. ඒක දුවගේ බඩට හයිකරලා පෙකනිය ගාවට කට්ටක් ගහලා බෙහෙතක් විදින්න තියෙන්නේ. ඊටපස්සේ උදේට මුත්‍රා එක්ක යකඩත් පිටවෙනවා. අවුරුද්දේ දවස් තුන්සිය හැටපහම අපි ඒක කරන්න ඕනේ. ඒක ඉතින් මගේ දරුවට ලොකු වේදනාවක්."

වෛද්‍යවරු කියන විදියට සෙනුල්යා දියණිය සුව කරන්න නම් ඇයට ඇටමිදුලු බද්ධ කරන්න ඕනෙලු. ඒත් රජයේ රෝහල්වල නොමිලේ ඒක කරන්න පහසුකමක් නෑනේ. ඒ නිසා ඉරෝෂ්ලට නදීකලාට ඒක කරන්න වෙලා තියෙන්නේ පෞද්ගලික රෝහලකින්. වෛද්‍යවරු කියන විදියට ඒකට යන වියදම ලක්ෂ 130ක් විතරලු.

"එන දෙසැම්බර් මාසේ දුවට ඇටමිදුලු බද්ධ කිරීමක් කරනවා. ඒත් තවමත් අපි සම්පූර්ණ මුදල හොයාගෙන නෑ. මං වැඩ කරන්නේ නාවික හමුදාවේ. වයිෆ් දැනට සංවර්ධන නිලධාරිනියක් විදියට වැඩ කරනවා. ලක්ෂ 130ක් කිව්වට හැමදේම කරද්දි ලක්ෂ 180ක් වගේ වෙයි කියලයි අපි හිතන්නේ. මොකද ඇටමිදුලු බද්ධ කළාට පස්සේ මාස හයක් යනකල් සැත්කම කරන රෝහලට විනාඩි 10කින් යන්න පුළුවන් දුරින් කොළඹ අවට තැනක නතර වෙන්න ඕනේ. කුලී නිවසක තමයි නතරවෙන්න වෙන්නේ. අපි තැනක් බැලුවා මාසෙට 50,000යි කිව්වා. ඒ වගේමයි ඒ කාලෙදි දුවට විෂබීජ නොයා හොඳට බලාගන්න ඕනේ. ඒ හැමදේටම ලොකු වියදමක් දරන්න වෙනවා. එච්චර ලොකු මුදලක් හොයාගන්නේ කොහොමද කියලා අපිට තේරෙන්නේ නෑ. ඉතින් හැමෝගෙන්ම ඉල්ලන්න තියෙන්නේ අනේ මට මගේ මැණික බේරගන්න උදව් කරන්න කියලා තමයි."

ඉරෝෂ් තැන නොතැන නොබලාම එහෙම කියලා සංවේදී වෙනකොට ඉබේටම වගේ මගේ ඇස් දෙකත් තෙත්වෙලා ගියා. මේත් එක්ක පළවෙන සෙනුල්යා දුවගේ ෆොටෝ එක දැක්කම ඔබේ ඇසුත් ඉබේම තෙත්වෙයි. ඉතින් මේ පුංචි කෙලි පොඩ්ඩ වෙනුවෙන් අපිත් පුළුවන් හැටියකට උදව්වක් කරමු. මේ වෙලාවේ ඔබ දෙන රුපියල් පනහ, සීයත් ඉරෝෂ් කියන විදියට ඔවුන්ට මහමෙරක්. ඉතින් කතා කරලා බලන්න. 0770229367 තමයි සෙනුල්යා දුවගේ අනාගතය ලියැවිලා තියෙන නොම්බරේ.

■ රුවන් එස්.සෙනවිරත්න



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**



# ‘කතා කරන ගණ දෙවියන්’ නිවසට වඩම්මන්න රුපියල් මිලියනයක් ඉල්ලලා

## සාමි, ගයාත්‍රි මන්ත්‍ර සජ්ඣායනා කරමින් හෝරා කිහිපයක් ගත කළාට පස්සෙ ගණදෙවි පිළිරුවේ මුවට පණ ඇවිත්, කතා කරන්න පටන්ගන්නවා

අවශ්‍ය ඕනෑම වේලාවකදී කතා කරවිය හැකි ගණදෙවි ප්‍රතිමාවක් පිළිබඳ විශ්වාසයක් අගනුවර ඉහළ පැලැන්තියේ පිරිස් අතර පැතිරයමින් තිබෙන බවට පසුගියදා අසන්නට ලැබිණි. ඒ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන (නාරා) ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාගර විද්‍යාඥ ආචාර්ය කේ.අරුලානන්දන් වෙතිනි. හින්දු ආගමෙහි පවතින දර්ශනික සහ සදාචාරාත්මක බව පමණක් පිළිගන්නා හින්දු භක්තිකයෙකු වන ඔහු හින්දු ආගම අනිසි ලෙස භාවිතා කරමින් ජාවාරම්කරණයේ යෙදෙන්නවුන් කෙරෙහි දැඩි නොසතුටකින් පසුවන්නෙකි. හින්දු ආගමේ වැදගත් දෙවි කෙනෙකුන් වන ගණ දෙවියන් මුල්කොට සිදුකෙරන මෙම කාර්යය සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමසා ඒ සම්බන්ධයෙන් පුවත්පත් ලිපියක් සම්පාදනය කරන මෙන් ඔහු ම’වෙතින් ඉල්ලා සිටියේ ඒ අනුවය.

එබැවින් ආචාර්ය අරුලානන්දන් දුන් හෝඩුවාව ඔස්සේ කරුණු විමසූ මට ඒ සම්බන්ධයෙන් ඔබට ලිවීමට තරම් ප්‍රමාණවත් කරුණු උකගාගත හැකි විය.

මේ ප්‍රාතිහාර්ය බලය සහිත ගණදෙවි පිළිරුව ගෝවින්ද සාමි යනුවෙන් හැඳින්වෙන අයකු සතු වූවකි. කලක් තිස්සේ ඉන්දියාවේ හින්දු යෝගාශ්‍රමයක ධ්‍යාන වඩමින් සිටි ඔහුට එපින් බලයෙන් ඒ දේව ප්‍රතිමාව ලැබී ඇතැයි ඔහුගේ අනුගාමිකයෝ විශ්වාස කරති. උපතින් ශ්‍රී ලාංකික දෙමළ ජාතිකයකු බව පවසන ඔහු කලක් කැනඩාවේද ජීවත් වී තිබේ. ඔහු මුල්වරට මෙම කතා කරන ගණදෙවි ප්‍රතිමාව එහි වෙසෙන ශ්‍රී ලාංකිකයන් හමුවට රැගෙන විත් ඇත්තේ ඒ කාලයේය. එහිදී මෙම ගෝවින්ද සාමිගේ අනුගාමිකයන් බවට පත්ව ඇත්තේ එහි වෙසෙන දෙමළ ජාතික හින්දු භක්තිකයන් පමණක් නොවේ. හින්දූන් නොවන දෙමළ භක්තිකයන්, එහි වෙසෙන සිංහල බෞද්ධ, කතෝලික ආදී විවිධ පිරිස්ද මෙම කතා කරන ගණදෙවි ප්‍රතිමාවේ හාස්කම් දැක මෙම පුද්ගලයාගේ වසඟයට පත්ව තිබේ.

ගෝවින්ද සාමිගේ අනුගාමිකයන් විශ්වාස කරන අන්දමට ඔහු සතු මෙම හාස්කම් ගණදෙවි ප්‍රතිමාව කිසියම් නිවෙසකට වඩමවා එහිදී ඊට නිසි පුද පිළිවෙත් සිදු කළහොත් එම නිවසටත්, එහි වෙසෙන්නවුන්ටත් එම පූජාවට එක්වන්නවුන්ටත් සියලු යසඉසුරු පහළ වෙයි. එහෙත් මේ වනවිට අගනුවර ආසන්නයේ සුපිරි නිවාස සංකීර්ණයක වෙසෙන මෙම ගෝවින්ද සාමි නිවසකට වැඩමවා ගැනීම එසේ ආවාට ගියාට කළ නොහැක. අඩුම වශයෙන් ඒ සඳහා රුපියල් මිලියනයකවත් මුදලක් ඔහුට ගෙවිය යුතුය. ගණ දෙවියන් උදෙසා පැවැත්වීම පිණිස ඔහු විසින් නියම කරන ලද පුද පූජාවන්හි පූර්ව සංවිධාන කටයුතුවල සිට ඒවා පැවත්වීම දක්වා ඊට ආසන්නතම මුදලක් වැය කිරීමට එම නිවැසියන්ට සිදුවේ. එම නිවස පිළිසකර කිරීම ආදියද එකී පූර්ව පුද පූජාවලට අයත් බව පැවසෙයි.

මා වෙත ගොනු වූ තොරතුරු අනුව මෙම ගෝවින්ද සාමි විසින් එම ගණදෙවි පූජාව අරඹනුයේ කලින් නිශ්චය කරගත් දිනයෙක සන්ධ්‍යා භාගයේය. ඔහු එසේ පුද පූජා පවත්වමින් ගයාත්‍රි මන්ත්‍ර සජ්ඣායනා කරමින් හෝරා කිහිපයක් ගත කළ පසු එම ගණදෙවි පිළිරුවේ මුවට පණ විත් එහි සිටින්නවුන් මධ්‍යයේම එම පිළිරුව කතා කිරීමට පටන්ගනී. එහිදී එම පූජාවට සහභාගී වන්නවුන්ට ඇත්තේ තමන්ගේ සිත් තුළ පොදි ගැසී ඇති පැතුම් අභිලාෂයන් තදින් සිත තුළ ධාරණය කරගෙන ගණ දෙවිඳුන් යැදීම පමණි. එවිට ඒ පැතුම් අභිලාෂයන් එලෙසම ඉෂ්ඨ සිද්ධ වේ. නමුදු යම්කිසි කෙනෙකු එසේ කළ යුත්තේද ඒ පූජාව සඳහාද හැකි උපරිම අයුරින් මුදල් ප්‍රදානයක් කරමිනි.

ඒ සම්බන්ධයෙන් මා කළ විමසුමේදී ගණදෙවි පිළිරුව කතා කරනු සියැසින් දැකගත් කාන්තාවකගෙන් තොරතුරු අසා දැනගැනීමටද හැකි විය. ශරීරයේ අත්පාවල ඇඟිලි ආදියේ සිට මළසිරුරක මෙන් කළු පැහැ ගැන්වී ඇතැම් විට අවසානයේ ඒවා කපා දැමීමට පවා සිදුවන ගැන්ග්‍රීන් (Gangrene) නම් රෝගයෙන් පසුවූ ඇය දිගුකලක් ඔස්ට්‍රේලියාවේ පදිංචිව සිට පසුගිය කාලයේ මෙරටට පැමිණි හතළිස්පස් වියැති කාන්තාවකි.

“මේ වගේ අසනීප කිසිම බේතක් නැතුව සනීප කරන්න පුළුවන් බලයක් ඒ ගෝවින්ද සාමිට තියෙනවා කියලා මං දන්න සමහරු තදින්ම විශ්වාස කරනවා. ඒ හින්දයි මම මගේ මහත්තයාගේ හොඳම යාළුවෙකුගේ ගෙදර තිබුණු ඒ සාමිගේ ගණදෙවි පූජාවකට සම්බන්ධ වුණේ. එයාලත් සිංහල බෞද්ධ. ඒත් ඔය වගේ හාස්කම් ගැන ලොකු විශ්වාසයක් එයාලගේ හිත්වල තියෙනවා.” එම කාන්තාව කීවාය.

“කොහොමහරි ඒ සාමි පූජාව පටන් අරන් ඒ ගණදෙවි ස්තෝත්‍ර වගේ දේවල් කියනකොට අපේ ඇඟවලුත් හිරි වැටීගෙන යනවා අපිට හොඳටම දැනෙනවා. ඒ එක්කම සැරින් සැරේ අපිව අහසේ පාවෙනවා වගේත් දැනෙනවා. කොහොමහරි පැය තුන හතරක් ඒ විදියට පූජාව තියලා අපි හැමෝටම පේන්න සාමි සාලෙ මැද්දේ බොහොම ගරුසරු ඇතුව වඩා හිඳුවලා තියෙන අඩි දෙකක් විතර ඇති ඒ ගණදෙවි පිළිමේ ළඟට ගිහින් හීන්සැරේ කණ ඒ පැත්තට කිට්ටු කරනවා. එතකොට ඒ පිළිමෙන් මහා අමුතුම ගැඹුරු හඬකින් ‘ඕ... ම්... ම්... ම්...’ වගේ සද්දයක් එනවා. ඒක ඇහෙනකොට අපිට හොඳටම තේරෙනවා අපි මොකක්හරි කළුවරකින් මිදිලා ආලෝකයකට ළංවෙනවා කියලා.” ඒ කාන්තාව කීවාය.

නමුදු මෙහිදී ඉතා පැහැදිලි ලෙසම කිව යුත්තක් තිබේ. එනම් එම පුද්ගලයා ගණදෙවි පූජාවේ නාමයෙන් එහි සිටින්නුවන් අර්ධ මෝහන තත්ත්වයකට පත්කොට ඔවුන්ගේ මනැස්වල ඇති බර ගතිය සැහැල්ලුකොට ඇති බවය. ඉන්පසුව එහි උපරිම අවස්ථාවේදී ගණදෙවි පිළිරුව වෙතට සවන් යොමුකොට හිඳින අතරේ එම ‘ඕ... ම්’ නාදය නිකුත් කරනුයේද ඔහු බව කිසිවකුටත් නොහැඟේ. අත් රූකඩ හසුරුවන්නවුන් නරඹන්නන් කුල්මත් කරමින් අත් රූකඩය සමඟ කතා කරන බව අඟවමින් අන්‍යයන්ට නොහැඟෙන සේ මෙලෙස කතා කිරීමේ කලාව හැඳින්වෙනුයේ ඉන්ද්‍රජාල කථනය (Ventriloquism) යනුවෙනි. ඒ අනුව ඔහුද සුපිරි ගණයේ ඉන්ද්‍රජාලකරුවකු බව පෙනේ.

ඒ කෙසේ හෝ මෙම ගෝවින්ද සාමිගේ දෙමළ භාෂා උච්ඡාරණ ශෛලිය අනුව ඔහු සැබෑ දෙමළ ජාතිකයකුද යන්න පිළිබඳවද සැක උපදින බව තම විද්වත් දෙමළ මිතුරන් තමන් හා කී බවද ආචාර්ය අරුලානන්දන් මා හා කීය.



සමලිංගිකත්වය මානසික රෝගයක් හෝ අස්වාභාවික තත්ත්වයක් නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් අර්ථ දක්වා තිබුණද අපේ රටේ බහුතරය තවමත් ඒ ගැන පිළිගන්නට සූදානමක් නැත. ලෝකයේ බොහොමයක් රටවල් 'සමලිංගිකත්වය' සාමාන්‍ය දෙයක් වුවද අදටත් අපේ රටේ බහුතරයක් ඒ පිළිබඳව දරන්නේ පටු මතවාදයන්ය. එනිසාම සමලිංගික දරුවන්ව පවුල්වලින් පිටමං කරන්නට දෙවරක් නොසිතූ දෙමාපියන්ගේ කතාද අපේ රටේ සුලබය. බරපතළ අපරාධකරුවන් පවා තමන්ගේම දරුවන් ලෙස පිළිගත්තත් තම ලෙයින් ජාතක වූ දරුවෙකු සමලිංගිකයකු වීම අපේ රටේ දෙමාපියන්ට ඉවසිය නොහැකි කරුණකි.

"එංගලන්තෙදි අරිතට ඩේවිව මුණගැහිලා. ජීවිතේ ඉතිරි කාලය Husband සහ Husband විදියට ගත කරන්න ඒ අය තීරණය කරලා තිබුණා. ඒ දෙන්නගේ විවාහයට සහභාගී වෙන්න මම එංගලන්තෙට ගියේ ඉතාම සතුටින්."

ලිංගික අනන්‍යතාව කෙසේ වුවත් තමන්ගේ දරුවාව ඒ අයුරින්ම පිළිගන්නා අම්මා කෙනෙකු සමලිංගික විවාහකට ඇතුළත් වූ ඇගේ පුතුගේ වසරක විවාහ සංවත්සරය වෙනුවෙන් තැබූ ෆේස්බුක් සටහනකින් උපුටාගත් කොටසකි මේ. එසේ ලියූ අම්මාගේ නම රේණුකා වික්‍රමසිංහ ය. ඇය ප්‍රකට නීතිඥ අරිත වික්‍රමසිංහගේ මවයි. වෙනස් අම්මා කෙනෙකු ලෙස ඈ තැබූ වෙනස් සටහන නිසාම අපටද ඇයට කතා කරන්නට සිත්විය. මේ රේණුකා වික්‍රමසිංහ සමඟ අප කළ එම සංවාදයේ සටහනයි.

# පුංචි කාලෙත් කාර්වලට වඩා පුතා වැඩිපුර කැමති වුණේ බෝනික්කන්ට

## පුතුගේ සමලිංගික විවාහයේ සංවත්සරය දා මවක් තැබූ සටහනක්

**බහුතරයක් දෙමාපියන් සමලිංගික දරුවන් ප්‍රතික්ෂේප කරන සමාජයක ඉඳගෙන ඔය වගේ ෆේස්බුක් සටහනක් තියන්න දෙපාරක් හිතන්න ඕනේ කියලා හිතුණේ නැද්ද?**

නැහැ. මම කිසිම වෙලාවක සමාජයට බයේ සමාජය මොනවා හිතයිද කියලා වැඩ කරපු අම්මා කෙනෙක් නෙමෙයි. මම හිතන්නේ දරුවන්ගේ සතුට ගැන විතරයි. මම මේ සටහන තිබ්බේ මගේ දරුවට සුබ පතන්න හිතාගෙන විතරක්ම නෙමෙයි, තවත් අම්මා කෙනෙක්ට තාත්තා කෙනෙක්ට මේක ආදර්ශයක් වෙයි කියලත් මට හිතුණා.

**අරිත පුතා වෙනස් දරුවෙක් කියලා අම්මට දැනුණේ කොයි කාලෙද?**

මට පුත්තු තුන්දෙනෙක් ඉන්නවා. දෙවැනියා අරිත. අම්මා කෙනෙක් විදියට මම දරුවෝ තුන්දෙනාටම සැලකුවේ එකම විදියට. හැබැයි අනිත් පුතාලා දෙන්නට වඩා අරිත පුතා වෙනස් කියලා එයාට අවුරුදු 4-5ක් වෙද්දිම මට දැනුණා. පුතාලා තුන්දෙනාම ගියේ එකම ඉස්කෝලෙට. ඒක මිශ්‍ර පාසලක්. හැබැයි අනිත් පුතාලට වඩා අරිතට හිටියේ ගැහැනු යාළුවෝ. අනිත් දෙන්නා වගේ අරිත කාර්වලට කැමති වුණේ නැහැ. පුංචි කාලේ අරිත කැමති වුණේ බෝනික්කන්ට. අයියයි මල්ලියි නිතරම රණ්ඩු සරුවල් කළත් මෙයා ඒවට සම්බන්ධ වුණේ නැහැ. ටිකක් ලොකු වෙද්දි වුණත් අරිත වැඩිපුරම කතා කළේ ලංකාවේ ගැහැනුන්ගේ අයිතිවාසිකම් ගැන. ඔය දේවල් එක්ක පුතාගේ විදිය වෙනස් කියලා මම තේරුම්ගත්තා.

**තමන් වෙනස් කියලා අරිත පුතා අම්මා එක්ක කියලා තියෙනවද?**

ඔව්. කැම්පස් යන කාලෙදි පුතා මාත් එක්ක කතා කළා. එයා අනිත් අයට වඩා වෙනස් කියලා කිව්වා. ඕක පුතාගේ ජීවිතේ, පුතා කැමති විදියට පුතාට සතුටු හිතෙන දේවල් කරන්න කියලයි එදත් මම එයාට කිව්වේ.

**දරුවෙක් ඔය වගේ කාරණයක් බය නැතිව අම්මා කෙනෙක් එක්ක කතා කරන්නේ එහෙම කතා කරන්න පුළුවන් තැනක් එතැන තිබුණ නිසානේ. නේද?**

ඔව්. අරිත පුතාගේ වෙනස අඳුරගත්තු ද ඉඳලා මම ඔය කාරණාව සම්බන්ධයෙන් සෑහෙන දේවල් හෙව්වා. පොත්, පත්තර කියවලා දැනුවත් වුණා. කවදාහරි පුතාට ඕන උත්තරය මොකක්ද කියලා මම දැනගෙන හිටියා. ඒ වගේම තමයි පුංචි කාලේ ඉඳලා දරුවෝ තුන්දෙනා එක්ක මම නිතරම කතා කරනවා. එයාලගේ කැමති අකමැති දේවල් ගැන අහනවා. පුතාලට මම හිටියේ යාළුවෙක් වගේ. ඉතින් ඔය වගේ දෙයක් වුණත් මාත් එක්ක කෙළින්ම කතා කරන්න සුවපහසුවක් පුතාට තිබුණා.

**අම්මලා පිළිගත්තත් LGBTQ (සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව) දරුවන්ව පිළිගන්න ගොඩක් තාත්තලා කැමති වෙන්නේ නැහැ. ඉතින් ඔතැනදි අරිතගේ තාත්තාගේ මතය වුණේ මොකක්ද?**

අරිත පුතාගේ තාත්තත් බොහොම විවෘතව සමාජය දිහා බලන කෙනෙක්. අරිතගේ ජීවිතේ ගතවෙන්න ඕන ඔහුගේ කැමැත්ත මත කියලා තමයි ඔහුත් කිව්වේ. අර කිව්වත් වගේ ගොඩක් ගෙවල්වල මේ දරුවන්ට විරුද්ධ වෙන්නේ තාත්තලා. එතකොට අම්මලාත් අසරණ වෙනවා. හැබැයි අම්මා කෙනෙක් දරුවා වෙනුවෙන් කෙළින් හිටගෙන ඉන්නවා නම් වෙනත් කිසිම කෙනෙක්ට කිසිම දෙයක් කරන්න බැහැ.

**අරිතගේ විවාහ ගැනත් ටිකක් කතා කරමු?**

අරිතට ඩේවිව මුණගැහුනේ එංගලන්තෙදි. විවාහ වෙන්න අවුරුද්දකට කලින් අරිත මට ඩේවි ගැන කිව්වා. විවාහයට කලින් මම ඩේවිව මුණගැහිලාත් තියෙනවා. දෙන්නා බැන්දේ එංගලන්තෙදි. ඒ විවාහයට මම එංගලන්තයට ගියේ බොහොම සතුටින්.

**අරිතගේ විවාහය ඒ දවස්වල ෆේස්බුක්වල එහෙමත් ලොකුවට කතා වුණා. දන්න කියන නෑයෝ, යාළුවෝ විවාහය ගැන දැනගෙන මොකද කිව්වේ?**

වෙඩින් එක කියන්න කලින් පුතා මේ විදියේ විවාහයක් කරගන්නවා කියලා මම මගේ නෑයන්ට, යාළුවන්ට කිව්වා. ඒ කිව්වට පස්සේ සමහරු 'රේණුකා කොහොමද අනේ ඔයා පාරේ බැහැලා යන්නේ? මිනිස්සුන්ට මුණදෙන්නේ කොහොමද? ලැජ්ජයි නේද?' කියලා එක එක කතා කිව්වා. මගේ දරුවගේ සතුටට වඩා වෙනින් කිසිම දෙයක් මට වටින්නේ නැහැ කියලා එහෙම කියපු උදවියටත් මම පැහැදිළි කළා. හැබැයි සෘණාත්මක දේවල් කිව්ව අය විතරක් නෙමේ ඇත්තටම හොඳ අම්මා කෙනෙක් කියලා මට ප්‍රශංසා කළ අයත් හිටියා.



ජීවිතේ ඉතිරි කාලය Husband සහ Husband විදියට ගත කරන්න ඒ අය තීරණය කරලා තිබුණා. මම ඒ දෙන්නගේ විවාහයට ගියේ ඉතාම සතුටින්

ඩේවිඩ් මව-රේණුකා අරිත

**අරිතගේ විවාහයට දැන් අවුරුද්දකුත් ගතවෙලා. ඒ දෙන්නා සතුටින් ජීවත්වෙනවද?**

ඔව්. අරිතයි ඩේවියි එංගලන්තේ බොහොම සතුටින් ජීවත්වෙනවා. දෙන්නා නිතරම ලංකාවටත් එනවා. ඩේවි පුතාත් මට හරි ආදරෙයි. ඒ දෙන්නා හරි ආදරෙන් සතුටෙන් ඉද්දි අපිටත් ගොඩක් සතුටුයි.

**රේණුකා පුතාගේ සතුට ගැන හිතුවට ඔය කාරණේදී ගොඩක් දෙමාපියෝ ගන්නේ බොහොම තද තීරණ නේද?**

මේ වගේ දෙයක් දැනගත්තු හැටියේ බහුතරයක් දෙමාපියෝ කලබල වෙනවා. සමාජය මොනවා හිතයිද කියලා තමන්ගේ දරුවන්ව ගෙයින් පිටමං කරපු අම්මලා ඉන්නවා. එහෙම පාරට වැටිලා ජීවිත නන්නත්තාර කරගත්තු දරුවෝ ඉන්නවා. අම්මෙක් තාත්තෙක් තමන්ගේ දරුවට දෙන ආදරයට ගැහැනුද, පිරිමිද, සමලිංගිකද යන කාරණා ආදළ වෙන්නේ කොහොමද? තමන්ගේ දරුවට වඩා බාහිර සමාජය හිතන දේ වැදගත් වෙන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ.

**අරිතගේ අම්මට එහෙම අයට කියන්න පණිවිඩයක් තියෙනවද?**

ලෝකේ මිනිස්සු මොනා කියයිද කියන දේ මායිම් නොකර හිතට එකඟව අරිත ගත්තු මේ තීරණය ගැන මම ගොඩක් සන්තෝසයි. බහුතරයක් දෙමව්පියෝ තමන්ගේ පරම්පරාවේ මාන්නේ රැකගන්න තමන්ගේ දරුවන්ගේ සතුට බිල්ලට දෙනවා. දුක් මහන්සි වෙලා උස්මහත් කරපු ඒ දරුවන්ව නොගැළපෙන කසාදවල හිර කරලා කුඩු කරනවා. ඒකෙන් වෙන්නේ ඒ දෙපාර්ශවයම අගතියට පත්වෙන එක විතරයි. එහෙම කරන දෙමාපියන්ගෙන් ඉල්ලන්න තියෙන්නේ එක දෙයයි. අපි දරුවෝ හදන්න ඕනේ ලොකුවෙලා තටු ගහලා පියාඹලා යනවා ආසාවෙන් බලන්න, අපේ ජීවිත එළිය කරන්න මිසක අපේ පරම්පරාවල නම්බුව ආරක්ෂා කරන්නම නෙමේ. ඒ නිසා සමාජය මොනා හිතයිද කියලා හිතන්න කලින් දරුවන්ගේ සතුට ගැන හිතන්න. එහෙම දරුවන්ව කවදාවත් ගෙවල්වලින් එළියට දාන්න එපා.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




| | | | | | |
|---|---|---|---|---|---|
| පාසැල් යන වියේ කොල්ලන් හට | කිඹුලී | කවදත් මම තමයි ගමටම | හැඩකාරී | හොඳට හොඳයි නරකට ඊටත් | හොඳය |
| එක කුස උපන් මල්ලිට කවදත් | නපුරී | රූ සපුවට නොදෙවෙනි හොඳ | කවිකාරී | කවියෙන් මිසක වෙන දෙඩමලු මට | බැරිය |
| කිසිදු තිබී නැති මුත් ඔය ගති | ඔමරී | කවියන් දෙඩමු අපි පෙම්බස් නැත | කාරී | ඇරයුම් කරමි වාදෙට කවියයි | අවිය |
| උප්පැන්නේ හැටියට මගෙ නම | කොමලී | නොපැකිළ එහෙව් එකෙකුට මම වෙමි | හාරී | හැප්පිල බලමු එහෙනම් කවියෙන් | හරිය? |

**ඔබේ කවි අභියෝග**

කොමලිගේ කොලමට එවීමේදී 0712808985 හෝ dharanee.editor@liberty.lk යන ඊමේල් ලිපිනයට යොමු කරන්න.
නැතිනම්,
කොමලිගෙ කොලම, ධරණී පුවත්පත, නො.91, විජේරාම මාවත, කොළඹ 07. යන ලිපිනයට එවන්න

## කෙටි කතාව

# මගේ කෙල්ලට කතා හදන්න හදද්දි මම සිල් රකින්නෙ කොහොමද?

ගිය සිකුරාද අපේ කාර්යාලයේ උත්සවයක් සංවිධානය කර තිබුණි.

එය අවසන් වනවිට රෑ නමය හමාර පසු වූ අතර කාර්යාලයේ මිතුරෙකු මා නිවසට ඇරලවීමේ කාර්යය භාරගත්තේය. ඔහු මාව නිවස අසළින්ම බැස්ස වූ අතර මම ඔහුට ස්තූති කර නිවසට පිය මැන්නෙමි. එහා ගෙදර නන්දනී නැන්දා එය බලා සිටි බව මට එවෙලේ මොහොතකටවත් සිතුනේ නැත.

ඊළඟ දිනයේ උදෑසනම ඇය මගේ අම්මා හමුවන්නට පැමිණ තිබුණේ මා ගැන ඇති වූ මහත් වූ කරුණාව නිසාය.

**"කෙල්ල ගැන ටිකක් ඇහැ ගහගෙන හිටපන් ඕලු අක්කේ. නැත්නම් පස්සේ පසුතැවෙන්න වෙයි."** ඇය කියද්දි මගේ නිදිමත නැති විය.

**"ඒ මොකද එහෙම කියන්නේ?"** මගේ අම්මා අසනවා ඇසුණි.

**"කෙල්ල මහ රෑ කාර් එකකින් ඇවිල්ලා බහිනවා මම බලාගෙන. ගෑනු ළමයෙක්ට වැරදුනොත් ඉතින් ආයෙ ජීවිතේම ඉවරයිනේ."**

නන්දනී නැන්දා කියද්දී මම කෝපයෙන් ඇඳ මත වාඩි වූයෙමි.

**"කෙල්ලට ඔෆිස් එකේ වැඩක් තිබිලා රෑ වෙනකම්. ගෙනල්ල බස්සපු එක කොච්චර දෙයක්ද?"** අම්මා උත්සවයේ කතාව හිතාමතාම වසන් කරන බව මට දැනුණි.

**"ආ ඒ කියන්නේ ඕලු අක්කත් මේ විස්තරය දන්නවද? මම මේ අපේ පුතාටත් කිව්වා ඉක්මනට ෆොටෝ කෑල්ලක් ගහගනින් කියලා. ඌ මට බැනලා අනිත් පැත්ත හැරිලා නිදාගත්තා."** නන්දනී නැන්දා තවත් කියනවා ඇසිනි.

**"ෆොටෝ එකක්? ඒ මොකටද ෆොටෝ එකක් ගහගන්න හැදුවේ?"** අම්මාගේ කටහඬටද යම් ආවේගයක් එකතු වී ඇති හැඩය.

**"නැහැ ඉතින් මම හිතුවේ උඹ මේ ගැන දන්නෙ නැතුව ඇති කියලා. උඹට ඔප්පු කරලා පෙන්නන්න ඕනෙ වුණේ"** ඈ පැවසුවාය.

**"මගෙ කෙල්ලෙ යන එන තැන් ගැන මම දන්නවා. උඹ ඒවා ෆොටෝ ගහගෙන මට ඔප්පු කරන්න ඕනෙ නැහැ."** අම්මාගේ කටහඬට එන්න එන්නම කෝපය එකතු වන බව මට දැනිණි.

**"ඕලු අක්කේ මම මේ කියන්නේ උඹේ කෙල්ලගේ හොඳට. ඔය ඉතින් අපි පොඩි කාලේ වඩාගෙන හදපු දරුවෝනේ. අපේ කාලෙ ඔහොම නරි නාඩගම් තිබුණෙ නැහැනෙ. අපේ කාලේ අපි ගියාද ඔහොම රෑ ජාමේ අනුන්ගේ කාර් බාර් වල?"**

නන්දනී නැන්දා යළි ඇසුවාය.

අද නම් ඇය අම්මගෙන් හොඳ හැටි අහගන්නවා සිකුරුය.

**"අපේ කාලේ කොහෙද බං නන්දනී කාර් තිබුණේ? මුළු ගමටම කාර් දෙකයි. ගම්මුලාදෑනි මහත්තයටයි ඉස්කෝල මහත්තයාටයි."** අම්මා කීවාය.

ඇයට බැණ වැදී එළවන්නට තරම් ආවේගයක් මට දැනුණි.

**"දැන් ඉතින් ඔය නන්දනී නංගි කියන්න හදන්නේ රෑ තිස්සේ ගමනක් බිමනක් යනවා කියන එකේ තේරුම වැරදි දෙයක් සිද්ධවෙනවා කියන එකද? එහෙමද දැන් ඔය කියන්න හදන්නෙ?"** අම්මා අසනවා මට ඇසුනි.

මම මගේ වේගය මදක් බාල කළෙමි.

**"ඔව් ඉතින්. එහෙමනේ. ඔය මහ රෑ කළුවරේ කාටද පේන්නෙ මොනවා වුණත්."**

**"මෙහෙමයි නන්දනී. ඔය වැඩේ රෑ වුණත් දවල් වුණත් කරන්න බැරි වැඩක් නෙවෙයිනේ. නන්දනී ඒ කාලේ හවස හයෙන් පස්සේ ගෙදරින් එළියට ගියේ නැතුව ඇති. හැබැයි මතක නැද්ද උදේ පාන්දර වතුර ගේන්න කියලා කලෙත් අරගෙන ගිහිල්ලා අර ගලකට මුවාවෙලා සිරිදාස එක්ක නන්දනී ඉන්නවා දැක්කා කියලා ඇසිලින් ආච්චි ගම වටේටම කිය කියා ගියා?"**

අම්මා අසද්දී මට බකස් ගා හිනාවක් පැන්නේය.

**"ඒ ඇසිලින් ආච්චිගේ බොරු කතානේ. ඒ කාලේ උඹමනේ ඕලු මට කිව්වේ ඕවා ගණන් ගන්න එපා කියලා. ඇයි දැන් ඔය පරණ දේවල් මතක් කරන්නේ?"** ආපහු නන්දනී නැන්දා ඇසුවාය.

**"ඔව් එදා මම උඹගෙ පැත්තට හිටියා තමයි. ඇසලින් නැන්දා උඹ ගැන කතා මුළු ගම පුරා පතුරද්දී මම උඹ වෙනුවෙන් පෙනී හිටියා තමයි. හැබැයි උඹ මගේ කෙල්ලට කතා හදන්න හදද්දි මට සිල් රකින්න බැහැනේ. ඒකයි මම පරණ කතාව පොඩ්ඩක් මතක් කළේ. නන්දනියෝ අමතක කරන්න එපා ඒ අතීතය. ඒ කාලේ උඹයි මායි එකතු වෙලා ඇසිලින් ආච්චිට කොච්චර නම් බනින්න ඇතිද, අද උඹ කරන්නෙත් ඒ දේමයි නේද?"** අම්මා ඇසුවාය.

ඉන්පසු දිගු නිහඬතාවයක් පැතිරුණි. මේ වෙලාවේ විසිත්ත කාමරයට යන එක හරි මදි බව මට දැනුණු නිසා මම නැවතත් ඇඳට ගියෙමි.

**"මට සමාවෙයන් ඕලු අක්කේ මම ගිහින් එන්නම්."** අවසානයේ නන්දනී නැන්දා එසේ කියනවා මට ඇසුණි.




■ **සමාධි ඩයස්**

beauty



# සල්ලි එපා! නොවරදින වශී ගුරුකමක් නොමිලේ





ඕන් ඉස්සර රජරට වැව් ගම්මානවල තිස් බඹේ කියලා භූමි කොටසක් තිබ්බලු. ගමයි මුකලානයි වෙන්වෙලා තියෙන්නේ මේ කොටසින්. ගමේ මිනිස්සු හරකාබාන ගාල් කරන්න ඔය තිස් බඹේ පාවිච්චි කළා. ගව මුත්‍රා, ගොම වැටෙන නිසා ඔතැන බොහොම සරු සාරෙට පලා කාරිය වැවුණලු. හැබැයි ඒක නෙමේ වැඩේ. ගම් පළාතේ ඉන්න කෙලි ගැටිස්සියෝ දෙට්ට පිලට ගියෙත් ඔය තිස් බඹේටමලු.

ඕන් මේකයි කතාව. තිස් බඹේ වැවෙන පලා කොළවලින් මැල්ලුමක් හදලා ඒක පිටස්තර ඉලන්දාරියෙක්ට කන්න දුන්නහම අර කොල්ලා ඒ ගෙදර කෙලීට වශී වෙනවා කියලා පුරාතන විශ්වාසයක් තිබිලා. කෙලිගැටිස්සියෝ දෙට්ට පිලට යන නිසා ඔය වශියට කිව්වේ 'හුලිජ්ජ මැල්ලුමේ වශිය' කියලලු. ඉතින් සමහර බවලතියෝ පිටස්තර ගමකින් ඉලන්දාරියෙක් ආපුවාම තිස් බඹේ පලා නෙළලා ඒ උදවියට කන්න දෙනවලු. ඔය මැල්ලුම කන ගැටව් වරු තුනක් යන්න මත්තෙන් අර ළමිස්සිට දපනේ වැටුණාය කියලයි කියන්නේ.

ඔය හුලිජ්ජ මැල්ලුමේ වශියේ ඇත්ත නැත්ත ගැන අපි දන්නේ නැහැ. හැබැයි පලා මැල්ලුම්වලින් අනිත් උදවිය වශී කරගන්න පුළුවන් කියන එක නම් ඇත්තක්. ඒකට ඉතින් අනිත් උදවියට මැල්ලුම් කවන්න ඕනා නෑ ආයුබොවන්ඩ තමන් මැල්ලුම් කෑවමයි ගෑවහමයි ඇති. පලාවලින් ලස්සන වෙලා අනිත් උදවියව වශී කරගන්න පුළුවන් නොවරදින වශී ගුරුකම ගැනයි අද කියලා දෙන්නේ.

මැල්ලුම් කෑවහම ලස්සන වෙනවා, කොණ්ඩේ වැවෙනවා, නියපොතු හයිය වෙනවා කියලා අපිට මුලින්ම කියලා දුන්නේ වෙනින් කවුරුත් නෙමේ අම්මා. පලා ටිකක් කවාගන්න අම්මලාට පුංචි පැටවු පස්සේ කොච්චර නම් පන්නන්න වෙනවද.

බහුතරයක් පලාවල විටමින් A, D, C, B පොටෑසියම්, මැග්නීසියම්, යකඩ තියෙනවා. ඉතින් ඔය ගුණ නිසා දිනපතාම පලා වර්ගයක් අනිවාර්යයෙන්ම කන්න කියලනේ වෛද්‍යවරු පවා කියන්නේ.

පලා කෑවහම ශරීරයට හම්බෙන සෞඛ්‍ය ප්‍රතිලාභ අටෝරාසියක් තියෙනවා. හැබැයි අපි අද කතා කරන්නේ පලාවලින් ලැබෙන රූපලාවණ්‍ය වාසි ගැන. හැම කොළයක්ම අපේ සමට ගුණයි. හැබැයි සමට ගොඩාක්ම හිතමිතුරු පලා වර්ග කිහිපයක්ම තියෙනවා.

## මුරුංගා කොළ

මුරුංගා කොළවල විටමින් A,C, E, B6 වගේ ලස්සන වෙන්න අත්‍යවශ්‍ය පෝෂක කිහිපයක්ම තියෙනවා. ඒ විතරක් නෙමෙයි හමේ තියෙන ස්වභාවික තෙල්වලට (Sebum) සමාන රසායනික සංයෝගයක් මුරුංගා කොළවල තියෙනවා කියලා මේ මෑතකදී කරපු පරීක්ෂණයකින් හොයාගෙන තියෙනවා.

ඔය කියාපු ගුණ නිසා සමේ තෙතමනය වැඩි කරන්න මුරුංගාවලට පුළුවන්. ලප කැළැල් නැති පැහැපත් සමකට ආස නම් මුරුංගා කොළ එක්ක යාළුවෙන්න. හිසකෙස් වැටීම නතර කරන්න, කෙස් වර්ධනය කරන්න මුරුංගා පංකාදුයි. අද ඉඳලාවත් ඒ වැඩේ කරන්න එපා. වැඩිපුර මුරුංගා කොළ ආහාරයට ගන්න. නැත්නම් මුරුංගා තේ බොන්නත් පුළුවන්. මුරුංගා කොළ ටිකක් හොයාගන්න. ඒක හොඳට වේළලා තෙතමාත්තු කරගන්න. කොළ ටික තද අව්වේ නොතියා දවස් 5ක් විතර සෞම්‍ය අව්වෙන් වේලගන්න. පස්සේ කුඩු කරලා පවුඩර් හදාගන්න. මේ පවුඩර් එක වතුරවලට එක්කාසු කරලා උදේට නැත්නම් හවසට බොන්න. මුරුංගා පවුඩර්වලට, වතුර හරි රෝස වතුර හරි එක්කාසු කරලා සමේ ආලේප කරන්නත් පුළුවන්. මූණේ ගාන්න නම් අමු මුරුංගා කොළ බ්ලෙන්ඩ් කරලා ගත්තත් කමක් නැහැ.

## ගොටුකොළ

ගොටුකොළ කියන්නේ සමට දිව්‍ය ඖෂධයක්. ඉස්සර හිටපු ඍෂිවරු ගොටුකොළ හැඳින්නුවේ 'බ්‍රාහ්මී' කියලාලු. දිව්‍යමය ගුණ ඇති කියන එකයි ඒකෙ තේරුම. චර්මය පටකයි, කොලැජනුයි වර්ධන කරන්න ගුණය නිසා සම වියපත් වීම ප්‍රමාද කරලා සම තද කරන්න ගොටුකොළවලට පුළුවන්. චීනයේ ලී මිං ශින් කියලා ශාක විද්‍යාඥයෙක් හිටියා. ඔහු මියගියේ අවුරුදු 106ක් ජීවත්වෙලයි. ඔහු දිනපතාම වගේ ගොටුකොළ ආහාරයට ගත්තා කියලා ලී මිං එකපාරක් මාධ්‍යයට කියලා තිබුණා.

රුධිර ගමනාගමනය ක්‍රමවත් කරන්නත් ගොටුකොළවලට පුළුවන්. එතකොට සම ඉබේටම පැහැපත් වෙනවා. ඒ වගේම වෙරිකෝස්, සෙලියුලයිට් වගේ තත්ත්වයන් පාලනය වෙනවා. ඉතින් හැමදාම ගොටුකොළ කැඳ වීදුරුවක් බොන්න පුළුවන් නම් මරේ මරු. පලා වර්ගයක් විදියට ගොටුකොළ මැල්ලුම කන්න. ගොටුකොළ යුෂ සුදුහඳුන් එක්ක මිශ්‍ර කරලා ගොටුකොළවලින් ෆේස් මාස්ක් එකක් හදාගන්නත් පුළුවන්. ගොටුකොළ මාස්ක් එක ආලේප කරලා විනාඩි 20කින් මූණ සෝදන්න. සැවැන්දරා කුඩු, ගොටුකොළ, කහ, රෝස වතුර හොඳට බ්ලෙන්ඩ් කරලා සමේ ආලේප කරන එකත් හොඳ සත්කාරයක්.

## මුකුණුවැන්න

මුකුණුවැන්නවලත් විටමින් A,B, C කියන පෝෂක සංඝටක තියෙනවා. සම පැහැපත් කරගන්න වගේම දීප්තිමත් ඇස් දෙකක් ලබාගන්නත් ඕනෙ නම් කන්න ඕනේ මුකුණුවැන්න. හැබැයි මේවයින් ලොකුම වාසි ලැබෙන්නේ කෙස්වලට. ආයුර්වේද විද්‍යාවේදී හිසට හදන බේත්වලට මුකුණුවැන්න දානවාමයි. මොකද හිසකෙස් යාම වළක්වන්න, කෙස් කළු කරන්න වගේම කෙස් වර්ධනයටත් මුකුණුවැන්න අපූරුයි.

මුකුණුවැන්න කොළ බ්ලෙන්ඩ් කරලා හිසේ සමේ ආලේප කරලා විනාඩි 30කින් නාන්න. ඒ වගේම වැඩිපුර මුකුණුවැන්න කන්න. මුකුණුවැන්නවලට කඩල පිටියි රෝස වතුරයි එකතු කරලා බ්ලෙන්ඩ් කරලා සමේ ගාලා විනාඩි 20ක් තියලා සෝදන්නත් පුළුවන්.

## නිල් කටරොළු කොළ

නිල් කටරොළු කොළ කියන්නේ විටමින් A, C, ඇමයිනෝ අම්ලය වගේම තියෙන හොඳ පෝෂණීය කොළ වර්ගයක්. බොහොම සුළු පිරිසක් පලා වර්ගයක් විදියට කෑමට ගත්තට මොකෝ නිල් කටරොළු කොළ කනවා කියලාවත් ඇතැම්මු දන්නේ නැහැ. ඉතින් අද ඉඳන්වත් ගෙදර පලා හදද්දී කලවම් මැල්ලුමක් විදියට නිල් කටරොළු දළු ටිකක් එක්කාසු කරන්න. නිල් කටරොළු කොළ වේලලා තේ වගේ හදලා බොන්න. නැත්නම් නිල් කටරොළු දළු, කස්තූරි කහ බ්ලෙන්ඩ් කරලා හමේ ආලේප කරන්න. සම පැහැපත් කරන්න වගේම මූණේ තියෙන ලප කැළැල්, අවපැහැගැන්වීම් ඉවත් කරන්න පුළුවන්.

## ඇත්තෝර

සමේ දද, කුෂ්ඨ, අලුහම් වගේ දේවල් තියෙනවා නම් ඔන්න පංකාදුම බේත පුතෝ! හැබැයි එකක්. ඇත්තෝර හදන්න ඕනේ කලවම් පලාවට. මොකද වැඩිපුර ඇත්තෝර කෑවොත් වමනේ යන්න ඉඩ තියෙනවා.

හමේ අර කියාපු ලෙඩ තියෙන කෙනෙක් නම් ඇත්තෝර කොළවලට අමු කහ මිශ්‍ර කරලා තම්බලා දිනපතාම ඒ වතුරෙන් ඇඟ සෝදන්න. සුදු හඳුන් එක්කලා ඇත්තෝර දළු අඹරලා සමේ ගාන්න. සම පැහැපත් වෙනවා.

## එරබදු

ඒ කාලේ උදවිය පණු අමාරුව හොඳ කරගන්න එරබදු දළු මලවලා කාලා තියෙනවා. පණු අමාරුව හොඳ කරගන්න විතරක් නෙමේ ඉස්සර ගම්වල කෙලි ගැටිස්සියෝ පියයුරු විශාල කරගන්නත් එතැනට එරබදු යුෂ ආලේප කළායි කියලා කතාවක් තියෙනවා. සම වේලිලා පැලිලා නම් කන්නම ඕනේ මේ පලාව. කනවට අමතරව එරබදු යුෂවලට අමුකහ, කඩල පිටි, යෝගට් මිශ්‍ර කරලා පැක් එකක් විදියටත් මූණේ ගාන්න.

මේ කිව්ව පලා වර්ගවලට අමතරව තෙබු කොළ, නිවිති, රණවරා, අඟුණ, සාරණ, කතුරුමුරුංගා, තම්පලා, මැල්ල, පෑෂන් ෆෲට් කියන පලා වර්ගවලත් පෝෂණයට අත්‍යවශ්‍ය ප්‍රතිඔක්සිකාරක අඩංගුයි. කැබැල්ල දළු, දඹල දළු, වට්ටක්කා දළු, වැල්කොහිල දළු, පුහුල් දළු, දියලබු දළු, තක්කාලි දළු, මිරිස් දළු, ඇඹරැල්ලා දළුවලත් සමට හිතකර පෝෂක අඩංගුයි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

# අම්මයි තාත්තයි අසනීප වුණාම මම පරිප්පු උයනවා

## සඳලි සෙව්මිනී

අනුකම්පාව කියන්නේ මනුස්සයෙක්ට හානි කරන්න පුළුවන් හොඳම විදිය කියලා කතාවක් තියෙනවා. අපි මේ කතාව ලියන්නේ අපේ කතා නායිකාව සඳලි සෙව්මිනීට කාගෙන්වත් අනුකම්පාව අරන් දෙන්න හිතාගෙන නෙමෙයි. හැබැයි මේ ලිපිය ලියන්න හේතු දෙකක් තියෙනවා. එක, ඉන්න තැන ගැන දුක්වෙන කෙනෙක්ට ඇගේ කතාවෙන් අභිප්‍රේරණයක් ගන්න. දෙක සඳලි වගේ දරුවෝ ඉන්න අම්මලාට ඒ දරුවන්ගේ විභවය, ශක්ති මට්ටම පැහැදිළි කරන්න.

සඳලි සෙව්මිනී ඩවුන් සින්ඩ්‍රෝම් යුවතියක්. සිංහලෙන් අපි විශේෂ අවශ්‍යතා සහිත මිනිසුන් කියන්නේ. සාමාන්‍ය මනුෂ්‍යයෙක්ට සාපේක්ෂව ගත්තාම මේ උදවිය කායික, මානසික, චර්යාත්මක යන අංශවලින් සංකූලතා පෙන්වනවා. ඒ වගේම ඔවුන්ගේ සින්ඩ්‍රෝම් තත්ත්වය පිටතට පේන්න තියෙනවා.

හැබැයි ඔය මොන ගැටලුවවත් තමන්ගේ ජයග්‍රහණවලට බාධවක් කරනොගත්තු ඩවුන් සින්ඩ්‍රෝම් ආදරණීයනුත් මේ ලෝකේ ඕන හැටියට ඉන්නවා.

සැක් හොට්සපේන්, අතිදක්ෂ රංගන ශිල්පියෙක්. ඔස්කාර් සම්මාන උළෙලක නිවේදන කටයුතු කරපු ප්‍රථම ඩවුන් සින්ඩ්‍රෝම් සහිත පුද්ගලයා ඔහු. ඇමරිකාවේ සොෆියා ජිරවු නිවේයෝර්ක් ෆැෂන් වීක් එකේ ඇවිදපු ප්‍රථම ඩවුන් සින්ඩ්‍රෝම් නිරූපිකාව. ඇය වික්ටෝරියාස් සීක්‍රට් සන්නාමය වෙනුවෙන් පවා පෙනී සිටින අතිදක්ෂ නිරූපිකාවක්. විශ්වවිද්‍යාල උපාධියක් සම්පූර්ණ කළ ප්‍රථම ඩවුන් සින්ඩ්‍රෝම් පුද්ගලයා පැබ්ලෝ පිනේඩා. ඔය හැම මනුස්සයෙක්ම ඒ තැන්වලට ගියේ අනුකම්පාව නිසා නෙමෙයි දක්ෂතාවය නිසා.

ඔය ගොඩටම සඳලි දුවගේ කතාවත් දන්නම්. මොකද ඇයත් ඒ තරම්ම දක්ෂ යුවතියක්. මේ ළඟදි සෞභාග්‍යා පදනම සංවිධානය කරන සෞභාග්‍යා දැක්ම සම්මාන උළෙලක් පැවැත්වුණා. ලංකාවේ ප්‍රකට ව්‍යාවසායකයෝ ඇතුළු බොහෝ පිරිසක් ඔය සම්මාන උළෙලට සහභාගී වුණා. මේ සම්මාන උළෙලටම තිබුණේ නැටුම් දෙකයි. එකක් භරත නැටුමක්. අනෙක පූජා නැටුමක්. සම්මාන උළෙලට සහභාගී වෙලා හිටපු හැමෝගෙම ඇස් පුදුම කරාපු ඒ නර්තන දෙකම කළේ සඳලි. ඒ වගේ සම්මාන උළෙලක තියෙන නැටුම් දෙකම බය නැතිව ඇයට දෙන්න ඇය කොච්චර දක්ෂ වෙන්න ඕනෙද? ඒ වගේම ඒකට ලංකාවෙන්ම තෝරගත්තේ ළමයි 12යි එතැන දුවත් ඉන්නවා.

මේ ගොඩක් මිනිස්සුන්ගේ සාර්ථකත්වය පිටිපස්සේ ඉන්නේ ඒ අයගේ දෙමාපියෝ. සඳලිගේ කතාව පිටිපස්සේ ඉන්නෙත් ඇගේ ආදරණීය දෙමාපියෝ. ඉතින් අපි මුලින්ම කතා කළේ සඳලිගේ අම්මා එච්.ඒ.නිල්මිණී උදයකාන්ති එක්ක.

“මට තව පුතෙක් ඉන්නවා. මේ දෙවැනි දරුවා. දුව ඉපදුනේ 2000, නොවැම්බර්වලදි. සුදුම සුදු බෝල බබෙක්. වාට්ටුවේ හිටපු ලස්සනම බබා බබාගේ අතේ රේඛා බලලා මෙයා ඩවුන් බබෙක් කියලා කිව්වා. එවෙලේ දුවගේ තාත්තයි මායි දෙන්නම හරියට ඇඬුවා. මානසිකව කඩාගෙන වැටුණා.

සමහර දෙමව්පියෝ මේ වගේ දරුවන් ඉපදීම එක්ක එන පීඩනය නිසාම දරුවන්ව නොසලකා හරිනවා. හැබැයි සඳලි දුවගේ දෙමාපියෝ මේ තත්ත්වය නිසාම ඇයව හැදුවේ මලක් ගානටලු.

“දරුවට අපි ගොඩාක් ආදරේ දුන්නා. එයා ගාවම හිටියා. මගේ මහත්තයා පේන්ට් වැඩ කරන්නේ. අපි සාමාන්‍යයෙන් යමක් කරගන්න පුළුවන් පවුලක්. ඉතින් එයා කැමති හැමදේම දුවට දුන්නා. ඩවුන් බබාලගේ දෙමාපියන්ට එන ප්‍රශ්න ගොඩක් තියෙනවා. අපිත් ඒ හැම ප්‍රශ්කොනෙකටම මුහුණ දුන්නා. කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා යුනිට් ඒකේ අවුරුදු පහක් ඉගෙනගත්තා. කොවිඩ් කාලේදි මෙයාලට අවදානම වැඩි නිසා ගෙදර නතර කරගන්න වුණා.”

**දුව නැටුම්වලට දක්ෂබව අඳුනගත්තේ කොයි කාලෙද?**

“ඉස්කෝලෙ යන කාලෙමයි. දවසක් දුව කොන්සට් එකක නැටුමකට තේරිලා නැටුවා. එතකොට දුවට අවුරුදු 7යි. ඒ ටීම් එකෙන්ම ලස්සනටම නැටුවේ දුව. දුවගේ දක්ෂකම අපිට තේරුණා. පස්සේ දුවව නැටුම් ක්ලාස් දැම්මා. භරත, කථක්, බොලිවුඩ්, උඩරට, පහතරට ඔය හැම අංශයකටම වෙන වෙනම පංති දැම්මා. ඒ පංතිවල දුව ඉගෙනගන්නේ සාමාන්‍ය දරුවෝ එක්ක. පස්සේ දුවව ක්ලාස්වල ඉවෙන්ට්වල නැටුම්වලට ගත්තා. දුව තරුණ සේවා සභාවේ නැටුම් අංගවල පවා නටලා තියෙනවා. ඔය අතරේ තරඟවලට ඉදිරිපත් වෙලා ජයග්‍රහණ ගත්තා. 2020 යෞවන සම්මාන - ආබාධ සහිත තරඟයේ වට තුනේම ලංකාවෙම පළවැනියා වුණා දුව.”

මේ මෑතකදි ඇය ලබාගත්තු ඉතාම වටිනා අවස්ථාවක් ගැනත් සඳලි දුවගේ අම්මා අපිත් එක්කලා කිව්වා.

“දුව ළඟදි ළමා නිවාසෙක නැටුම් ඉවෙන්ට් එකකට ගියා. එතැනට ජර්මනියේ කට්ටියක් ඇවිල්ලා හිටියා. ඒ අය කන්ටෙම්පරි ඩාන්ස් වර්ක්ෂොප් එකකට දරුවෝ තෝරගන්න බව කිව්වා. පස්සේ අපි ළමයි තෝරගන්න ඉවෙන්ට් එකට ගියා. සිලෙක්ෂන් එකට ගොඩක් දරුවෝ ඇවිල්ලා හිටියා. ඒත් ලංකාවෙන්ම තෝරගත්තේ ළමයි 12යි. ඒකට දුවවත් තේරුණා. දුව ඇරෙන්න එතැන අනිත් අය සාමාන්‍ය දරුවෝ.”

ඉපදුණු දවසේ දුක හිතුණාට අද තමන්ගේ දුව ගැන තියෙන්නේ හිත පිරෙන තරමේ ආඩම්බරයක් කියලයි අම්මා කිව්වේ.

**“දුව වෙනස් ළමයෙක් කියලා අපිට කවදාවත් දැනිලා නැහැ. එයාට සමහර දේවල් අපිටත් වඩා හොඳට තේරෙනවා. එයා පුංචි දරුවන්ට, සත්තුන්ට, අනිත් මිනිස්සුන්ට හරි ආදරෙයි. අපිත් හරි එයාගේ පණත් හරි. මම අසනීප වුණාම දුව ළඟට වෙලා ඔලුව අත ගගා ඉන්නවා. මාව ඉඹිනවා. අපි නැති කාලෙක දුවට මොනවා වෙයිද කියලා හිතේ ලොකු ගින්දරක් තියෙනවා. ඒ වුණාට සතුටින් ඉන්න පුළුවන් ටික කාලේ දුව එක්ක පුළුවන් තරම් සතුටින් ඉන්නයි අපි බලන්නේ.”**

මේ දරුවන්ට අවධානය දෙන්න ඕනේ පුංචිම කාලේ ඉඳලමයි. ලොකු වුණාට පස්සේ අවධානය දෙන්න යන එක අශ්වයා ගියාට පස්සේ ඉස්තාලේ වහනවා වගේ වැඩක්.

“මගේ දුව ගොඩක් ලස්සනයි. ඒ නිසා එයාට ගොඩක් අය ආදරෙයි. හැබැයි හැම ඩවුන් දරුවෙක්ටම එහෙම නැහැ. අනිත් ඩවුන් බබාලට මගේ දරුවට වඩා වෙනස්කම් වෙනවා මම ඇස් දෙකෙන් දැකලා තියෙනවා. සමහර නෝමල් දරුවෝ මේ අයට විහිළු කරනවා. නෝමල් බබාලගේ අම්මලා ඒ දරුවන්ට මේ අයව ආශ්‍රය කරන්න දෙන්නේ නැහැ. එහෙම කරන්න එපා. සාමාන්‍ය දරුවෝ වගේම මේ ළමයිත් ළමයිනේ කියන එක හදවතින් හිතලා මේ දරුවන්ට වෙනස්කම් කරන්න එපා. හැම ඩවුන් බබෙක්ටම සැඟවුණු දක්ෂතාවයක් තියෙනවා. චිත්‍ර, නැටුම්, ක්‍රීඩා ඔය ඕන එකක් වෙන්න පුළුවන්. ඒවා අඳුනගන්න බලන්න. සඳලිගේ අම්මට වගේම ඇය ගැන අපිටත් තියෙන්නේ ආඩම්බරයක්. ඉතින් මේ තරම් ආඩම්බරකාර කතාවක් ගැන කතා නායිකාව එක්ක කතා නොකර කොහොමද?

**සඳලි ලොකු වෙලා කවුරු වෙන්නද කැමති?**

“නැටුම් ටීච කෙනෙක් වෙන්න. මට ලස්සනට නටන්න පුළුවන්. මම නටද්දි හැමෝම බලාගෙන ඉඳලා අත්පුඩි ගහනවා. නටන්න විතරක් නෙමේ වන්නම් පොත කියවන්නයි, ගිටාර් ගහන්නයි, සිංදු කියන්නයිත් මට පුළුවන්.”

සඳලිට දැන් අවුරුදු 22යි. ඇය බොහොම ලස්සන තරුණියක්. සාමාන්‍ය තරුණ ගෑනු දරුවෝ වගේම ඇයත් ලස්සනට ඉන්න බොහොම ආසයිලු.

“මම ලස්සන ඇඳුම්වලට ගොඩක් ආසයි. අම්මා මට ලස්සන ඇඳුම් තෝරලා දෙනවා. වෙලාවකට මමත් තෝරගන්නවා. ලස්සන වෙන්න මම කැරට් ජූස් බොනවා.”

හොඳට හිතන්න පතන්න පුළුවන් මිනිස්සුන්ගේ හිත්වල තියෙන්නෙම කුණු. හැබැයි ඇගේ වචන හරි පිරිසිදුයි. ලිපිය ගන්න වෙලාවෙදි ඇය මට කතා කළේ ‘රත්තරං’ කියලා. ඒ තරමට ඒ මිනිස්සු අනිත් මිනිස්සුන්ට ආදරෙයි.

**“මම හඳක් වගේ ඉන්නේ මගේ රත්තරං අම්මයි තාත්තයි නිසයි. අම්මටයි, තාත්තටයි සනීප නැති වුණාම මට ගොඩක් දුකයි. එවෙලට මම පරිප්පු උයනවා. ගේ අතුගානවා. කවදාහරි අම්මවයි තාත්තවයි බලාගන්න එක තමයි මගේ බලාපොරොත්තුව.”**

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




**ලස්සන වෙන්න මම කැරට් ජූස් බොනවා**





# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

128 කොටස

# තාත්තලා ගාව හිතුවක්කාර ළමයිට බෙහෙත් තියෙනවා

සෙනෙහෙලතා මැණිකේ තේනුක දෙස බලා සිටියේ පුදුම වූ ලෙසිනි. මේ තරම් මහන්සි වී කෑම හදන්නේ ඔහු වෙනුවෙනි. ඒත් කෑම කන්නට නොඉඳ මොහොතක් හෝ පමාවෙන්නට බැරි බව කියමින් ඔහු කුස්සියෙන්ද පිටව ගියේය. තේනුක පස්සෙන් යන්නට ගිය සෙනුකාව සෙනෙහෙලතා මැණිකේ නැවතුවාය.

**"මොකද අර කඩාගෙන බිඳගෙන දුවන්නේ? මෙච්චර වෙලා හොඳට හිටියනේ..?"**

සෙනුකා සමඟ නිවසේ ඉදිරිපසට යන ගමන් සෙනෙහෙලතා මැණිකේ ඇසුවාය.

**"අප්පච්චිගෙන් මට කෝල් එකක් ආවා. එයා කිව්වා මල්ලිව තියාගන්න කියලා... ඒක ඇහුවා විතරයි යන්න ඕනි කිව්වෙ. එයාගෙ කෑම එක ෂොප් එකට එවන්නලු..."**

සෙනුකා කීවේ සෝබරවය. ඇයට ඇත්තටම දුක හිතුණේ සහෝදරයා ගැනය. ඔහු ජපානයේ ගෙව්වේ නිදහස් ජීවිතයකි. සෙනෙහෙලතා මැණිකේත් සෙනුකාත් තේනුකගේ කාරය ළඟට යද්දී ඔහු කාරයට නැග එය පනගන්වාගෙනද සිටියේය. දෙදෙනාටම අත වනා කාරය ගේට්ටුව දෙසට හැරෙව්වා විනා තේනුක තෙන්නකෝන් දෙදෙනා සමඟ වචනයක් හෝ කතා කරන්නට පමා වූයේ නැත. ඔහුට හිතුණේම දැන් දැන් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා ඔහු සමඟ එන කාණ්ඩෙත් ඉදිරි ගේට්ටුවෙන් මතුවෙතැයි කියාය. ඒ නිසා පුළුවන් ඉක්මනින් ඔහු ඇමති බංගලාවේ ගේට්ටුවෙන් පිට වුණේය. හිතට නිදහසක් සහ සැහැල්ලුවක් දැනුණේ එවරය.

**"ඇත්තටම මොකද වුණේ දරුවෝ..? මල්ලි ගියේ ඇයි..?"**

මිදුලේ සිටගෙනම සෙනෙහෙලතා මැණිකේ ඇසුවේ ඔහුගේ කාරය නොපෙනී යනතුරු බලා සිටයි.

**"අප්පච්චි එනවා කිව්වා තව කවුද එක්ක. ඒක ඇහුණා විතරයි මේන් කරන්ට් වැදුණා වගේ නැගිට්ටා."**

**"අප්පච්චි එක්ක මොනවට හරි තරහ වෙලාවත්ද?"**

සෙනෙහෙලතා මැණිකේ විස්සෝප වුණාය. මේනක කිසිවක් කියනු ඇසුණොත් සෙනුකා පසුපස හැරී බැලුවාය. ඔහු ඔවුන් දෙදෙනා සිටි දෙසට එමින් සිටියේය.

**"මොකද මේ එළියට වෙලා? කවුරු එනකම්ද මග බලාගෙන ඉන්නෙ..?"**

මේනක ඇසුවේ ඔවුන් සමීපයටම විත්ය.

**"එනකම් නම් නෙවේ... මල්ලි ගියානේ. උපන්දිනේ එයාගේ. පාටිය එයාට. ඒ වුණාට බර්ත් ඩේ බෝයි ගියා..."**

හිතේ වූ ලතැවුල හංගාන සිනාවෙමින් සෙනුකා කීවාය. සහෝදරයා ඇමති නිවසින් පිටව ගිය බව මේනක දන්නේ එවිටය. ගේට්ටුවෙන් ඇතුළු වූ තෙන්නකෝන් බණ්ඩාරගේ වාහනය දුටු සෙනුකා කලබල වුණාය. ඇය සෙනෙහෙලතා මැණිකේ හා මේනක එහි සිටියදී ඉක්මන් ගමනින් ගෙතුළට ගියාය. සැප ජීප් රිය නිලනිවස මිදුලේ නැවතෙද්දී ඒ පසින් ආ තවත් එවැනිම සැප වාහනයක් විත් ඒ ළඟ නැවතුණි. ගෙතුළට යන්නට හැරෙන්නට ගිය සෙනෙහෙලතා මැණිකේ හා මේනක එතැනම රැඳුණාහ.

පැමිණෙන්නේ කවුරුන් හෝ අමුත්තන් පිරිසක් බැවින් ඔවුන්ට කතා නොකර පිටුපා යෑම හොඳ නැති නිසා සෙනෙහෙලතා මැණිකේ එහිම රැඳුනාය. වාහනයෙන් බැසගත් තෙන්නකෝන් බණ්ඩාර අනෙක් වාහනය ළඟ නැවතුණේ මිදුලේ සිටි සෙනෙහෙලතා මැණිකේ දෙසද බලමිනි. ඒ වාහනයේ ඉදිරි සහ පසුපස දොරවල් ඇරුණේ එකවරය. ඒත් මුලින් බිමට බැස්සේ ඉදිරි අසුනේ සිටි කෙනාය. ඔහු විසෙන්තිආරච්චි ඇමතිවරයා බව සෙනෙහෙලතා මැණිකේ දුටු පළමු බැල්මෙන්ම හඳුනාගත්තාය. ඉන්පසු ඇරුණ දොරෙන් බැස්සේ ඔහුගේ බිරිඳ හා දියණියයි. තේනුක නිවසින් මේතරම් ඉක්මනින් පිටව ගිය කාරණය සෙනෙහෙලතා මැණිකේට සැනෙන් වැටහුණි.

විසෙන්තිආරච්චි ඇමතිවරයාගේ දියණිය පිළිබඳ යෝජනාව තේනුකට කියන්නට කියා දිනක් සැමියා තමාට කීවද කිසිදු තේනුක හා ඒ ගැන කතා නොකළ බව ඇයට මතකය. සමහරවිට ඒ ගැන තෙන්නකෝන් බණ්ඩාරම ඔහුට දන්වන්නට ඇතැයි ඇයට සිතුණේ ඔවුන් එන්නට පෙර ඔහු පැන ගිය නිසාය. මේනක කතා නොකර ඔවුන් දෙස බලා සිටිනු ඇගේ ඇස් කොනට පෙනුණි.

**"අප්පච්චි විසෙන්ති අංකලුත් එක්ක ඇවිත්..."**

මේනක කිව්වෙ මුලින්ම දකිනා විසෙන්තිආරච්චිගේ බිරිඳ සහ දියණිය වාසුලා දෙස බලාගෙනය. ඔවුන් නැළවිල්ලේ විත් සෙනෙහෙලතා මැණිකේ සහ මේනක ළඟ නැවතුණාහ.

**"මොකෝ මැණිකෙ මගට වෙලා..?"**

සුපුරුදු සිනහවෙන් විසෙන්තිආරච්චි පවුල පිළිගත් සෙනෙහෙලතා මැණිකේගෙන් තෙන්නකෝන් බණ්ඩාර ඇසුවේ සෙනෙහෙබර හඬිනි.

**"ගෙට යන්න ගිහින් කට්ටිය දැකලා නැවතුණේ... යමු යමු."**

තෙන්නකෝන් බණ්ඩාරට උත්තරයක් නොදීම වාසුලාගේ අතකින් අල්ලාගත් සෙනෙහෙලතා මැණිකේ ඉස්සර වුණාය.

වාසුලාගේ අත්ලේ සිනිඳු බවක් සෙනෙහෙලතාගේ අත්ලට හොඳින් දැනුණි. ඔවුන් පසුපසින් මේනකද නිවසට ගොඩවූයේ වාසුලාගේ සොඳුරු බව දෑසින් මෙන්ම හිතින්ද විඳිමිනි. ඔවුන් විසිත්ත කාමරයට ඇතුළු වෙද්දී එහි සිටි නිශ්ශංක රාජපක්ෂගේත් සමන්තිනීගේත් මුහුණු වෙනස්වෙනු අහම්බෙන් හෝ සෙනෙහෙලතා මැණිකේ දුටුවාය. සමන්තිනී හා වාද කරමින් හිඳ චතුමිණී කාමරයට ගියා පමණි.

**"කෝ බර්ත්ඩේ පාටියක් කිව්වම මං හිතුවෙ කට්ටිය ඇති කියලා..."**

වටපිට බලමින් විසෙන්තිආරච්චි කීවේ තේනුක තෙන්නකෝන් ඇස්වලින් සොයමිනි.

**"පාටිවලට ගෙන්නන්න ඕනිතරම් සෙනඟ ඉන්නවා. කාටවත් නොකිව්වේ පොඩි පුතා කැමති නැති නිසා. මිනිහා ටිකක් අමුතුවටනෙ හිතන්නේ..."**

තෙන්නකෝන් බණ්ඩාර උස් හඬින් හිනැහෙමින් කීවේ තේනුක කෙරේ ලොකු සෙනෙහසක් මවා පෙන්වමිනි. සෙනෙහෙලතා මැණිකේත් මේනකත් අමුත්තන් හා සිටියදී තෙන්නකෝන් බණ්ඩාර ගෙතුළට ගියේ තේනුක එහි ඇතැයි සිතාය. කුස්සියේ මේසය ළඟ දුරකතනය ඔබමින් සිටි සෙනුකා ළඟ ඔහු නැවතුණේය.

**"කෝ මල්ලී..? එයත් එක්ක ඔයා පොඩ්ඩක් එළියට එන්න. මල්ලිව දකින්නමයි විසෙන්තිගෙ නෝනයි දුවයි ආවේ."**

තෙන්නකෝන් බණ්ඩාර කියද්දී සෙනුකා දුරකතනයේ බොත්තම් තවත් තදින් එබුවේ දෙන්නට උත්තරයක් හිතේ ගලපමිනි.

**"මං එළියට යනවා. ඔයා මල්ලිත් එක්ක එන්න..."**

තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා යළි විසිත්ත කාමරයට යන්නට හැදුවේය.

**"අප්පච්චි... මල්ලි ගියා..."**

ඈ කීවේ දුරකතන තිරය දෙස බලාගෙනමය.

**"ගියා.. !? මං කිව්වේ ඔයාට එයාව තියාගන්න කියලනෙ ළමයෝ. එතකොටත් හිටපු කෙනා මේ ඉක්මනට ගියේ..?"**

එතෙක් සන්සුන් ලෙස කතා කළ තෙන්නකෝන් බණ්ඩාරගේ හඬේ ස්වරය වෙනස් වුණේය. පියාට කේන්ති එමින් පවතින බව අත්දැකීමෙන් ඈ දැනගත්තාය.

**"ෂිහ්... මං කොහොමද අර මිනිස්සුන්ට මූණ දෙන්නේ... ඔයා කිව්වද මං කවුරුහරි එක්කන් එනවා කියලා..?"**

තෙන්නකෝන් බණ්ඩාර දියණිය දෙස තියුණු ලෙස බලමින් කියද්දී ඈ හිත සැලුණි. ඒත් මේ මොහොතේ කල්පනාවෙන් උත්තර දෙන්නට ඇගේ හිත කීවේය. විසිත්ත කාමරයෙන් නැග ආ උස් සිනා හඬ ඔවුන් සිටි තැනටද විත් විසිරී පැතිරිණි. සිම්බා සෙනෙහෙලතා මැණිකේ සොයා විසිත්ත කාමරයට දුව ගියෙත් ඒ වේගයෙන්ම ආපසු දිව විත් තෙන්නකෝන් බණ්ඩාරගේ දෙපා ළඟ නැවතුණේත් ඒ මොහොතේය.

**"මල්ලිට කෝල් එකක් ආවා කාට හරි අසනීපයි කියලා. ටිකක් දුර යන්න තියෙනවා කියලා තමයි එහෙම්ම දිව්වෙ. ෂොප් එකට යන්නෙත් නෑ කිව්වා..."**

හිත ඇතුළෙන් එකපාරටම ගොනුවී ආ වචන පෙළ සෙනුකා අප්පච්චී ළඟ හැළුවාය. තෙන්නකෝන් බණ්ඩාර එයින් සෑහීමකට පත්වූවා සේ පෙන්නුවත් ඔහුගේ මුහුණේ වූ පෙනුම වෙනස් වූයේ නැත.

**"මොන හිඟන්නියෙක් කරේ එල්ලගන්න හිතාගෙන ඉන්නවද දන්නෙ නෑ. මෙච්චර හොඳ කෙල්ලෙක් කකුල් දෙක ළඟට එක්කන් ආවත් පින නෑ. පින නෑ නෙවෙයි... ඔයා මල්ලිට කියන්න දැන් එයා ඉස්සරටත් වඩා හිතුවක්කාරයි කියලා. තාත්තලා ගාව හිතුවක්කාර ළමයිට බෙහෙත් තියෙනවා සෙනුකා..."**

තෙන්නකෝන් බණ්ඩාර කී දෙය සෙනුකාට නොතේරුණත් ඉක්මනින්ම දෙයක් කළ යුතු බවට හිතාගෙන ඔහු එතැනින් විසිත්ත කාමරය දෙසට ආවේය.

ලබන සතියට

ධරණී

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස්
0112 673 451

ධරණී
පුවත්පත
නිවසටම
ගෙන්වාගන්න
අමතන්න
076
1367 623

ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද? ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?

❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
❖ රැකියා ලබා ගැනීමට ❖ හැර ගිය අය ගෙන්වීම

පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: 071-0 314 878
මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී

උපන් දිනය / උපන් වේලාව සමඟ අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්
පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)



මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට
මත්කුඩු සහ සුරාව
* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට
*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

# දැන්වීම් සඳහා අමතන්න

**0112672 601**
**0112 672 603**

**A/L 2025**
**Chemistry Physics**
වසර 30ක පලපුරුදු ඉංජිනේරුවකු මෙහෙයවයි.
**ප්‍රදීප් රත්නායක**
15/7 විශ්වවිද්‍යාල පාර, කටුබැද්ද.
**0776 864 397**

**උගස් තැබූ රත්තරං**
SL PROMO
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
රන් පවුම - 175,000/-
**076 101 88 53**

## ආදරය නිසා කදුළු සැලූ මට පිහිටවූ එකම තැන...

- පවුලේ ඇති වන සියලුම ගැටලුවලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා / පෙම්වතිය ළඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රට රැකියා ප්‍රමාද වීම් වලට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට
- රැකියා ලබා ගැනීමට

(අදම අමතන්න)
ක්ෂණික ඇමතුම්
0777 444 908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ සමග සේන මහතා 037 22 48 828
(පුජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම -සෙනසුරාදා-ඉරිදා
උදේ 8.00 සවස -3.00 දක්වා

ගමන් මාර්ගය - නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොල කුලියාපිටිය බසයක නැග හොරොම්බාව හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

Caretaker
"Guru Deva shanthi Services"
Post Code No 60181
Gurugalagoda, Molawatta,
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව
තැ.ස.අංකය 60181
ගුරුගල්ගොඩ, මෝලවත්ත
හොරොම්බාව

## 6-11 ශ්‍රේණි
**සිංහල / බුද්ධාගම**
අගනුවර ජනප්‍රිය පාසලක පළපුරුදු පිළිතුරුපත් පරීක්ෂකයෙක් නිවසට පැමිණේ.
පහසු අයකිරීම්.
**0772 173 518**

## වාණිජ බැංකු ඇබෑර්තු

★ බලපත්‍රලාභී අලුතින් විවෘත වූ බැංකු කිහිපයක් සඳහා ප්‍රාදේශීය මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)

0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0742 916 140 | 0774 024 155

**රු. 35000/- කට වැඩි ආදායමක්**
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.

- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955



## ඔබ දෛවයට පිටුපායිද.. ?
## දෛවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
**එස්. කෝරළේගේ**
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

**A/L ආර්ථික විද්‍යාව**
**ව්‍යාපාර අධ්‍යනය**
**2024 / 2025**
**O/L ව්‍යාපාර ගිණුම්**
උපාධිධාරී පාසල් ගුරුවරයා
නිවසට පැමිණේ
**075 711 67 34**

## උගස් රත්තරන්

සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
**පවුම - 185,000/-**
**076 367 57 68**

**විද්‍යාව ගණිතය 6 - 11 ශ්‍රේණි සඳහා**
**තනි හෝ කුඩා කණ්ඩායම් පන්ති**
සාධාරණ අයකිරීම් යටතේ මෙහෙයවීම
පළපුරුදු විද්‍යා උපාධිධාරි ගුරුවරයකු විසින්
Bsc. University of Colombo
සිංහල මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය පන්ති සඳහා
කොළඹ, ගම්පහ, මහරගම, කොට්ටාව, නුගේගොඩ, කළුතර, කඩුවෙල, අවටින් විමසන්න.
නිබන්ධන හා ප්‍රශ්නපත්‍ර ලබාදෙයි
**විමසීම් : 0705 321 553**

**ඔබත් කෙට්ටුද?**
ස්ත්‍රී / පුරුෂ
ඔබගේ කෙට්ටුව නැති කර පිරිපුන් පැහැපත් පෙනුමක් ලබාගැනීමට අතුරු ආබාධවලින් තොර අපගේ ප්‍රතිකාර.....



පැමිණ හෝ තැපැල මගින් ලබාගන්න
දුරකතනයෙන් කාලය වෙන්කර පැමිණෙන්න
අධික තරබාරුව / පොතු කබර / හිස කෙස් රෝග පැමිණ ප්‍රතිකාර ලබාගත හැක.
පෙව 9 00 පව 400
දේශීය ඖෂධාලය, මිරිස්වත්ත ගම්පහ.
පෝය, බදාදා සහ බ්‍රහස්පතින්දා වසා ඇත.
විමසීම් 077 42 27 503

## ජීවිතේම වූ ආදරය ගොඩගැසූ හීන කන්ද එක් මොහොතකින් සුනුවිසුනු වුනාද?
## පණවගේ ආදරය කල සැමියා/බිරිඳ, පෙම්වතා/පෙම්වතිය පිටුපෑවාද?

- පවුල් ජීවිතයේ පෙම් හබ නිසා කනගාටුද
- සුරාව/සූදුව නිසා දුක් විඳීද
- විභාග/නඩුහබ ජය ගැනීමට
- රැකියාව අහිමිද/රැකියාවක් සොයනවාද
- ව්‍යාපාර කඩා වැටිලාද
- ඔබ විඳින සියලු දුක් වලට විසඳුම්



පුරා දසකයක් මා හෙළු සියලු වෙර වෑයම් දුකින් පෙලෙන ඔබගේ හිතසුව පිණිසමය... මාහට බාරදුන් කිසිවක් වැරදි නැත.

**පූජ්‍ය බඹරගහඇල්ලේ ධම්මජෝති හිමි**
071 55 94 747 / 076 90 55 484
සෙත් පියස, පලාපත්වල



**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

**පාඩම් අංක 75**

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# කරදරකාරයින් නොමරා මරන්න

ඔන්න ආයෙත් ඩෙංගු මාරයා ඔලුව උස්සලාලු. මේ දවස්වල පත්තරයක්, ප්‍රවෘත්තියක් බලන ගානේ අහන්න දකින්න ලැබෙන්නේ ඩෙංගු මදුරිලාගේ හපන්කම් ගැන. පහුගිය දවසක ජාතික ඩෙංගු මර්ධන ඒකකයෙන් පාසල් දරුවන්ගේ දෙමාපියෝ වෙනුවෙන් විශේෂ රැස්වීමක් පැවැත්තුවා.

ඕන් අහගන්නකෝ එතැනදි ඒ මහත්තුරු කියාපුවා.

**මේ අවුරුද්දේ ඒ කියන්නේ 2023 ජනවාරි මාසේ ඉඳලා ජූනි මාසේ වෙනකොට ඩෙංගු රෝගීන් 42,961ක් වාර්තා වෙලාලු. හැම සතියකම ඩෙංගු රෝගීන් 2,500ක් වාර්තා වෙනවලු.**

ඉතින් සෙල්ලම්ද?

ලංකාවේ ඩෙංගු රෝගීන්ගෙන් 25%ක්ම පාසල් දරුවො කියන එකයි භයානකම කාරණාව. ගොඩක් ඉස්කෝලවල ටැංකි, පොකුණු වගේ ජල අලංකාරෙට හදපු තැන් තියෙනවා. ඉතින් ඔව්වගේ මදුරු කීටයෝ බෝවෙනවා. පාසල් භූමි සුද්ද පවිත්‍ර කළත් වැඩක් නැතිලු. ගොඩනැගිලි ඇතුළෙ තියෙන ජලය රැඳවුම්වලිනුත් ඩෙංගු මදුරුවෝ හැදෙන්න පුළුවන්ලු. ඉතින් දරුවන්ව ඩෙංගුවලින් ආරක්ෂා කරන්න ඩෙංගු මර්ධන ඒකකයෙන් දෙමාපියන්ට වෙනම යෝජනාවක් කළා. අද ස්වයං රැකියා පිටුවට මේ නිෂ්පාදනය තෝරගන්න හේතුවුණේ ඒ යෝජනාව.

පාසල් එද්දි දරුවන්ට මදුරු විකර්ශන ආලේපනයක් ගාලා එවන්න කියන එකයි ඩෙංගු මර්ධන ඒකකයේ යෝජනාව. නිතරම ආලේප කරගන්න ආලේපන බෝතලයක් දරුවන්ට දෙන්න කියලත් ඒ උදවිය යෝජනා කළා.


මදුරුවන්ගෙන් බේරෙන්න මදුරු දැල් සහ මදුරු කූරු හදන හැටි කලින් අපිත් කියලා දුන්නා. හැබැයි වැඩිපුරම ඩෙංගු මදුරුවෝ ඉන්නේ උදේ 6-8 සහ සවස 4-6 අතර කාලේ.ගොඩක් දරුවෝ සහ ගෙවල්වල උදවිය එවෙලෙට ඉන්නේ ගෙවල්වලින් පිටත. ඔය වෙලාවලට මදුරු කූරු වැඩෙයි නෙට් දන එකයි ප්‍රායෝගික නැහැනේ. ඉතින් අර මහත්තැන්ලා කිව්වත් වගේ හොඳම දේ ඇඟේ මදුරු විකර්ශන ආලේපනයක් ගාන එක.

ඩෙංගුවලින් ආරක්ෂා වෙන්න නම් මදුරුවෝ බෝවෙන තැන් විනාශ කරන්න ඕනේ. හැබැයි ඉතින් ඒ කළාට මදි දැනට බෝවෙලා ඉන්න මදුරුවන්ගෙන් ආරක්ෂා වෙන්නත් එපැයි. ඒකට හොඳම දේ තමා අපි කියලා දෙන ආලේපනය. ඉස්කෝලේ යද්දි විතරක් නෙමේ සෙල්ලම් කරන්න එළියට යද්දිත් දරුවන්ට මේක ගාන්න පුළුවන්. පුංචි අයට විතරක් නෙමේ බාල, තරුණ, මහලු ඕනම කෙනෙක්ට මේක යසයි.

මේ වගේ නිෂ්පාදනයක් වෙළඳපොළට දද්දි මුලින්ම පාරිභෝගිකයට ඒකේ පලප්‍රයෝජන හොඳින් පැහැදිලි කරන එක නිෂ්පාදන ඉල්ලුම වැඩි කරගන්න හේතුවක්. ඒ වගේමයි මේක ශරීරයේ ආලේප කරන දෙයක් නිසා ස්වයං රැකියාවක් විදියට වෙළඳපොළට නිකුත් කරද්දි රජය පිළිගත්තු ලියාපදිංචි වෛද්‍යවරයකුගෙන් සහතික කරවගෙන දේශීය ආයුර්වේද අමාත්‍යාංශයේ අනුමැතිය ගන්න ඕනේ. ඒ කරලා නිෂ්පාදනය හදගන්න හැටි දැන් බලමු.

වැඩේට මේ අමුද්‍රව්‍ය ටික සපයා ගන්න. පිටකොටුව පැත්තේ රවුමක් දැම්මොත් අඩු මුදලට මේ බඩු සේරම ගන්න පුළුවන්.

වෙජිටබල් ටර්පන්ටයින් (Vegetable Turpentine) 30g, මෙතිල් සැලිසිලේට් (Methyl Salicylate) 20g, මෙන්තෝල් 20g , පැඟිරි තෙල් 10g, සේර තෙල් 5g, කුරුඳු තෙල් 5g, මී ඉටි (Bee Wax) 5g.



**පියවර 1**

මී ඉටි ඩබල් බොයිල් ක්‍රමයට දිය කරගන්න. පස්සේ අනිත් දේවල් ටික පිළිවෙලින් එකතු කරන්න.



**පියවර 2**

ඝන වෙන්න කලින් ජීවානුහරණය කරපු ඩප්පි නැත්නම් ටියුබ්වලට දාගන්න. ඇසුරුම් කරන භාජනය අනුව මී ඉටි ප්‍රමණය වෙනස් වෙනවා. ඩප්පියට දනවා නම් මී ඉටි 10gක් දාන්න. ටියුබ් එක නම් 5g ප්‍රමාණවත්.

මෙහෙම හදගන්න මදුරු විකර්ශන බෝතලයක් රුපියල් 200කට විතර මිල කරන්න පුළුවන්. තවත් විස්තරවලට 0714766819ට කතා කරන්න.







■ සෙව්වන්දි හෙට්ටිආරච්චි




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.